# බෞද්ධාලෝකය

DOP/NEWS/23/2024

ISSN 2613-8743

20 වැනි කාණ්ඩය 1 වැනි කලාපය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 - දුරුතු - නවම් - මැදින්
(2024 ජනවාරි - පෙබරවාරි - මාර්තු)

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනයකි



# විහාර දේවාලගම් පනත සම්බන්ධයෙන් සම්මේලනයේ යෝජනා මහානායක ස්වාමීන් වහන්සේලාට පිළිගැන්වීම 2023.12.23 දින











විහාර දේවාලගම් පනත සංශෝධනය කිරීම පිණිස රජය මඟින් ඉදිරිපත් කර ඇති සංශෝධන පිළිබඳව විමර්ශනය කිරීම සඳහා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් පත් කරන ලද විද්වත් කමිටුවේ අවසන් වාර්තාව සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ඇතුළු ගරු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකභවතුන් විසින් 2023.12.23 වැනි දින මල්වතු මහා විහාරයේ සංඝරාජ මන්දිරයේ දී ස්‍යාමෝපාලී වංශික මල්වතු පාර්ශ්වයේ මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ විද්වත් කාරක සංඝ සභාවටත් අස්ගිරි පාර්ශ්වයේ මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ විද්වත් කාරක සංඝ සභාවටත් ගරු දියවඩන නිලමේ ප්‍රමුඛ බස්නායක නිලමේවරුන්ටත් පිරිනැමූ අවස්ථාවයි.





# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 දුරුතු - නවම් - මැදින්     2024 ජනවාරි - පෙබරවාරි - මාර්තු


## ලිපි සරණිය


- **ධම්ම පදය** **Dhamma Padaya - English** - පණ්ඩිත රන්ජිත් වනරතන, (ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොත ඇසුරෙන්) පරිවර්තනය - මහාචාර්ය ශිරෝමි සමරසිංහ 02
- **පඤ්චුපාදානස්කන්ධය** - පූජ්‍යපාද තලල්ලේ චන්දකිත්ති ස්වාමීන් වහන්සේ 03
- **අවුකනාවලෝකන වන්දනා** - ඉෂාන් අවිෂ්ක ගමගේ 08
- **උප්පලවණ්ණා තෙරණිය** - ලොකුබණ්ඩාර මුණසිංහ 10
- **ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය** - ධර්මසේන රස්සාපාන 12
- **ජීවිතය නම් ගලා යන ගංගාවකි** - ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ 18
- **අරිහත් තෙරුණි වත වරුණ** - දයා හේවාගම 20
- **නිවමු - නිවෙමු** - වෛද්‍ය ඉන්ද්‍රානි රත්නායක 21
- **ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රවර්ධනය** - චන්දන උපාලි පෙරේරා 22
- **වැඩිහිටි දිවියේ මානසික සුවතාවය** - චන්ද්‍රසිරි වැලිගමගේ 25
- **ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය සහ බුදුසමය (ii කොටස)** - සිරිසේන විතානගේ 28
- **සසරින් මිදුමට පින් රැස් කරමු** - පී. කරුණා පෙරේරා 32
- **The Need to Overcome Hindrances** - **Das Miriyagalla** 33



**කළමනාකරණ උපදේශක මණ්ඩලය**
මහාචාර්ය මාලිනි ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**කවරයේ ඡායාරූප ලබාදීම**
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**ඡායාරූප සැකසීම**
දුෂාන්ති කුමාරි

**පිටු සැලසුම**
ස්මාර්ට් ප්‍රින්ට්ස් සොලියුෂන් සෙන්ටර්

**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය

**සංස්කරණ කළමනාකරණය**
වෛද්‍ය රාණි ප්‍රනාන්දු

**සංස්කාරක මණ්ඩලය**
චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාම් නුවන් ගනේවත්ත
නාලක ජයසේන

**චිත්‍රය**
ප්‍රවීන චිත්‍ර ශිල්පී ජෝර්ජ් කීට් විසින් 1949 අඳින ලද තෙල් සායම් චිත්‍රයකි.
(ඇල්බට් ධර්මසිරි මහතා විසින් රචිත ජෝර්ජ් කීට් කෘතියෙන් උපුටා ගන්නා ලදි.)



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන : 011-2691695 / 011-2688517
ෆැක්ස් : 011-2688517 web : www.acbc.lk
විද්‍යුත් ලිපිනය : acbc380@gmail.com
buddhistinfo380@gmail.com

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

ධම්මපද වනරතන ව්‍යාඛ්‍යා පොත ඇසුරෙනි

**අප්‍රමාද නැණවතා නිවන් ලබයි**

**අප්පමතෙතා පමාතෙතසු**
**සුතෙතසු බහු ජාගරො**
**අබලසසං ච සීඝසෙසා**
**හිත්වා යාති සුමෙධසො**

"පමා වූවන් අතුරෙහි නොපමා වූ නිදි ගත්තවුන් අතුරෙහි නිදි වැරීම් ඇති මනා නුවණැති ශ්‍රාවක තෙමේ දුර්වල අශ්වයෙකු වේගවත් අශ්වයෙකු මෙන් හැරපියා යන්නේය."

සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැසි යහළු වහන්සේ දෙනමක් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන භාවනා කරනු පිණිස ආරණ්‍ය සේනාසනයකට පිවිසියහ. ඔවුනතුරෙන් එක් නමක් කල් වේලා ඇතිව දර රැස්කොට ගිනි කබල අවුලුවා තරුණ තෙරුණුන් පිරිවරා ගෙන අල්ලාප සල්ලාපයෙහි යෙදී ගිනි තපිමින් පළමු යාමය ගෙවාලයි.

අනිත් තෙරුන් වහන්සේ භාවනා කරමින් ඇවැත්නි! මෙසේ නොකළ මැනව, මුළා සිහියෙන් කළ යුතු දෙය පැහැර හරින්නහුට සතර අපාය සිර ගෙවල් සමානය. වංචාවෙන් බුදුවරුන්ගේ සිත් ගත නොහැකි යයි අවවාද කෙරෙති. කමටහන් ගෙන වන සෙනසුනට විත් ගිනි තැප තැප කාලය ගත කිරීම සුදුසු නොවේ. වහා වීර්ය කරව් යැයි අවවාද කළහ.

මෙබඳු අවවාදයකින් පවා භික්ෂුවගේ සිත භාවනාවට යොමු කර වීමට නොහැකි විය. හෙතෙම ප්‍රථම යාමයෙහි ගිනි තැප, මැදුම් යාමයෙහි යහන් ගැබට වදින්නේ, අනික් කළ ආරබ්ධ වීර්ය ඇති භික්ෂූන් වහන්සේ ශරීරයෙහි ගිලන් බව නැති කිරීමට මදක් නිදන පරිදි අනිත් භික්ෂුව දැක, ඇවැත්නි! තෙපි කමටහන් ගෙන මෙහි වුත් නිදා ගැනීම සුදුසු නොවේ. නොනිදා භාවනා කළ යුතු යයි කියා හේ එළිවන තුරු සැපසේ නිදයි.

උත්සාහවත් භික්ෂුව පච්ඡිම යාමයෙහි නැගී සිට භාවනා කරයි. එසේ වෑයම් කරන උන්වහන්සේ යථා කාලයෙහි සිව් පිළිසිඹියාපත් රහත් බවට පැමිණි සේක.

දෙදෙනා වහන්සේම වස් පවරා ආපසු බුදුන් වහන්සේ හමුවට ගියහ.

***The wise and diligent one will attain Nibbana***

***Appamatto pamattesu - suttesu bahujagaro***
***abalassa cha sighasso - hitva yati sumedhaso***

Mindful amongst the negligent, vigilant amongst the drowsy, the wise person advances with wisdom, like a race-horse, leaving behind the weak horse.

Two bhikkhus who were friends and residing in the Jetavana monastery in Sravasti, went to a monastery in the forest to meditate after obtaining a subject of meditation (*Kamatahan*) from the Buddha. One of them, spent time gathering firewood, lit a fire and warmed himself while engaging in idle talk with the young bhikkus throughout the first or early period of the night.

The other bhikku faithfully meditated and advised his friend not to neglect his duties by idling away his time and that those who behave in this manner would be suitable to exist only in the lower realms (Sathara Apaaya). He told his friend that he would not be able to gain favour with the Buddha by deceit and to be diligent and mindful without wasting his time seated by the fire.

Even with this advice it was not possible to make the first bhikku focus his mind on meditating. He warms himself by the fire during the first watch of the night and then goes to his abode to sleep at the second watch. When he sees the diligent second bhikku getting some much needed rest to prevent getting sick, he tells him that this is not the way to spend the time after obtaining *kamatahan* to meditate, that he should be vigilant and carry out his duties without sleeping, whearas he himself sleeps throughout the night.

Being diligent and ever mindful, the second bhikkhu continued to meditate rising during the late hours in the night, and attained *arahatship* within a short time.

At the end of the rainy season, having ended the vas period, both bhikkus went to meet the Buddha. The Buddha knowing exactly how each bhikku had spent his time, recited the verse cited above.

2024 ජනවාරි - පෙබරවාරි - මාර්තු



# පඤ්චුපාදානස්කන්ධය

**3. සඤ්ඤාස්කන්ධය**

ඉන්ද්‍රියයනට ගොදුරු වෙන අරමුණු හඳුනා ගන්නා ස්වභාවය සඤ්ඤා වශයෙන් හඳුන්වනවා. එසේ වන හඳුනා ගැනීම් රාශියක්, ගොඩක් තිබෙන නිසා සඤ්ඤාස්කන්ධය වශයෙන් දක්වා තිබෙනවා. සඤ්ඤාව යනු කුමක් දැයි සංයුක්ත නිකායේ ඛජ්ජනීය සූත්‍රයෙහි සඳහන් වෙනවා.

**කිඤ්ච භික්ඛවේ, සඤ්ඤං වදේථ, සඤ්ජානාතී’ති ඛෝ භික්ඛවේ, තස්මා සඤ්ඤාචි වුච්චති. කිඤ්ච සඤ්ජානාති? නීලම්පි සඤ්ජානාති? පීතකම්පි සඤ්ජානාති, ලෝහිතකම්පි සඤ්ජානාති, ඕදාතම්පි සඤ්ජානාති, සඤ්ජානාත’ති ඛෝ භික්ඛවේ, තස්මා සඤ්ඤාති වුච්චති.**

“මහණෙනි, කවර හෙයින් සඤ්ඤා යැයි කියනවාද? හඳුනාගනී යන අදහසින් සඤ්ඤා යැයි කියනවා. කුමක් ද හඳුනා ගන්නේ? නිල්පාට වශයෙන් ද, කහපාට වශයෙන් ද, රතුපාට වශයෙන් ද, සුදු පාට වශයෙන් ද හඳුනා ගන්නවා. ඒ නිසා ඒ හඳුනා ගැනීමට සඤ්ඤා යැයි කියනවා.”

ගහ කොළ, ඇළ දොළ, රන් රිදී, අඳුම් පැළඳුම් ආදී වස්තූන් ද, ගීත, ගාථා, කථා ආදී ශබ්ද ද, මිනිස් තිරිසන් ආදී සත්ත්වයන් ද, පාට වර්ග ද, රස වර්ග ද, ඒවායේ හැඩ හුරුකම් අනුව වෙන් වෙන්ව හඳුනා ගැනීම සඤ්ඤාවයි. ලොව පවතින සත්ත්ව - පුද්ගල, ද්‍රව්‍ය, ජීවී - අජීවී සියලු දෙයක්ම ඉන්ද්‍රියන්ට අරමුණු වශයෙන් ගොදුරු වන නිසා අරමුණු හා සම්බන්ධ වීමෙන් මේ හඳුනාගැනීම සිදුවන නිසා සඤ්ඤා ස්කන්ධය කොටස් හයකට බෙදා දක්වා තිබෙනවා.

**“කතමා ච භික්ඛවේ, සඤ්ඤා? ඡයිමේ භික්ඛවේ, සඤ්ඤා කායා, රූප සඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ඵොට්ඨබ්බ සඤ්ඤා, ධම්මසඤ්ඤා, අයං වුච්චති භික්ඛවේ සඤ්ඤා”**

මහණෙනි, සඤ්ඤාව කියන්නේ මොකකට ද? මහණෙනි, රූප සඤ්ඤාව, ශබ්ද සඤ්ඤාව, ගන්ධ සඤ්ඤාව, රස සඤ්ඤාව, ස්පර්ශ සඤ්ඤාව, ධර්ම සඤ්ඤාව යන සඤ්ඤා හය සඤ්ඤාකාය වශයෙන් හඳුන්වනවා.

අරමුණ හැඳිනීමේ ලක්‍ෂණයෙන් සඤ්ඤාව චෛතසික ධර්මයක්. සිතිවිල්ලක්. එහෙත් ඒ සඤ්ඤාව මුල් කර

ගෙන ඉන්ද්‍රියන්ට ගොදුරු වෙන විවිධ දේ හඳුනා ගන්නා බැවින් සඤ්ඤාව අප්‍රමාණ කොට දක්වා තිබෙනවා. සඤ්ඤා ස්කන්ධය වශයෙන් දක්වා ඇත්තේ ඒ නිසයි.

ඉතින් මේ සඤ්ඤාව ද පළමුව සතරාකාරයකින් තේරුම් ගත යුතුයි. පළමුව සඤ්ඤාව කියන්නේ අරමුණු හඳුනා ගැනීම බව තේරුම් ගත යුතුයි. දෙවනුව ඒ සඤ්ඤාව ඇති වන හේතුව වටහා ගත යුතුයි. සඤ්ඤාව හටගන්නේ, සඤ්ඤා සමුදය වන්නේ ද ස්පර්ශය නිසයි. ඒ ස්පර්ශය ද ඇති ව, පැවැත, නැති ව යන ස්වභාවයෙන් යුක්ත එකක්. අනිත්‍ය වූ එකක්. ඉතින් ඒ ස්පර්ශය ද වෙනස්ව යන විට ඒ නිසා හට ගන්නා සඤ්ඤාව ද වෙනස් වෙනවා. ස්පර්ශය නැති වන විට සඤ්ඤාව ද නැති වෙනවා. එය සඤ්ඤා නිරෝධය බව තේරුම් ගන්නවා.

සඤ්ඤාව කියන්නේ මිරිඟුව වගේ එකකට. **(මරීචිකූපමා සඤ්ඤා)** මිරිඟුව කියන්නේ ඇත්තට ම තියෙන දෙයක් නොවෙයි. දුරට වහිනවා වගේ පෙනුනට වහින්නේ නැහැ. ඒ මිරිඟුවයි. නැති දෙයක් ඇති දෙයක් හැටියට පේනවා, ළඟට යන්න, යන්න ඒ හඳුනාගත් දේ වෙනස් වෙනවා නැතිව යනවා. අන්න ඒ වගේ සඤ්ඤාවෙන් හඳුනා ගන්නා දේ ක්ෂණිකව වෙනස් වෙලා යනවා. ඉන්ද්‍රියන්ට ගොදුරු වන අරමුණ ඉතා ක්ෂණිකව වෙනස් වෙලා යන අතර ඒ තුළින් කෙරෙන හඳුනා ගැනීම ද වෙනස් වෙනවා. ඒ වෙනස්වීම ම, අනිත්‍ය ස්වභාවය ම දුකක්. ඒ දුක නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය බව තේරුම් ගැනීම සත්‍යාවබෝධයට අත්‍යාවශ්‍ය ම කාරණයක්.

**සඤ්ඤාව දෙස පස් ආකාරයකින් බලා ඒ පිළිබඳ යථාභූත ඥාණ දර්ශනය පහළ කර ගැනීම.**

සඤ්ඤාව, සමුදය වශයෙන් දකිනවා කියන්නේ, සඤ්ඤාව හේතූන් නිසා හට ගන්නා එකක් බවත්, ඒ සඤ්ඤාව හට ගැනීමට හේතුව ස්පර්ශය බවත් තේරුම් ගැනීමයි.

සඤ්ඤාව, අත්ථංගමය වශයෙන් දකිනවා කියන්නේ, සඤ්ඤාව ඇති වන්නට හේතු වූ ස්පර්ශය නැති වී යාම තුළ සඤ්ඤාව ද නැති ව යන බව තේරුම් ගැනීමයි.

සඤ්ඤාවේ ආශ්වාදය දකිනවා කියන්නේ, සඤ්ඤාව හෙවත් හඳුනා ගන්නා හැඳිනීම් තුළ කිසියම් සැපයක්, සොම්නසක් තිබේ ද, එය තේරුම් ගැනීමයි.

සඤ්ඤාවේ ආදීනව දකිනවා කියන්නේ, හඳුනා ගන්නා හැඳිනීම් තුළ කිසියම් නිත්‍ය නොවන ස්වභාවයක්, වෙනස් වෙන සුළු ස්වභාවයක් දුක් සහිත ස්වභාවයක් වේද, ඒ ස්වභාවය තේරුම් ගැනීමයි.

සඤ්ඤාව, නිස්සරණ වශයෙන් දකිනවා කියන්නේ, හඳුනන හැඳිනීම් සුව සහගත නම් ඒවා අල්ලා ගන්නේ ද නැතිව, දුක් සහගත නම් ඒවා හා ගැටෙන්නේ ද නැතිව, මධ්‍යස්ථ නම් ඒවායේ මුළා වෙන්නේ ද නැතිව, කරුණු අවබෝධයෙන් ඒ සඤ්ඤාව අත හැරීමයි.

ඉතින් මේ පස් ආකාරයෙන් සඤ්ඤාව දෙස බලන ශ්‍රුතවත් ආර්ය ශ්‍රාවකයා ඒ සඤ්ඤාව තමා නොවන බවත්, තමාගේ නොවන බවත්, තමාට අවශ්‍ය ලෙස පාලනය කළ නොහැකි බවත්, ඒ සඤ්ඤාව තුළ හෝ ඉන් පිටත හෝ සත්ත්වයෙක් පුද්ගලයෙක් නොවන බවත් හුදෙක් කිසියම් ක්‍රියාකාරිත්වයක් පවතින බවත් තේරුම් ගන්නවා. ඒ නිසා සඤ්ඤාව නිසා ඇති විය හැකි සක්කාය දිට්ඨිය නැති කර ගන්නවා.

**4. සංස්කාරස්කන්ධය**

සංස්කාර කියන්නේ සකස්වීමයි. රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ යන ස්කන්ධ පහ උපදවා ගැනීමට, පවත්වා ගැනීමට සත්ත්වයන් විසින් කරවනු ලබන කෑම්-බීම්, ඉඳුම්-හිටුම් ආදී සියලු ක්‍රියාකාරකම් කරවනු ලබන සිතිවිලි සමූහය, සංස්කාරස්කන්ධය වශයෙන් හඳුන්වනවා. ඒ සිතිවිලි අතර චේතනා චෛතසිකය ප්‍රධානයි. ඒ නිසා සංස්කාර යන වචනය විස්තර කරන තැන චේතනා යන පදය ද යොදනවා.

**"කිඤ්ච භික්ඛවේ, සංඛාරේ වදේථ? සංඛතං අභිසංඛරොන්තී'ති භික්ඛවේ, තස්මා සංඛාරාති වුච්චන්ති. කිඤ්ච සංඛතං අභිසංඛරොන්ති? රූපං රූපත්තාය සංඛතං අභිසංඛරොන්ති, වේදනං වේදනත්තාය සංඛතං අභිසංඛරොන්ති. සඤ්ඤං සඤ්ඤත්තාය සංඛතං අභසංඛරොන්ති. සංඛාරේ සංඛරත්තාය සංඛතං අභිසංඛරොන්ති. විඤ්ඤාණනං විඤ්ඤාණතතාය සංඛතං අභිසංඛරොන්ති. සංඛතං අභිසංඛරොන්ති'ති ඛෝ භික්ඛවේ, තස්මා සංඛාරාති වුච්චන්ති."**

"මහණෙනි, කවර කරුණක් නිසා සංස්කාර යැයි කියන්නේද? සකස් කරයි යන අදහසින් සංස්කාර යැයි කියනවා. රූපය, රූපය පිණිස සකස් කරන්නේත්,

වේදනාව, වේදනාව පිණිස සකස් කරන්නේත්, සඤ්ඤාව, සඤ්ඤාව පිණිස සකස් කරන්නේත්, සංස්කාර, සංස්කාර පිණිස සකස් කරන්නේත්, විඤ්ඤාණය, විඤ්ඤාණය පිණිස සකස් කරන්නේත් සංස්කාරයයි. සකස් කරනවා යන අදහසින් සංස්කාර යන නම කියනවා." (ඛජ්ජනීය සූත්‍රය)

රූපයේ හට ගැන්ම, පැවැත්ම පිණිස කිසියම් ක්‍රියාවක් සිදු කරන්නේ ද එය රූපය පිණිස කර්ම සකස් කිරීමක් බැවින් රූප සංස්කාර වශයෙන් දක්වන්න පුළුවන්. කෑම්, බීම්, ඉඳුම්, හිටුම්, ඇඳුම් ඇඳීම, පැළඳීම් ආදිය රූපය මුල් කරගෙන කරන ක්‍රියාවන්. රූපයේ පැවැත්ම පිණිස කරනු ලබන සකස් කිරීමක්. **"රූපං රූපත්තාය සංඛතං අභිසංඛරොන්ති"** යනුවෙන් පැහැදිලි කළේ ඒ බවයි.

විවිධ රසැති ආහාර අනුභව කිරීම, ක්‍රීඩා පැවැත්වීම්, නැටුම් ගැයුම් බැලීම් ආදිය විඳීම සඳහා කරන ක්‍රියාවන්, වින්දනය පිණිස කෙරෙන සැකසීම්, වේදනා සංඛාර වශයෙන් දක්වන්න පුළුවන්. එය වේදනාව උපදවා ගැනීම පිණිස, පවත්වා ගැනීම පිණිස කරනු ලබන සකස් කිරීමක්. **'වේදනං වේදනත්තාය සංඛතං අභිසංඛරොන්ති'** යනුවෙන් පැහැදිළි කළේ ඒ බවයි.

අකුරු ඉගෙනීම් ආදී යමක් හඳුනා ගැනීම සඳහා කරනු ලබන ක්‍රියාවන් සඤ්ඤා සංඛාර වශයෙන් හඳුන්වන්න පුළුවන්. හැඳිනීම ඇති කර ගැනීමට, පවත්වා ගෙන යාමට කරනු ලබන කිසියම් ක්‍රියාකාරකමක් වේද, එය සඤ්ඤා සංඛාරයේ ලක්‍ෂණයයි. එයත් සකස් කිරීමක් **'සඤ්ඤාං සඤ්ඤත්තාය සංඛතං අභිසංඛරොන්ති'** යනුවෙන් පැහැදිළි කළේ ඒ බවයි. ස්කන්ධ පඤ්චකයේ පැවැත්ම හා හට ගැනීම පිණිස සිදුවෙනු ලබන සකස්වීම සංඛාර වශයෙන් දක්වා තිබෙනවා. **'සංඛාරේ සංඛාරත්තාය සංඛතං අභිසංඛරොන්ති'** වශයෙන් දක්වා ඇත්තේ එයයි.

සත්ත්වයාගේ පැවැත්මට, ඉපැත්මට උපකාරි වන කුසලාකුසල චෛතසික වර්ධනය කිරීම කරන ක්‍රියාවන් නිසා විඤ්ඤාණයෙහි පැවැත්ම තහවුරු වෙනවා. ඒ සඳහා කරන සකස්වීම විඤ්ඤාණ සංඛාර වශයෙන් දැක්විය හැකියි. **'විඤ්ඤාණං විඤ්ඤාණත්තාය සංඛතං අභිසංඛරොන්ති'** වශයෙන් දක්වා ඇත්තේ එයයි.

ඉතින් මේ සමස්ත පඤ්චස්කන්ධයේ ම සකස්වීමට හේතුවන චේතනා, ඉන්ද්‍රියයනට ගොදුරු වන අරමුණු හා බැඳී පවතින බැවින්, සංස්කාර නැති නම් චේතනා වර්ග හයක් බුදුරජාණන් වහන්සේ දක්වා තිබෙනවා.

**'කතමේ ච භික්ඛවේ, සඞ්ඛාරා? ඡයිමේ භික්ඛවේ චේතනාකයා, රූප සඤ්චේතනා, සද්දසඤ්චේතනා, ගන්ධ සඤ්චේතනා, රස සඤ්චේතනා, ඵොට්ඨබ්බ සඤ්චේතනා, ධම්ම සඤ්චේතනා, ඉමේ වුච්චන්ති භික්ඛවේ සඞ්ඛාරා'**

මහණෙනි, සංස්කාර කියන්නේ මොනවාටද? මහණෙනි, රූප සඤ්චේතනාවය, සද්ද සඤ්චේතනාවය, ගන්ධ සඤ්චේතනාවය, රස සඤ්චේතනාවය, ඵොට්ඨබ්බ සඤ්චේතනාවය, ධර්ම සඤ්චේතනාවය යන මේ හය චේතනා සමූහය වශයෙන් හඳුන්වනවා.
(උපාදාන පරිවත්ත සූත්‍රය - සංයුක්ත)

මෙම සය වැදෑරුම් චේතනාවන් ද යෝනිසෝමනසිකාරයෙන් දකින්නට පුරුදු වෙන ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා එය සතරාකාරයකින් තේරුම් ගැනීමට උත්සාහවත් වෙනවා.

සංස්කාර, චේතනා පිළිබඳ නුවණින් කල්පනා කරන පුද්ගලයා ඒවා ඉන්ද්‍රියයනට ගොදුරු වන රූපාදී අරමුණු නැමැති හේතූන් නිසා හටගන්නා බව දකිනවා. චේතනා කියන්නේ කෙසෙල් කඳක් වැනි වූ සාරයක් නැති දෙයක් බව තේරුම් ගන්නවා. **(සංඛාර කදලූපමා)** චේතනා කියන්නේ පඤ්චුපාදානස්කන්ධයේ ම සකස්වීමට බවත්, එසේ සකස් වන්නේ අරමුණු සමඟ වන ස්පර්ශය නිසා බවත්, ඒ ස්පර්ශය නැති කළ විට සකස්වීමත් සංස්කාරයන් රැස්වීම කෙසෙල් කඳක අරටුව සොයන කෙනෙක් වෙහෙසට පත් වන්නාක් සේ වෙහෙස ඇති කරවන, දුක් ගෙන දෙන එකක් බවත්, ඒ දුක නැති කිරීමට ඇති මග ආර්ය අෂ්ටාංගික මාර්ගය බවත් තේරුම් ගන්නවා. එය ඔහුට සත්‍යාවබෝධයට උපකාරි වෙනවා.

**සංස්කාර දෙස පස් ආකාරයකට බලා ඒ පිළිබඳ යථාභූත ඤාණ දර්ශනය පහළ කර ගැනීම.**

සංස්කාර හෙවත් චේතනා සමුදය වශයෙන් දකිනවා කියන්නේ චේතනා හේතූන් නිසා හට ගන්නා එකක් බවත්, ඉන්ද්‍රිය ගෝචර වන අරමුණු හා ඒ ඒ ස්කන්ධ අතර සම්බන්ධය ඇතිවීම නැත්නම් ස්පර්ශය ඒ චේතනා ඇති වන්නට හේතුව බවත් දැකීමටයි.

සංස්කාර හෙවත් චේතනා අත්ථංගමය වශයෙන් දකිනවා කියන්නේ පඤ්චස්කන්ධයත්, ඉන්ද්‍රිය ගෝචර අරමුණුත් සම්බන්ධ කරවන ස්පර්ශය නැති කළ චේතනාව ද නැතිව යන බව තේරුම් ගැනීමටයි.

සංස්කාර හෙවත් චේතනා ආශ්වාදය වශයෙන් දකිනවා කියන්නේ, ඉන්ද්‍රිය ගෝචර අරමුණු හා පඤ්චස්කන්ධය සම්බන්ධ වී ඇති වන විඳීම්, හැඳිනීම්, සැකැසීම් හා දැනීම් නැමැති සකස්වීම නිසා කිසියම් සුවයක්, සොම්නසක් වේ ද, එය තේරුම් ගැනීමයි.

සංස්කාර හෙවත් චේතනා ආදීනව වශයෙන් දකිනවා කියන්නේ, ඉන්ද්‍රිය ගෝචරවන රූපාදී අරමුණුත් පඤ්චස්කන්ධයත් සම්බන්ධ වී ඇති වන කිසියම් විඳීම්, හැඳිනීම්, සැකැසීම් හා දැනීම් පිණිස යම්කිසි සකස්වීමක් වේද, ඒ සකස්වීම වෙනස් වී යා හැකි බවත්, එසේ වෙනස් වීමෙන් දුකක්, දොම්නසක් ඇතිවිය හැකි බවත් තේරුම් ගැනීමයි.

සංස්කාර හෙවත් චේතනා නිස්සරණය වශයෙන් දකිනවා කියන්නේ, ඉන්ද්‍රිය ගෝචර වන රූපාදී අරමුණුත්, පඤ්චස්කන්ධයත් සම්බන්ධ වී ඇති වන විඳීම්, හැඳිනීම්, සැකැසීම් හා දැනීම් පිණිස කිසියම් සකස්වීමක් වේ ද, ඒ සකස්වීම සුව සහගත නම්, සුවය පිණිස පවතී නම්, එය අල්ලා ගන්නේ ද නැතිව, ඒ සකස්වීම දුක පිණිස පවතී නම්, එය හා ගැටෙන්නේ ද නැතිව, ඒ සකස්වීම මධ්‍යස්ථයි නම්, එහි මුළා වන්නේ ද නැතිව, ඒ සකස්වීම අවබෝධයෙන් අත හැරීමයි. ඒ සකස්වීමෙහි නිරපේක්ෂ වීමයි. කිසිදු ආකාරයක බලාපොරොත්තුවක් නැතිව සිටීමයි. එය නිස්සරණයට ඇති ක්‍රමයයි.

ඉතින් මේ පස් ආකාරයට සංස්කාර ස්කන්ධය දෙස බලන ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා ඒ සකස්වීම තමා නොවන බවත්, ඒ සකස්වීම කරන්නේ තමා නොවන බවත්, එය හුදෙක් එයටම ආවේණික ක්‍රියාවලියක් බවත්, එය තමාගේ කරගත නොහැකි බවත්, තමාට අවශ්‍ය ලෙස පාලනය කළ නොහැකි දෙයක් බවත් තේරුම් ගන්නවා. ඒ සකස්වීම තුළ හෝ එයින් පිටත හෝ සත්ත්වයෙක් - පුද්ගලයෙක් නොසිටින බව දකින ඔහු, සකස්වීම තුළ ඇතිවිය හැකි සංස්කාරස්කන්ධය නිසා ඇතිවිය හැකි සක්කායදිට්ඨිය නැති කර ගන්නවා.

**5. විඤ්ඤාණස්කන්ධය**

ඉන්ද්‍රියන්ට ගෝචර වන අරමුණු දැන ගන්නා ස්වභාවය විඤ්ඤාණයයි. විඤ්ඤාණය වශයෙන් බොහෝ තැන්වලදී හඳුන්වනු ලබන්නේ සිතමැයි. අතීත වර්තමානාදී වශයෙන් නොයෙක් ආකාරයෙන් බෙදී ගිය විඤ්ඤාණ රැසක් පවතින නිසා ඒ සියලු දේම සළකා විඤ්ඤාණස්කන්ධය වශයෙන් දක්වා තිබෙනවා.

සංයුක්ත නිකායේ ඛජ්ජනීය සූත්‍රය විඤ්ඤාණය පිළිබඳ විස්තර කරන්නේ මෙහෙමයි.

**කිඤ්ච භික්ඛවේ, විඤ්ඤාණං වදේථ? විජානාතී'ති ඛෝ භික්ඛවේ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති. කිඤ්ච විජානාති? අම්බිලම්පි විජානාති, තිත්තකම්පි විජානාති, කටුකම්පි විජානාති, මධුරකම්පි විජානාති, ඛාරිකම්පි විජානාති, අඛාරිකම්පි විජානාති, ලෝණිකම්පි විජානාති, අලෝණකම්පි විජානාති, විජානාතී'ති ඛෝ භික්ඛවේ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති.**

"මහණෙනි, කුමක් නිසා විඤ්ඤාණ යැයි කියන්නේද? දැනගනී යන අදහසින් විඤ්ඤාණ යැයි කියනවා. කුමක් දැන ගන්නේද? ඇඹුල් රසය ද දැන ගන්නවා. තිත්ත රසය ද දැන ගන්නවා. කටුක රසය ද දැනගන්නවා. මිහිරි රසය ද දැන ගන්නවා. කර රසය ද දැන ගන්නවා. කර නොවූ රසය ද දැන ගන්නවා. ලුණු රසය ද දැන ගන්නවා. ලුණු රස නැති දේ ද දැන ගන්නවා. දැන ගන්නවා යන අදහසින් විඤ්ඤාණය යැයි කියනවා."

මෙම අදහස කියවන විට කෙනෙකුට විඤ්ඤාණය කියන්නේ දිවට දැනෙන දැන ගන්නා ස්වභාවයකට යැයි වැරදි වැටහීමක් ඇති විය හැකියි.

මෙහිදී විශේෂයෙන්ම දිවට දැනෙන රස ගැන කියූව ද ඉන්ද්‍රියයනට ගොදුරු වෙන රූපාදී සියලු අරමුණු රස දැන ගන්නා ස්වභාවය විඤ්ඤාණය වශයෙන් තේරුම් ගත යුතුයි. විඤ්ඤාණ හයක් පිළිබඳව ධර්මයෙහි සඳහන් වන්නේ ඒ නිසායි.

**"කතමඤ්ච භික්ඛවේ, විඤ්ඤාණං? ඡයිමේ භික්ඛවේ, විඤ්ඤාණ කායා, චක්ඛු විඤ්ඤාණං, සෝත විඤ්ඤාණං, ඝාණ විඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, කාය විඤ්ඤාණං, මනෝ විඤ්ඤාණං, ඉදං වුච්චති භික්ඛවේ, විඤ්ඤාණං."**

"මහණෙනි, විඤ්ඤාණය කියන්නේ කුමකට ද? මහණෙනි, චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන මේ හය විඤ්ඤාණ වශයෙන් හඳුන්වනවා."
(උපාදාන පරිවත්ත සූත්‍රය - සංයුක්ත නිකාය)

ඉන්ද්‍රියයනට ගොදුරු වන අරමුණු දැන ගන්නා ස්වභාවය වශයෙන් තමයි විඤ්ඤාණය හය ආකාරයක් වන්නේ. ඇස ඉදිරියට රූපයක් පැමිණි විට ඇස ඇසුරු කොට පවතින, රූපය දැන ගන්නා සිත, චක්ඛු විඤ්ඤාණයයි. කනට ශබ්දයක් පැමිණියාම එය දැනගන්නා සිත, සෝත විඤ්ඤාණයයි. නහයට ගඳක් සුවඳක් පැමිණියාම ඒ ගඳ සුවඳ දැන ගන්නා සිත, ඝාණ විඤ්ඤාණයයි. කයට ස්පර්ශයක් පැමිණියාම ඒ ස්පර්ශය දැන ගන්නා සිත, කාය විඤ්ඤාණයයි. සිතට ගොදුරු වන අරමුණු, සිතිවිලි දැන ගන්නා සිත, මනෝ විඤ්ඤාණයයි.

ලෝකයෙහි පෙනීම, දැකීම, ඇසීම, රිදීම, සනීපය, දැනීම, විඳීම යන වචන වලින් හඳුන්වන සියල්ලම මේ විඤ්ඤාණස්කන්ධය මැයි. සිතමැයි, දැනීම කරන්නේ සිතයි. විඤ්ඤාණයයි. එය එයට ආවේණික වූ ස්වභාවයයි. පෘථග්ජන පුද්ගලයා ඇසට රූපයක් පැමිණි විට චක්ඛු විඤ්ඤාණය රූපය දැන ගත්තත් මම කියා කෙනෙක් ඒ චක්ඛු විඤ්ඤාණය තුළ තබා ගෙන මම රූප දකිනවා ආදී ලෙසින් සිතයි. නමුත් සැබැවින්ම සිදු ව ඇත්තේ ඒ ඒ ඉඳුරන්ට පැමිණි ඒ ඒ රූපාදී අරමුණු ඒ ඒ ඉන්ද්‍රිය බද්ධ විඤ්ඤාණයන් මගින් දැන ගැනීම පමණි.

මජ්ඣිම නිකායේ මහා වේදල්ල සූත්‍රය විඤ්ඤාණය පිළිබඳව විශේෂ පැහැදිලි කිරීමක් කරනවා.

**විජානාති විජානාතී'ති බෝ ආවුසෝ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති. කිඤ්චා විජානාති, සුඛන්ති'පි විජානාති. දුක්ඛන්ති'පි විජානාති. අදුක්ඛමසුඛන්ති'පි විජානාති.**

"ඇවැත්නි, දැන ගනී, දැන ගනී යන අදහසින් විඤ්ඤාණ යැයි කියනවා. කුමක් දැන ගනීද? සැප ද දැන ගනී. දුක ද දැන ගනී. සැපත් නැති දුකත් නැති මධ්‍යස්ථ ස්වභාවය ද දැන ගනී."

මෙම විස්තරයට අනුව සැප, දුක්, උපේක්ෂා වේදනා හරිහැටි දැන ගැනීම ද සිදුවන්නේ විඤ්ඤාණය නිසාය. අරමුණු රස විඳීමටත්, හැඳීනීමටත්, ඒ ඒ ස්කන්ධවලට ආවේණික ක්‍රියා පිණිස සකස්වීමටත් විඤ්ඤාණය ම ප්‍රබල වන බව අප මෙහිදී තේරුම් ගත යුතුයි.

ඉන්ද්‍රියයනට ගොදුරු වෙන අරමුණු හා කටයුතු කිරීමේදී පඤ්චස්කන්ධයම ක්‍රියාකාරී තත්ත්වයකට ගැනීමට විඤ්ඤාණය බෙහෙවින්ම බලපානවා. මනස සෑම ක්‍රියාවකදීම ප්‍රධාන වෙනවා කියන්නේ ද ඒ නිසයි. ඉතින් මේ විඤ්ඤාණස්කන්ධය ද සතරාකාරයෙන් තේරුම් ගත යුතු වෙනවා.

පළමුව විඤ්ඤාණය යනු අරමුණු දැන ගැනීම යන බවත් ඒ විඤ්ඤාණය, ඉන්ද්‍රියයන් හා සම්බන්ධ වී ක්‍රියාත්මක වන බැවින් විඤ්ඤාණ හයක් තිබෙන බවත් තේරුම් ගත යුතුයි. ඉන් අනතුරුව ඒ විඤ්ඤාණය හට ගැනීමට හේතුව, විඤ්ඤාණ සමුදාය, වන්නේ නාමරූප නිසා බව තේරුම් ගත යුතුයි. ඵස්ස, සඤ්ඤා, චේතනා යන නාම ධර්ම සමඟ රූප ධර්ම විඤ්ඤාණයේ හටගැන්මට හෝ පැවැත්මට හේතුවන බව තේරුම් ගත යුතුයි. රූපය හා රූපය ඇසුරු කොට ක්‍රියාත්මක වන ඉන්ද්‍රිය ධර්මයනුත් ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා යන නාම ධර්මයන්ගෙන් ද ක්‍රියාකාරිත්වය නැති තැන විඤ්ඤාණයේ ද පැවැත්මක් නැති බවත්, එම විඤ්ඤාණ නිරෝධය බවත් තේරුම් ගත යුතු වෙනවා. එසේම මේ සය ආකාරී වූ විඤ්ඤාණය ද එයට උපකාරී වන්නා වූ නාම ධර්ම ද නිත්‍ය නොවන බවත්, අනිත්‍ය බවත්, වහා වෙනස් වන සුළු බවත්, දුක උපදවන බවත්, ඒ නිසාම විඤ්ඤාණය දුකක් බවත් ඒ දුක නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය බවත් තේරුම් ගත යුතුව පවතිනවා. එය ඔහුගේ සත්‍යාවබෝධයට උපකාරී වෙනවා.

**පූජ්‍යපාද තලල්ලේ චන්ද්‍රකිත්ති ස්වාමීන් වහන්සේගේ**
"සෝතාපත්ති" පොතෙන් උපුටා ගන්නා ලදී.



# අවුකනාවලෝකන වන්දනා
## (හෙළ කලාකරුවාගේ විශ්මිත නිමැවුම)

ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ ඉතිහාසය දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි.පූ. 247-207) රාජ්‍ය කාලය දක්වා දිවයන බව වංශකථාගත තොරතුරු පිරික්සීමේදී පැහැදිලි වේ. ක්‍රි.පූ. තෙවැනි සියවසේ දී දෙවන පෑතිස් රජු විසින් ථූපාරාමයේ පිහිටුවන ලද ශෛලමය බුදු පිළමය පළමුවන ජෙට්ඨතිස්ස රජු (ක්‍රි.පූ. 263-274) විසින් ථූපාරාමයෙන් ඉවත්කරවා පාචීන තිස්ස පබ්බත විහාරයෙහි තැන්පත් කරන ලද බව මහාවංශය සඳහන් කරයි.

දුටුගැමුණු රජුගේ (ක්‍රි.පූ. 161-137) රාජ්‍ය කාලයේ දී එතුමන් විසින් කරවන ලද රුවන්වැලි මහා සෑ ගර්භයේ රුවන්මය බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කළ බව මහාවංශයේ සඳහන් වීමත් සමඟම ලංකාවේ බුදු පිළිම ආරම්භය ක්‍රිස්තු පූර්ව යුගයන්ට අයත්බව සැළකීමට සිදුවේ. ලක්දිව බුද්ධ ප්‍රතිමාවල ඉතිහාසය මේ ආකාරයෙන් විකාශනය වන අතර ලාංකීය බුද්ධ ප්‍රතිමා ශිල්පී හූ සිය නිර්මාණයන්ට දේශීයත්වය සමාරෝපණය කළහ. මුල් යුගයේ සිට දහවැනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ නෙළන ලද බුදු පිළිම වලින් බහුතර සංඛ්‍යාවක් මෙරට දේශීය නිර්මාණ ශිල්පීන්ගේ යැයි වෙසෙසා හැඳින්වීමට ප්‍රමාණවත් දේශීය ලක්ෂණ වලින් පරිපෝෂිතය.

මුල් අවදියේ ලක්දිව බුදු පිළිමවලට මහායාන ආභාසය ලැබී ඇත්තේ අල්ප වශයෙනි. මෙයට ප්‍රබල හේතුවක් වූයේ එකල අනුරාධපුර මහාවිහාර සම්ප්‍රදාය මහායානය දැඩිව ප්‍රතික්ෂේප කළේය. පොළොන්නරු අවධියේ සිට මහායාන බලපෑම වැඩි වශයෙන් සිදුවීම නිසා බුදු පිළිමය විෂයෙහිද ඒ ආභාෂය දක්නට ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිමාවල විදේශීය ලක්ෂණද දක්නට ලැබේ.

ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායට අයත් විශිෂ්ඨ ගණයේ බුද්ධ ප්‍රතිමා ලැබෙන්නේ ශ්‍රී ලංකාවෙනි. සමභංග ඉරියව්වෙන් යුතු විශාලම හිටි බුදු පිළිම පහක් ශ්‍රී ලංකාවේ වෙයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලා වැවට බටහිරින් අවුකන ගමේ කලා වැව දෙසට මුහුණලා නෙලා ඇති **අවුකන බුදු පිළිමය** ඉන් එකක් ලෙස දැක්විය හැකිය.

බ්‍රිතාන්‍යය යටත් විජිත පාලන සමයේ විසිවැනි සියවස මුල ලංකාවේ මැනුම් කටයුතු කළ මිනින්දෝරු නිලධාරියෙකු වූ **“රිචඩ් ලෙස්ලි බ්‍රෝහියර්”** මෙරට ඓතිහාසික සම්ප්‍රදායයන් වාරි කර්මාන්තය සහ ඓතිහාසික යුග පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකළ විද්වතෙකි. ඔහු ලංකාවේ අස්සක් මුල්ලක් නෑර ඇවිදිමින් අවුරුදු 40 ක් පුරා මේ දිවයින පිළිබඳ ප්‍රමාණික දැනුමක් උකහා ගත්තේය.

මිනින්දෝරු කට්ටලය සහ මිනුම් පටිය රැගෙන පුරාණ රාජධානි සමය බිඳ වැටීමෙන් පසු එතෙක් මිනිසුන්

පය නොගැසූ ඝන වනාන්තර තුළ ඔහු ඇවිද ගියේය. ඓතිහාසික යුගයේ පුරාණ රාජධානිවල නටඹුන් දැක හැඳින ගත්තේය. ඒ නිසාම මෙරට ශ්‍රේෂ්ඨ ඓතිහාසික සම්ප්‍රදායයන්ට බ්‍රෝහියර් මහත් සේ ගරු කළේය.

බ්‍රෝහියර් ස්වකීය චාරිකා අලළා තබන ලද වාර්තා සටහන් ඇසුරින් "Seein Ceylon" නමින් ග්‍රන්ථයක් සම්පාදනය කළේය. බ්‍රෝහියර්ගේ ආධ්‍යාත්මය හඳුනා ගැනීමට ඇති හොඳම සටහනක් වන්නේ **අවුකන පිළිම වහන්සේ. හිරුඑළිය නොවැටෙන ඝන වනාන්තරයේ ප්‍රථමයෙන් නෙත ගැටුණු අවස්ථාවේ ඔහු විසින් තබන ලද සටහන්ය.** බ්‍රෝහියර් අවුකන මැනුම් කටයුතු කරන්නේ 1920 දශකයේදීය.

"ලොව මිනිසා විසින් නිර්මාණය කළ විශිෂ්ඨතම කලා නිර්මාණය අවුකන බුද්ධ ප්‍රතිමාව යැයි මම විශ්වාස කරමි. මා කලා වැව මිටියාවතේ මිනුම් කටයුතු කළේ කලා වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වී රූස්ස වනාන්තරයෙන් වැසුණු ගොවි බිම්වල ජනපද ගොවීන් පදිංචි වන්නට බොහෝ කලකට පෙරය. එවකට මේ ප්‍රදේශ හරහා මාර්ග කිසිවක් තිබුණේ නැත. **මිනින්දෝරු කණ්ඩායම වනාන්තරය ඔස්සේ ඉදිරියට ගමන් කරමින් සිටියේ ත්‍රිකෝණමිතික ස්ථානයක් සඳහා උස් කඳු ගැටයක් සොයා ගනු පිණිසය. අප කැලෑව පාදා ගනිමින් ඉදිරියට යද්දී හදිසියේම අප ඉදිරියේ මේ විසල් ප්‍රතිමාව පාදුර්භූත විය.** මම තුෂ්ණිම්භූත වීමි. මා දකින්නේ සත්‍යයක් ද මායාවක් දැයි මට අදහාගත නොහැකි විය."

**"හිරු නොබසින අධිරාජ්‍යයේ පුරවැසියෙකු ලෙස ජීවිත කාලය පුරා සිතේ පැවති අභිමානය ඒ නිමේෂයේදී බොඳ වී ගියේය.** දැවැන්ත ප්‍රතිමාව ඉදිරියේ මා කුඩා අඟුටුමිට්ටකු බවට පත්ව සිටියේය. අභිමානය ඉවයත හළ මම මේ චමත්කාරජනක විස්මිත නිර්මාණය නරඹන්නට වූයෙමි. සියවස් විස්සකට වැඩි කාලයක් තිස්සේ මෙම භූමිය හරහා හැමූ මෝසම් සුළඟට හා වර්ෂාවටත් මේඝ ගර්ජනාවලටත් චණ්ඩ අකුණු සැරවලටත් මුහුණ දෙමින් සුවිසල් ප්‍රතිමාව මහේශාඛ්‍ය ලීලාවෙන් නැගී සිටියේය. මට වැටහී ගියේ රුදුරු ආක්‍රමිකයන්ගේ කුරිරු හස්තයන්ගෙන් බේරී මෙය පැවැතීම මහා ආශ්චර්යයක් බවය."

"විසල් ගල් පර්වතයක නැගෙනහිර මුහුණතේ මුළුමණින්ම රවුම්වට ආශිර්වාද මුද්‍රාවෙන් නෙළා ඇති මේ මහා බුදු පිළිමය අතිශය සුන්දරය. මෙවැනි මනස්කාන්ත පසුබිමක මේ උත්කෘෂ්ඨ නිර්මාණය කරන්නට හැකියාව තිබෙන්නේ නියත වශයෙන්ම ශ්‍රේෂ්ඨයකුට පමණි. මෙවැනි රළු ගල් පව්වක මෙලෙස සූක්ෂම කැටයම් සහිත සියුම් ඉරියව් මතු කරමින් ජීවය පිඹිය හැකිවන්නේ උත්කෘෂ්ඨ කලාකරුවෙකුටම පමණි."

මහාවංශයේ දැක්වෙන පරිදි ධාතුසේන රජතුමා විසින් අවුකන ප්‍රතිමාව නිමවා තිබේ. ධාතුසේන රජතුමාගේ විශිෂ්ටතම නිර්මාණයක් වූ කලා වැවට බටහිරින් අවුකන ප්‍රතිමාව පිහිටා ඇත. මෙය නිමවූ ගල්වඩුවා **"බරණ"** නැමැත්තෙකු බවත්, ඔහුට ගල්වඩු ශිල්පය ඉගැන්වීමට අවකන් දේශයෙන් ශිල්පියෙකු පැමිණි බවත්, එහෙයින් මෙම ප්‍රතිමාව අවුකන ලෙස ප්‍රසිද්ධ වූ බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ. බරණගේ දක්ෂතාවය ගැන පැහැදුණු ධාතුසේන රජතුමා ඔහුට ගම්වරයක් තෑගි දී තිබෙන අතර, එය **"ගල්වඩුවාගම"** නමින් අදත් දක්නට ඇත.

අවුකන පිළිම වහන්සේ නෙළීම සම්බන්ධයෙන් නොයෙකුත් පුරාවෘත්ත ඉතිහාසයේ සඳහන් වන අතර, ඉන් වඩාත් ප්‍රචලිත වන්නේ ගුරු ගෝල තරඟයක ප්‍රතිඵලයක් ලෙස අවුකන නිර්මාණය වූ බවයි.

දිවයිනේ බොහෝ තැන්වල දක්නට ලැබෙන්නේ වැවත් දාගැබත් වෙනුවට වැවත් බුදු පිළිමයත්ය. දාගැබ හෝ බුදු පිළිමය මිනිසුන්ගේ අධ්‍යාත්මික දියුණුවත් වැව ලෞකික දියුණුවත් සංකේතවත් කරයි.

ලොව සුපතල අවුකන පිළිමය පිහිටි කළු ගලක නිර්මාණය කරන ලද හිටි පිළිමයකි. උසින් අඩි 38 අඟල් 10 කි. සිරස් පත සමඟ උඩ අඩි 42 අඟල් 06 කි. පිළිමය පාමුල අලංකාර පද්මාසනයක් ඇති අතර, පද්මාසනයේ සිට සිරස් පතට ඇති මුළු උස අඩි 46 අඟල් 04 ක් ලෙස ගණන් බලා ඇත. **මේ සුවිසල් ප්‍රතිමාවේ ඇති සුවිශේෂ ලක්ෂණයක් නම් එහි සිරසට වැටෙන ජලය නාසය දිගේ ගලාගෙනැවිත් පහළ සිරිපතුල් දෙක අතර මැද ඇති සළකුණක් මතට වැටීමයි. මෙයින් පෙනී යන්නේ මේසා විශාල ශෛලමය ප්‍රතිමාවක් වුවද එය ලම්බකව, සමබරව, ඍජු ලෙස නෙළීමට තරම් බරණ ගල් වඩුවා සමත් වී ඇති බවයි.** එය හෙළ කලාකරුවාගේ විශ්මිත කලා කුසලතාවය මැනවින් ලොවට කියාපාන කදිම සාධකයකි.

**ඉෂාන් අවිශ්ක ගමගේ**



# උප්පලවණ්ණා තෙරණිය

ගෞතම බුදු රජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකාවන් වූයේ ඛේමා සහ උප්පලවණ්ණා තෙරණියයි. උප්පලවණ්ණා බොහෝ දීර්ඝ කාලයකට පෙර කරන ලද ප්‍රාර්ථනාවක් අනුව ඒ තනතුර ලැබීය.

මෙයට කල්ප ගණනාවකට පමණ පෙර පදුමුත්තර බුදුන් සමයේ දී විමලා නම් නාග කන්‍යාවක් වශයෙන් ඇය උපත ලද්දෙකි. මේ විමලාවන්ගේ පියා මහෝරග නා රජෙකි. ඒ නාරජ බුදු සසුන ගැන පැහැදීමක් ඇති අයෙකු විය. දිනක් මේ නාරජු පදුමුත්තර බුදු රජුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේලාට සිය නිවසට වඩින්නැයි කියා දානයකට ආරාධනා කළේය.

පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඇතුළු මහ සංඝයා වහන්සේලා මහ පෙරහරින් වැඩම කරවිය. ප්‍රණීත ආහාර පානයෙන් දානය පිළිගැන්විය. බුදු රජුන් ඇතුළු සංඝයා වහන්සේලා දන් වැළඳූ වීය. දන් වළඳා අවසානයේදී පදුමුත්තර බුදුන් වහන්සේ අනුමෝදන දහම් දෙසූ සේක.

විකසිත පියුමක් බඳු ඒ පදුමුත්තර බුදු රජාණන් කෙරෙහි එදා තදින්ම පැහැදුණු විමලා නැමැත්තිය ඒ බුදු හිමියන් දෙසම බලා සිටියාය. ඒ බුදුහු විමලාවගේ අදහස දැන ගෙන සෘධියෙන් අගතැන්පත් මෙහෙණවරක් දැක්විය.

ඒ අවස්ථාවේදී මමද අනාගතයේදී මෙබඳු සෘධිමත් මෙහෙණක වෙම්වායි ප්‍රාර්ථනා කළේය. තවද එකල නාගයන් විසින් උතුම් කොට සලකනු ලැබූ අරුණ නම් උපුල් මලින් ඒ පදුමුත්තර ලෝකනාථයන් වහන්සේට පූජා කර මගේ පැහැය ඒ උපුල් මල් පැහැය සේ වේවායි ප්‍රාර්ථනා කෙළෙමි.

එසේම විපස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේදී සිටු දුවක් ලෙස ඉපැදුණු උප්පලවණ්ණාවෝ ඒ මුණිඳුට මහ දන් පැවැත්විය. එසේම උපුල් මලින් පුදා උපුල් වර්ණාව ප්‍රාර්ථනා කෙළෙමි.

කාශ්‍යප බුදුරජුන් ලොව පහළ වූ කාලයෙහි මම බරණැස් නුවර කකී නම් රජතුමාගේ දූවරුන් සත් දෙනාගෙන් සමණ ගුත්ශා නැමැති දෙවැනියා වීමි. මගේ සොහොයුරියෝ සමණනි, භික්ඛුණී, දාසිකා, ධම්මා, සුධම්මා, හා සංඝදාසිකා නම් වූහ.

ඒ සමයේ අප සත් දෙනා පැවිදි වීමට කැමැති වූවද අපේ පියතුමා ඊට අකැමැති විය. එබැවින් අපි සත් දෙනා බුද්ධෝපස්ථානයේ යෙදෙමින් කුමර බඹසර රැක්කෙමු. ඒ පිණිං අපි බොහෝ ආත්ම භාවයන්හීදි දෙව් සැප හා මිනිස් සැප වින්දෙමුයි බුද්ධෝපස්ථානයේ යෙදෙමින් කුමර බඹසර රැක්කෙමු. ඒ පිණිං අපි බොහෝ ආත්ම භාවයන්හීදි දෙව් සැප හා මිනිස් සැප වින්දෙමුයි.

මේ ආත්ම භාවයෙහි මම සසර කළ ඒ නොමද පින් බලයෙන් උපුල් පැහැති උප්පලවණ්ණා වීමි. එසේම මහත් සෘධි බලයද ලදිමි. එකල මාගේ සොහොයුරියන් සය දෙනා මෙකල ඛේමා, පටාචාරා, කුණ්ඩලා, කිසා ගෝතමී, ධම්ම දින්නා යන තෙරණිවරු හා විශාඛා උපාසිකාවද වෙති.

ගෞතම බුදු හිමියන් සමයේ සැවැත් නුවර සිටු කුලයක උපන් උප්පලවණ්ණා කුමරිය නිල් මහනෙල් මලක වර්ණයට සමාන වර්ණ සම්පත්තියකින් යුක්ත වූවාය. ඇය දුටු දුටුවන් මන නුවන් පිනවන රූ සපුවකින් යුක්ත වූවාය. එසේම ගුණ ගරුක තරුණියක වූවාය. ඇයගේ රුව ගුණ නුවණ පිළිබඳව ඇසූ දඹදිව බොහෝ රජ කුමරවරු හා සිටුවරු ඇය පරණ පාවා ගන්න අදහසින් ඇයගේ මව්පියන්ට හසුන් පත් එව්ය.

එහෙත් උප්පලවණ්ණා පස්කම් සැපතෙහි ඇලුම් නොකළාය. විවාහ දිවියකට ඇතුලත් වීමට අකමැති බව ඕ මව්පියන්ට දැන්වූවාය. මෑණියෙනි, පියාණෙනි, මම බුදු සසුනෙහි පැවිදි වීමට කැමැත්තෙමි. මට ඒ සඳහා අවසර දෙන්නැයි ඇයගේ ඉල්ලීම විය.

මව් පියන් ඇය රජ කුමරෙකුට හෝ සිටු කුමරෙකුට විවාහ කර දීමට කැමැති වූහ. එහෙත් උප්පලවණ්ණා ගේ බලවත් පෙරැත්ත නිසා මව් පියන් අකමැත්තෙන් නමුත් ඇයගේ අදහසට ඉඩ දුන්හ. ඇය භික්ෂුණී ආරාමයකට ගොස් පැවිදිව සිල් ගුණ පුරමින් භාවනා වැඩීමට පටන් ගත්තාය. ගත වූයේ අඩ මසකි. භාවනාවෙන් සිත දියුණු කරගත් උප්පලවණ්ණා තෙරණියෝ ධ්‍යාන උපදවා රහත් විය.

සෘධි බලය පිළිබඳව ඇයගේ විශිෂ්ඨත්වය සලකා භාග්‍යවතුන් වහන්සේ උප්පලවණ්ණා තෙරණිය සෘධි බල ඇති භික්ෂුණීන් අතර අග්‍රස්ථානයෙහි පිටුවාලූ සේක. එසේම ඇයට අග්‍රශ්‍රාවිකා තනතුරද පිරිනැමිණ.

වරක් බුදුරජුන් තීර්ථකයන් දමනය කිරිමෙහිලා ගණ්ඩබ්බ අඹරුක මුලදී යමා මහ පෙළහර පෑමට සුදානම් වූ සේක. මේ අවස්ථාවේදී උප්පලවණ්ණා තෙරණියෝ බුදු රජුන් වෙත ගොස් ස්වාමිනි මම පෙළහර පා තීර්ථකයන් දමනය කරන්නෙමියි ඒ සඳහා අවසර ඉල්ලා සිටියහ. ස්වාමිනී මම සතර දෙනෙකුන් අදින අශ්වරථයකින් සෘධි බලය මවා ඒ මගින් අවුත් භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට පෙළහර පාන්නෙමි යි ඕ තවදුරටත් කියා සිටියාය. එහෙත් පුරුෂ ධම්ම සාරථී බුදුරජාණන් වහන්සේ ඇගේ ඉල්ලීමට ඉඩ නුදුන් සේක.

එහෙත් ඇයගේ ජීවිතයේ අවසාන භාගයේදී එක් දිනකදි උප්පලවණ්ණා තෙරණියෝ ගෞතම ලෝකනාථයන් වහන්සේගේ පා වැඳ මෙසේ කියා සිටියාය. මහා වීරයාණන් වහන්ස මම සියලු දුක් නසා නිවන්පුර පැමිණි තැනැත්තියක්මි. ස්වාමිනී සසර සැරිසරන කාලයේදී ඉඳින් මගෙන් මාගේ දොසක් වී නම් ඊට සමා කරන සේක්වා. එවිට බුදුරජාණන් වහන්සේ උප්පලවණ්ණා තෙරණියෙනි, සිව්වනක් පිරිස් මැද සෘධි දක්වන්න, තොප පිළිබඳව ඔවුන්ගේ සැකයක් වේ නම් ඒ සැක සංසිඳුවන්න යයි පැවසූ සේක.

ඕ තොමෝ බුදුරජුන්ගේ දෙපා නැමද අහසට නැග සෘධි දැක්වූවාය. එකල විෂ්මයට පත් පිරිස මුදුනෙහි ඇඟිලි බැඳ උත්තමාවනි, මෙබඳු අසිරිමත් සෘධි බල ලබා ගත්තේ කෙසේ දැයි විමසා සිටියහ. එකල්හි ඕ තොමෝ තමාගේ අතීත භව පිළිබඳව ඉහත දැක්වූ තොරතුරු දක්වා සිටියේය.

(උප්පලවණ්ණා ථේරී ගාථා ඇසුරෙනි)

**ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ**
(සාම විනිසුරු - මුළු දිවයිනටම)



# ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

දැනට වසර 2600 කට පමණ පෙර සම්මා සම්බුද්ධත්වයට පත් වූ ගෞතම බුදුරජාණන් වහන්සේ භාරත දේශයේ කෝසල ජනපදයේ උපත ලැබූ රජකුමරෙකි. මව්කුසයෙන් බිහිවූ මොහොතේ සිටම පුදුම සහගත ගති පැවතුම් පෙන්වූ මේ කුමරා වැලිකෙළියේ පටන්ම හැසිරුණ ආකාරය අසාමාන්‍ය වියත කරුණාව, මෛත්‍රිය වැනි ගුණාංගවලින් සෙසු කුමාරවරුන් අභිබවනය කළ සිදුහත් කුමරා අධිෂ්ඨාන ශක්තියෙන් ද උට්ඨාන වීර්යයෙන් ද යුතු විය. මහාඥාන ශක්තියකින් පිරිපුන්ව සිටි මේ කුමරා සිප්සතර හැදෑරීම සඳහා එකල දඹදිව ප්‍රසිද්ධියට පත්ව සිටි මහ පඬිවරුන් වෙත යවන ලද අතර ඔවුන් දත් දේ ඉතා සුළුකලෙකින් ඉගෙන අවසන් කිරීමට මේ පින්වත් කුමරාට හැකියාව ලැබිණ.

සිදුහත් කුමරුන් සම්බන්ධයෙන් පළවී තිබූ විවිධ අනාවැකි නිසා තම පුත්කුමරාට සක්විති රජකම ලබාදීම පිය රජුගේ එකම පැතුම වූ අතර රජ සැප කෙරෙහි ඇලීම් වඩවන හැම සැප පහසුකමක්ම ඔහුට සපයා දී තිබිණ. සොළොස් වැනි වියේදී අතිශයින් රූප සම්පන්න වූ යසෝදරා කුමරිය සමඟ විවාහ වූ සිදුහත් කුමරා අපමණ යසඉසුරු මැද දිවිගෙවුවද ජීවිතයේ යථා ස්වභාවයද දුක් සහිත බවද මැනවින් තේරුම් ගත්තේය.

විසිනව හැවිරිදි වූ බෝසත් කුමරා තම පුත් රාහුල කුමරුත් උපන් දිනම රාත්‍රී කාලයෙහි රජ සැප හැරදමා මහාභිනිෂ්ක්‍රමණය කොට **"කිං කුසල ගවේසී"** තාපසයෙකු බවට පත්විය.

දඹදිව එකල මහත් ප්‍රසිද්ධියට පත්ව සිටි විමුක්තිකාමීන් ආචාර්යවරුන් හමුවූ සිදුහත් තාපසයා ඔවුන්ගේ ඉගැන්වීම් පිළිපදිමින් ඉතා දුෂ්කර ව්‍රතවල යෙදෙමින් හයවසරක් මුළුල්ලේ සත්‍ය ගවේෂණය කරමින් දඹදිව ගංගානම් ගඟ නිම්න ප්‍රදේශයේ සැරි සැරුවේය. එහෙත් තමන් ප්‍රාර්ථනා කරන සියලු සත්වයන්ට සැබෑ විමුක්තිය ලබා දෙන නිර්වාණගාමී මාර්ගය මේ විමුක්ති මාර්ග අනුගමනය කිරීමෙන් ලබා ගත නොහැකි බව ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කරගත් සිදුහත් තාපසතුමා අත්තකිලමථානුයෝගය, කාමසුඛල්ලිකානුයෝගය යන අන්ත දෙකම හැර දමා නිදහස් පිළිවෙතක් අනුගමනය කළේය.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පූරණය කරන ලද පාරමී ධර්ම බලයෙන් ද මහා අධිෂ්ඨාන ශක්තියෙන්ද නොපසුබට උත්සාහයෙන් ද ක්‍රියා කළ බෝසත් තවුසානන්ට තමන් වර්ධනය කරගත් මහා ඥාන බලය උපයෝගී කර ගනිමින් මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ යමින්

බුද්ධත්වය අවබෝධ කර ගැනීමට අවස්ථාව උදාවිය. කාමය, අරතිය, සාපිපාසාව ආදී කොට ඇත්තා වූ දසමාරසේනාව මුළුමණින්ම පරාජය කොට බුද්ධගයාවේ බෝ මැඩදී විමුක්තිය උදාකර ගැනීමට උන්වහන්සේ සමත් වූහ. බුදුරජාණන් වහන්සේ මෙම සම්මා සම්බුද්ධත්වයට පත්වූයේ සියලු ලෝක සත්වයන් කෙරෙහි පැවති අපරිමිත වූ කරුණාව හා මෛත්‍රිය පෙරදැරි කරගෙනය.

ලොව පවතින අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මනාව අවබෝධ කරගත් උන්වහන්සේ දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍ය ධර්මය ස්වයං ඥාන බලයෙන්ම අවබෝධ කරගත් සේක. ලොව දත යුතු යම්තාක් දේ ඇද්ද බුදුරදුන් ඒ සියල්ල දත් බැවින් සර්වඥ නම් විය. මේ අසිරිමත් බුද්ධි මහිමය අවබෝධය නිසා උන්වහන්සේ මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා බවට පත්වූහ. දෙවි බඹුන් මිනිසුන් සෑමදෙනාටම වඩා උත්තරීතර වූ හෙයින් ද, සියලුම ආශ්‍රවයන් ප්‍රහීණකළ හෙයින් ද අසමසම මිනිසෙකු බවට පත්වූහ.

සම්මා සම්බුද්ධ, තථාගත, සර්වඥ, ලෝකනාථ, තිලෝගුරු ආදි වශයෙන් ලෝකවාසීන් විසින් විවිධ නම් වලින් හඳුන්වන ලද බුදුරජාණන් වහන්සේ තුළ පැවති උදාර වූ ගුණ සමුදාය අනන්තය, අප්‍රමාණය. ඒ මහා ගුණකඳ පිළිබඳව මදක් හෝ මෙනෙහිකර බලනවිට උන්වහන්සේ ආශ්චර්යවත් මනුෂ්‍යයෙකු බව මනා ලෙසින් පැහැදිලි වේ.

සියලු කෙලෙසුන් නසා බුද්ධත්වයට පත් වූ ගෞතම බුදුරජාණන් වහන්සේ තමන්ට සත්‍යාවබෝධය සඳහා සෙවණ ලබා දුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට අනිමිසලෝචන පූජා පැවැත්වීමෙන් උන්වහන්සේට පිහිට වූ ගසකට වුවද කළගුණ සැලකීමෙන් ලබාදුන් මහඟු ආදර්ශය ලෝක පූජිත විය.

කරුණා නිධාන වූ අපරිමිත කරුණා ගුණයෙන් පිරිපුන් උන්වහන්සේ සුමේධ තාපස සමයේදී තම අත පත් නිවන්සුව හැරදමා පියා ලොව්තුරා බුද්ධත්වය පතා පාරමී දම් පුරණය කරන ලද්දේ සියලු ලෝක සත්වයන් කෙරෙහි පැවති මහා කරුණාව නිසාය.

අසරණ සරණ වූ කරුණා නිධාන වූ උන්වහන්සේ සැමදා අළුයම අවදිව් මහා කරුණා සමාපත්තියට සමවැදී ලෝක සත්වයන් දෙස දිවැසින් බලන්නේ එදින එතුමන්ගේ උදව් උපකාර අවශ්‍යවන්නේ කාහට දැයි සොයා බැලීම සඳහාය. රාජ රාජ මහාමාත්‍යාදීන් පමණක් නොව දිළිඳු අසරණයන් ද, මිනිමරුවන් ද, ගෝඝාතකයන්, යක්ෂයන් වැනි අයද උන්වහන්සේගේ මහා කරුණාවට බඳුන්ව ඔවුනට ශාන්තිය ගෙන දුන් කථා පුවත් ත්‍රිපිටකයේ අප්‍රමාණව දක්නට ලැබේ.

මහාකරුණාවෙන් මෙන්ම මහා ප්‍රඥාවෙන් ද බුදුරජුන් හා සමකළ හැකි අන් කිසිදු බ්‍රහ්මයෙකු, දෙවියෙකු හෝ මනුෂ්‍යයෙකු තුන් ලොවම නැත. උන්වහන්සේ තුළ පැවති ඉවසීමේ ගුණය සාමාන්‍ය මිනිසෙකු තුළ නොමැත. මිනිසුන් අතිශය කම්පාවට පත්වන අවස්ථාවලදී උන්වහන්සේ අකම්පිතව සිටියහ. මිනිසුන් අගතිගාමීව ක්‍රියාකළ අවස්ථාවලදී උන්වහන්සේ අගතියෙන් තොරව ක්‍රියා කළහ. සාමාන්‍ය මිනිසුන්ගෙන් කිසිදු අනුකම්පාවක් නොලැබූ අංගුලිමාලා වැනි මිනීවරුවන්ට පවා අනුකම්පා කළ උන්වහන්සේ ඔහු සොයා ගොස් විමුක්ති සුවය ලබා දුන්නා පමණක් නොව, අංගුලිමාලට අනිකුත් අය සුවපත් කිරීමේ අවස්ථාවද අංගුලිමාල පිරිතෙන් ලබා දුන්හ.

බුද්ධකාලීන සමාජයේ පැවති විවිධ විෂමතා දුරු කිරීමට උන්වහන්සේ දැරූ අපිරිමිත වූ ධෛර්යය හා උත්සාහය අති විශිෂ්ඨය. එදා භාරතීය සමාජයේ මුල් බැසගෙන තිබූ වර්ණභේදයේ අවිද්‍යාත්මක බව පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ පුද්ගලයෙකුගේ උසස් පහත් බව තීරණය කළ යුත්තේ ඔහුගේ හැසිරීම හා ක්‍රියාකාරකම් මත මිස උපත හෝ කුලය අනුව නොවන බව පෙන්වා දුන්හ.

බුදුරජුන් විසින් ක්‍රියාවට නගන ලද සමාජ විප්ලවය කථාවට පමණක් සීමා නොකළ උන්වහන්සේ එය ක්‍රියාවෙන් ද ඔප්පු කළහ. තමන් වහන්සේ විසින් පිහිටුවන ලද සංඝ සමාජයේ සියලු දොරටු කුලභේදයෙන් පන්ති භේදයෙන් තොරව, බුද්ධිමත්, ගුණවත්, පින්වත් හැමදෙනාටම එකසේ විවෘත කර දීමෙන් දක්වා ඇති ආදර්ශය අති උදාරය. සැඩොලුන් ලෙස සමාජයෙන් කොන්කර සිටි සුනීත වැනි අසරණයන් තම ශාසනයේ පැවිදිකර ගැනීමෙන් ද විනයධර භික්ෂූන් වහන්සේලාගේ අගතනතුරු, කරණවෑම් කුලයකින් පැවිදි වූ උපාලි තෙරණුවන්ට ලබා දීමෙන් ද එදා ක්‍රියාත්මක කළ සමාජ විප්ලවය සැබෑ සමාජ මෙහෙවරක් බව පැහැදිලිවේ.

බුදුරජුන්ද, භික්ෂූන් ද පිඬු සිඟායාමේදී උසස්, පහත් වශයෙන් ගෙවල් තෝරා බේරා ගැනීමෙන් තොරව ගෙපිළිවෙලින් පිඬුසිඟා වැඩීමේ ප්‍රතිපත්තියද මේ සමාජ විප්ලවයේ තවත් පියවරක් හැටියට හඳුන්වාදිය හැකිය.

සමාජයේ විවිධ කට කථා පැතිර යන්නට ඉඩ තිබියදි පවා, අම්බපාලි නගර සෝභිනියගේ නිවසේ දන් වැළඳීමට වැඩමකරන ලෙස බුදුන්ට කරන ලද ආරාධනය පිළිගත් උන්වහන්සේ එදිනම රජමැදුරේ දනට වඩින ලෙස ලිච්ඡවි රජදරුවන් විසින් පසුව කරන ලද ආරාධනය ප්‍රතික්ෂේප කළේය. මෙම සිදුවීම් වලින් සමාජ ශෝධකයෙකු හැටියට උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය මනාව පැහැදිළිවේ.

බුද්ධ කාලයේදී එකල සමාජයෙන් මුළුමණින්ම කොන් කරනු ලැබ සිටි කාන්තා පක්ෂය ඉදිරියට ගෙන ඔවුන්ට සමාජ පිළිගැනීමක් ලබාදුන් ශාන්ති නායකයා ගෞතම බුදුරජාණන් වහන්සේය.

එදා දාරකෝත්පත්ති අවස්ථාවලදි ගැහැණු දරුවකු ලැබීම නොසතුටට හේතු වන කරුණක් විය. තමන්ට දූ කුමරියක ලැබුණු බව අසා නොසතුටට පත් කොසොල් රජතුමන්ට කරුණු පහදා දුන් බුදුරජාණන් වහන්සේ සමහර ස්ත්‍රීන් පුරුෂ පක්ෂයටද වඩා ශ්‍රේෂ්ඨ වන බවත් සිල්වත්, ගුණවත්, නැණවත් වන බවත් ඇතැම් විට රාජ්‍යත්වයට පවා පත්විය හැකි බවත් පෙන්වා දුන්හ.

එදා කිසිම ආගමික නිදහසක් නැතිව සිටි කාන්තාවන්ට පින් දහම් කර ගැනීමට ඉඩ සලසා දුන් උන්වහන්සේ වනිතා පක්ෂය විසින් පුජා කරන ලද ආරාම පවා භාර ගත්තේය. මෙහෙණි සස්න පිහිටු වීම මේ කාන්තා විමුක්ති ව්‍යාපාරයේ අග්‍රගණ්‍ය වූ අවස්ථාව හැටියට හැඳින්විය හැකිය.

කොතරම් නරක වැඩ කළ අයෙකු වුවද යහමගට ගත හැකිය යන්න බුදුන් වහන්සේ තම ආදර්ශයන් තුළින් පෙන්වා දුන්හ. මිණීමරුවන්, ගණිකාවන්, සොරුන්, යක්ෂයන් වැනි අය පවා යහමගට ගත් උන්වහන්සේ යම් වරදක් කරන්නා සදාකාලික වරදකරුවකු නොවන බවත් ඔහුට යහමග පෙන්වාදී අවවාද අනුශාසනා කිරීමෙන් යහපත් උතුම් පුද්ගලයෙකු බවට පත්කර ගත හැකි බවත් පෙන්වා දුන්හ.

දැහැමි නොවන ජීවන මාර්ගවල නියුතු වන්නත් තම දියුණුවක් බලාපොරොත්තු නොවිය යුතු බවත් වෛරය අවෛරයෙන් ජයගත යුතු බවත් ක්‍රෝධය අක්‍රෝධයෙන් පරාජය කළ යුතු බවත් උන්වහන්සේ පෙන්වා දුන්හ. මෙබඳු වූ ආකල්පමය වෙනසක් එදා සමාජය තුළ ඇති කරමින් තමන් වහන්ස්ගේ ද තම ශ්‍රාවක සමාජයෙහි ද ආදර්ශය තුළින් තම අවවාද ආදර්ශවත් කරමින් බුදුන් වහන්සේ විසින් ක්‍රියාත්මක කරන ලද මහා සමාජ සංශෝධනය අති ශ්‍රේෂ්ඨය.

සමාජ සේවාවෙන් ද හැමවිටම අග්‍රප්‍රාප්ත වූ උන්වහන්සේ අසරණයන්ට පිහිටවීම මෙන්ම ගිලානෝපස්ථානයද මහා පුණ්‍යකර්මයක් බව පෙන්වා දුන්හ. ජරාවට පත්වීම නිසා පරාර්ථ චර්යාවේ හැසිරෙන භික්ෂු සමාජයෙන් පවා කොන් කරන ලද මුළුමහත් ශරීරයම වණවී ගිය පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ වෙත වැඩම කළ ගෞතම බුදුරජාණන් වහන්සේ සියතින්ම ඒ භික්ෂූන් වහන්සේට උපස්ථාන කළ සේක. ගිලානෝපස්ථානයේ අගය භික්ෂූන් වහන්සේලාට පෙන්වා දුන් උන්වහන්සේ යමෙක් ගිලනුන්ට උපස්ථාන කරන්නේද එය තමන්ට කරන උපස්ථානයක් හැටියට පෙන්වා දී **"යෝ ගිලානං උපට්ඨහෙය්‍ය සො මං උපට්ඨහෙය්‍යාති"** යනුවෙන් වදාළහ.

දෘෂ්ඨ කෞතුකාගාරයක් වැනි වූ බුද්ධ කාලීන ඉන්දියාවේ ෂට් ශාස්තෘවරුන් ප්‍රධාන වූ විවිධ ආගමික විශ්වාසවල එල්බගත් විශාල පිරිසක් විවිධ විමුක්ති දර්ශන ඉදිරිපත් කරමින් කල් ගෙවූහ. විශාල වශයෙන් අනුගාමිකයන් මෙන්ම අනුග්‍රාහකයන් ද සිටි මේ විමුක්තිවාදීන් මෙල්ල කිරීමට කාහට වුවද එතරම් පහසු කටයුත්තක් නොවීය. එහෙත් බුදුරජාණන් වහන්සේ අනුගමනය කල සර්ව සාරධාරණ ක්‍රියා පිළිවෙත් නිසා සත්‍යය කුමක්දැයි පිළිගැනීමට ඔවුනට සිදුවිය. බෞද්ධ දර්ශනයේ තිබූ ආකර්ශණීය තර්කානුකූලත්වය ලෙහෙසියෙන් පහසුවෙන් බිඳ දැමීමට හැකියාවක් අන් කිසිම දර්ශනයකට නොවිය. එසේම බුදුන්වහන්සේ කිසිවිටෙකත් ප්‍රතිවිරුද්ධ අදහස්වලින් කලබලයට පත් නොවූ අතර වඩාත් උපශාන්ත ලෙස මිථ්‍යා සංකල්පවල මිථ්‍යාව මැනවින් පහදා දුන්නේය. තමන් ඉදිරිපත් කරන දහම් කරුණු ගැන යම් සැකයක් ඇත්නම් එය නිසැක කර ගැනීමට ඕනෑම අයෙකුට අවස්ථාව ලැබිණ. ශ්‍රාවක භික්ෂූන් වහන්සේලාට පවා තම ධර්ම මාර්ගය සම්බන්ධයෙන් යම් සැකයක්

විමතියක් ඇතිනම් එය අප්‍රමාදව විමසන ලෙස නොයෙක් විට දන්වා ඇත.

රජගහනුවර විසූ සභිය නම් පරිබ්‍රාජකයා තමන්ට නිරවුල්කර ගැනීමට තිබූ එක්තරා ගැටළුවක් නිරාකරණය කර ගැනීමට විවිධ ශාස්තෘවරුන් කරා ගියේය. එම ප්‍රශ්න ඉදිරිපත් කිරීමටවත් ඔහුට අවස්ථාවක් නොලැබිණ. තථාගතයන් වෙත පැමිණි සභිය තම ගැටළුව උන්වහන්සේට දන්වා නිරාකරණය කරගත්තේය. අවසානයේදී බුදුරජාණන් වහන්සේ වෙතින් බණ අසා ප්‍රව්‍රජ්‍යාව ලබා අරහත් භාවයට පත්විය.

වාදකොට අන්‍යලබ්ධිකයන් පරාජය කිරීමේ සමතෙකු හැටියට එකල නම් දරා සිටි සච්චක නම් පණ්ඩිවරයා බුදුන් හමුවීමට පැමිණියේ වාද කොට උන්වහන්සේ පරාජය කිරීමටය.

රූප වේදනා ආදී පංචස්කන්ධය ආත්මය හැටියට පිළිගන්නා බව සච්චක පණ්ඩිවරයාගේ මතය විය. එය ආත්මය හැටියට සලකන්නේ නම් රූප වේදනා ආදිය කෙරෙහි ඔබගේ බලය පවත්වා ඔබට කැමති අයුරින් පාලනය කළ හැකි දැයි බුදුන් ඇසූ පැනයට සච්චකයාට පිළිතුරු නැතිවිය.

විෂම මිනිසුන්, දෙවියන්, බඹුන් පමණක් නොව තිරිසන් සතුන්ද බුදුරජාණන් වහන්සේ විසින් දමනය කරන ලද්දේ කාරුණික වචනයෙන් හා ස්ථානෝචිත නිවැරදි ක්‍රියා පිළිවෙත් මගිනි. පුරිස ධම්ම සාරථි යන නාමයෙන් උන්වහන්සේට ගෞරව කරනු ලබන්නේ එම ගුණය නිසාය.

බුදුන් වහන්සේ හැමවිටම තමනට විරුද්ධවාදිකම් කළ අය කෙරෙහි නොකිපුණු සේක. ද්වේශ නොකළ සේක. තමන් කෙරෙහි එල්ල වූ නින්දා, පරිභව, හිංසා, පීඩා ආදිය සම සිතින් ඉවසීම බුදු සිරිත විය. අන්‍යයන් යහමගට ගැනීමට ක්‍රියාකිරීමේදී උන්වහන්සේට නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය. එබඳු අවස්ථාවලදී උන්වහන්සේ තුළ පැවති අනුපමේය වූ ඉවසීමේ ගුණය පුදුම සහගතය.

හැමවිටම බුදුන්ට හතුරුකම් කළ දෙව්දත් තෙර එක් අවස්ථාවක සංඝයාගේ පාලනය තමන්වෙත පවරාදෙන ලෙස බුදුන්ගෙන් ඉල්ලා සිටියේය. මහා සංඝයා වහන්සේ තමන් විසින්ම පාලනය කරනු ලබන පිරිසක් හෙයින් ඒ සඳහා වෙනම පාලකයෙකු අවශ්‍ය නොවන බවත් දෙව්දත්තෙර වැනි කෙනෙකු සංඝයාගේ පලනය ලබාදීමට සුදුසු පුද්ගලයෙකු නොවන බවත් බුදුන් වහන්සේගේ නිගමනය විය. මෙහිදී බුදුන් සමඟ බලවත්සේ අමනාප වූ දෙව්දත් තෙර බිම්බිසාර රජුගේ පුත් අජාසත්ත කුමරුන් පහදවාගෙන බුදුන් වහන්සේ වනසා දැමීමට නොයෙකුත් උපක්‍රම යෙදවිය. බුදුන් මරා දැමීම සඳහා දුනුවායන් යෙදවීම, හිසමතට ගලක් පෙරළීම, නාලාගිරි හස්තිය මෙහෙයවීම ආදී මේ සියලු විරුද්ධවාදිකම් ඉවසා දරාගත් බුදුරජාණන් වහන්සේ තම අනුගාමිකයන්ටවත් දෙව්දත් තෙරුන්ගෙන් පළිගැනීමට ඉඩක් ලබා දුන්නේ නැත.

රූප සම්පත්තියෙන් අගතැන්පත්ව සිටි මාගන්දිය නම් වූ බැමිණිය බුදුන් හා විවාහ වීමේ තම අදහස් ඉටුනොවූ හෙයින් ද තම අලංකාරවත් ශරීරය අසූචිවලින් පිරුණු බඳුනකට උපමා කළා යැයි ද උන්වහන්සේ කෙරෙහි මහත්සේ වෛර බැඳ සිටියාය. පසු කලෙක කොසොල් නුවර උදේනි රජුගේ අගමෙහෙසිය වූ ඇය නගරයේ දූර්තයන් යොදවා බුදුරජාණන් වහන්සේට මහත්සේ නින්දා අපහාස කරවිය. අනඳ හිමියන්, මිනිසුන්ගේ නින්දා අපහාස විඳ දරාගැනීමට නොහැකි වූ තැන ස්වාමීනි අපි මේ නගරය හැර යමුයි බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියද, යුද වැදුණු හස්ති රාජයෙකු හීපහරවල් විඳ දරාගන්නාක් මෙන් දුසිල් දුර්ජනයන්ගේ නින්දා බස්ද විඳදරා ගනිමුයි බුදුන් වහන්සේ වදාළ සේක.

එක් දිනක් සුප්පිය නම් වූ පරිබ්‍රාජකයා බුදුන් වහන්සේටත් උන්වහන්සේගේ ධර්මයටත් සංඝයා වහන්සේටත් ආක්‍රෝෂ පරිභව කරමින් අධන්මගට පිළිපන් බුදුන් පසු පසින්ම ගමන් කරන්නට පටන් ගත්තේය. සංඝයා වහන්සේ විසින් මේ බව බුදුන් වහන්සේට දන්වා සිටින ලද අතර උන්වහන්සේ වදාළේ මේ සම්බන්ධයෙන් අප කෝප නොවිය යුතු බවත් වෛර නොකළ යුතු බවත් එසේ කළ විට ඉන් දිස් වන්නේ අපගේම නොඉවසීම බවත් අප තුළ ඇති අසහනය බවත් උන්වහන්සේ පෙන්වා දුන්හ. තමන් මෙන් ඉවසීමේ ගුණය මනා ලෙස පුරුදු පුහුණු කරන්නා ලෙස බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් ද ඉල්ලා සිටියහ.

අටලෝ දහමින් කම්පාවට පත් නොවීම බුදුන් වහන්සේ තුළ පැවති වටිනා ගුණ ධර්මයකි. බුදුරජුන් තුළ පැවති

තාදී ගුණය හැටියට හඳුන්වා දී ඇති මේ ගුණය මංගල කාරණයක් හැටියටද පෙන්වාදී තිබේ. පරාර්ථචර්යාව සඳහා කැපවීමෙනේ ක්‍රියා කරන කාහට වුවද අන්‍යයන්ගේ ඇණුම් බැණුම් දොස් බස් අසන්නට සිදුවීම නොවැලැක්විය හැකිය. රහසින්වත් වරදක් නොකළ බුදුන් වහන්සේට බොරු චෝදනා නින්දා අපහාස කිරීමෙන් විරුද්ධවාදීන් බලාපොරොත්තු වූයේ උන්වහන්සේගෙන් ලොවට සිදු වූ අමිල සේවය නවතාලීමය. බුදු දහම සීඝ්‍රයෙන් පැතිරයාම නිසා ද අන්‍යලබ්ධිකයන්ගේ ලාභ සත්කාර පිරිස් බලය අඩුවීම නිසා ද එකල බුදුන් වහන්සේට එරෙහිව යම් යම් ව්‍යාපාර දියත්වීම සිදුවූ බව පෙනේ. තීර්ථකයන් විසින් සුන්දරී පරිබ්‍රාජිකාව, චිංචි මානවිකාව ආදී කාන්තාවන් මෙහෙයවා සිදුකළ අපහාස කිරීම් වලදී බුදුන් වහන්සේ කොතරම් නිදොස් වුවද යම් යම් අභියෝග වලට උන්වහන්සේට ද මුහුණ දීමට සිදුවිය. එහෙත් උන්වහන්සේ එයින් කම්පාවට පත්වූයේ නැත. අටලෝ දහමින් උද්දාමයට හෝ කම්පාවට පත් නොවී නොසැලී සිටීම උන්වහන්සේ තුළ පැවති ශ්‍රේෂ්ඨ ගුණාංගයකි.

අන්‍යලබ්ධිකයන් කොතරම් විරුද්ධවාදී ව්‍යාපාර දියත් කළද ඔවුන් කෙරෙහි බුදුරජාණන් වහන්සේ තුළ පැවතුණේ සහජීවන ප්‍රතිපදාවකි. අන්‍යාගමික ශාස්තෘවරුන් හා අනුගාමිකයන් සමඟ අනවශ්‍ය ගැටුම් ඇතිකර නොගනිමින් අසාධාරණ විවේචන නොකරමින් ඔවුන් සමඟ සහජීවනයෙන් කටයුතු කිරීම උන්වහන්සේගේ සිරිත විය. බුදුන්වහන්සේ තම චාරිකාවලදී හමුවන අන්‍යාගමික නායකයන්ගේ පූජ්‍යස්ථානවලටද ගොඩවැදී ඔවුන්ගේ සුවදුක් කථා කිරීම සිරිතක් කරගෙන සිටි බව ත්‍රිපිටකයේ එන කථා ප්‍රවෘත්තිවල සඳහන් වේ.

භාරතයේ ඇතැම් ආගමික ශාස්තෘවරුන් එකම ස්ථානයකට එක්රැස්වී ඔවුන් මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත් වූ අවස්ථා ගැන සූත්‍ර පිටකයේ සඳහන් වෙයි. ඇතැම්විට බුදුරජාණන් වහන්සේ ද එම සමයප්පවාදක ශාලාවලට වැඩම කොට තම අදහස් ඉදිරිපත් කළ අවස්ථා ගැනද එහි සඳහන් වෙයි.

ඇතැම් පරිබ්‍රාජකයන් තම ආරාමවලට බුදුන්වහන්සේ වැඩම කරවා ගැනීමට මහත්සේ උනන්දු බව පෙනේ. පොට්ඨපාද නැමති පරිබ්‍රාජකයා ඇතැම් ගැඹුරු දහම් කරුණු ගැන තර්ක විතර්ක ඉදිරිපත් වූ අවස්ථාවලදී ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මෙතැන වැඩ සිටියේ නම් ඉතා මැනවැයි ප්‍රකාශ කළ අවස්ථා ද ඇත.

බුදුන් වහන්සේ අන්‍යාගමික මධ්‍යස්ථානවලට වැඩම කලේ ඔවුන් තම දහමට හරවා ගැනීමට නොවන බවත් ආගමික සහජීවනය සඳහා බවත් නොයෙක් විට පැහැදිළි වෙයි. දීඝ නිකායේ උදුම්බරික සීහනාද සූත්‍රයේ එන නිග්‍රෝධ නම් පරිබ්‍රාජකයා පිළිබඳ කථා පුවතත් ජෛන මහා වීරයන්ගේ අනුගාමිකයෙකු වූ උපාලි ගෘහපතියා පිළිබඳ කථා පුවතත් මෙයට නිදසුන් හැටියට ඉදිරිපත් කළ හැකිය. උපාලි නැමති ජෛන ශ්‍රාවකයා බුදුන්ගේ කර්ම සංකල්පය වැරදි බව පෙන්වීමට බුදුන් වෙත පැමිණ බණ අසා බෞද්ධ ශ්‍රාවකයෙකු වීමට කැමැත්ත ප්‍රකාශ කළේය. උපාලි වැනි ප්‍රසිද්ධ පුද්ගලයන් ඉක්මන් තීරණ නොගත යුතු බවත් ඒ පිළිබඳව තව දුරටත් සිතා බලන ලෙසත් බුදුන් වහන්සේ ඔහුගෙන් ඉල්ලා සිටියහ. අනතුරුව උපාලි ගෘහපතියා විසින් තෙවරක්ම කරන ලද බලවත් ඉල්ලීම නිසා ඔහුට බෞද්ධ ශ්‍රාවකයෙකු වීමට අවසර ලබා දුන්නේ ඔහුගේ පැරණි ශාස්තෘවරයාට දක්වන ලද ගරු සැලකිලි හා පුදසත්කාර නොඅඩුව දීමට හා පවත්වා ගෙන යන බවට පොරොන්දුවක් ද ලබා ගනිමිනි.

ආගමික සහජීවනය සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ විසින් අනුගමනය කරන ලද සර්වසාධාරණ ප්‍රතිපත්තිය මෙබඳු අවස්ථා වලදී අපට මැනවින් පසක් කරගත හැකිය.

ආගන්තුක සත්කාරය ඉතා උසස් ලෙස අනුගමනය කළ උන්වහන්සේ තමන් කරා පැමිණෙන අය ඉතා හොඳින් පිළිගෙන පිළිසඳරෙහි යෙදෙන සුහදශීලී බව පොක්ඛරසාති බ්‍රාහ්මණයා පිළිබඳ කථාවෙන් පැහැදිළි වෙයි. තමන් ආගන්තුකයෙකු වශයෙන් වෙනත් ස්ථානයකට ගිය විටදී ඉතාම ආචාර සම්පන්නව ක්‍රියා කිරීම උන්වහන්සේගේ සිරිත විය. අන්‍යයන්ගේ වැඩවලට බාධා නොකිරීමද අනවශ්‍ය ශබ්ද කිරීම් හා ඝෝෂා කිරීම් වලට ඉඩ නොතැබීමද උන්වහන්සේ භික්ෂු සංඝයා වහන්සේලාට පවා නිරන්තරයෙන් අවවාද අනුශාසනා කරන ලද චාරිත්‍රයකි.

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ ආගමික ශාස්තෘවරුන් අතර ශ්‍රේෂ්ඨතම මාර්ගෝපදේශකයා

හැටියට හඳුන්වාදිය හැකිය. තම අනුගාමිකයන් විශාල පිරිසකට නායකත්වය දීමට ඔවුන් පාලනය කිරීමට උන්වහන්සේට අවශ්‍යතාවක් නොවිය. දෙව්දත් තෙරුන් සංඝයාගේ පාලනය තමන්ට භාරදෙන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේදී බුදුන් වදාළේ මහා සංඝයා වහන්සේ තමන් විසින්ම පාලනය කරගනු ලබන පිරිසක් බවය. එවන් උදාර නායකයෙකුගේ ගති ලක්ෂණ බුද්ධ චරිතය පුරාවටම දක්නට ලැබෙන බව කිව යුතුය.

බුදු සිරිතෙන් ප්‍රකට වන්නේ සැබෑ නායකයා අනුගාමිකයන්ට ආදර්ශයක් විය යුතු බවයි. ගව රැලක ප්‍රධාන ගවයා ඇදට යන විට ඌ පසුපස යන අනෙක් ගවයන් ද ඇදට ගමන් කරන බව බුදුන් වහන්සේ විසින්ම පෙන්වා දෙන ලද කරුණකි. බුදුන් වහන්සේට ප්‍රසිද්ධියේ එක් ජීවිතයකුත් අප්‍රසිද්ධියේ තව ජීවිතයකුත් තිබුණේ නැත. එසේ තිබේ දැයි සොයා බලන ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන්ම ඉල්ලා සිටියහ. සුචරිතවත් බව උන්වහන්සේගේ උසස්ම ගුණාංගයකි. බුදුරදුන්ගේ නිර්මල චරිතය නොයෙකුත් උපක්‍රමවලින් වනසා දැමීමට තැත්කළ අයටද එසේ කළ නොහැකි වූයේ බුද්ධ චරිතයේ තිබූ පාරිශුද්ධත්වය නිසාය. බුදුරදුන් සියලු සත්වයන්ටම සකල මනුෂ්‍ය වර්ගයාටම දැක්වූයේ එකම මෛත්‍රියයි. ඇණුම් බැණුම් නින්දා අපහාස පමණක් නොව ශීත, උෂ්ණ, සාපිපාස, ලෙඩදුක් හැම දේකටම අකම්පිතව ඉවසීමේ හැකියාව තථාගතයන් වහන්සේට තිබුණි.

තම අනුගාමිකයන් ගැන වුවද සානුකම්පිකව සොයා බැලීම උන්වහන්සේගේ සිරිත විය. සංඝයා වහන්සේට පනවන ලද විනය නීති රීති පවා ලිහිල් කිරීමට උන්වහන්සේ පෙළඹුණේ මේ සානුකම්පික බව නිසාය. වරක් භික්ෂු සංඝයා වහන්සේට විරුද්ධව බොරු චෝදනා එල්ල කරන ලද අවස්ථාවේදී නිහඬව නොසිට කරුණු පැහැදිලි කර දිය යුතු යැයි වදාළේ තම අනුගාමිකයන් ආරක්ෂා කර ගැනීම සඳහාය.

නම්‍යශීලීභාවයද බුදුන්වහන්සේ තුළ පැවති වටිනා ගුණධර්මයකි. දෙමාපියන්ගේ අවසරයක් නොමැතිව කුළ දරුවන් පැවිදි නොකරන ලෙස සුද්ධෝදන රජතුමා කළ ඉල්ලීමට ඇහුම්කන් දුන් ආකාරයෙන් මේ ගුණය පැහැදිලි වෙයි. දැඩි තීරණ වල පිහිටා නොසිට සාධාරණ ඉල්ලීම් වලට ඇහුම්කන්දීම නායකත්වයක වටිනා ගුණයකි.

බුදුන් වහන්සේ හැම විටම ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමේදී ඒ ප්‍රශ්නය හොඳින් තේරුම්ගෙන එයට ලබා දිය හැකි හොඳම විසඳුම ලබාදුන් උතුමෙකි. එක් අවස්ථාවකදී මාලුංක්‍යපුත්ත නම් භික්ෂු නමක් බුදුන් වෙත පැමිණ යම් අධිභෞතික ගැටළු කීපයකට වහාම පිළිතුරු ඉල්ලා ඒවාට පිළිතුරු නොදුන්නොත් තමන් සසුන හැර යන බව ප්‍රකාශ කළේය.

ලෝකය ශාස්වතද, අශාස්වතද ලෝකය අන්තවත්ද, අනන්තවත්ද ජීවය හා ශරීරය දෙකක්ද, එකක් ද ආදී මේ වැඩකට නැති ප්‍රශ්නවලට කාලය නාස්ති නොකරන ලෙස බුදුන් වහන්සේ එම භික්ෂුවට පැවසූහ.

කිසිම අධි ස්වභාවික බලවේගයක පිහිට නොලබා තම වීර්යය ප්‍රඥාව මතම පිහිටා බුද්ධත්වය අවබෝධ කරගත් බුදුන් වහන්සේ ප්‍රාතිහාර්යය දැක්වීම ගැනද උනන්දු නොවූහ. බුදු කෙනෙකුට පමණක් දැක්විය හැකි යමක මහා ප්‍රාතිහාර්යය දක්වා ඇත්තේ අතිශයින්ම සීමාසහිතවය. ලොව මුල්වරට වහල් මෙහෙය නවතාලු උන්වහන්සේ සතුන් මරා යාග හෝම කිරීම නවතා දැමූහ.

තම දෛනික ජීවිතය පවා සැලසුම්කොට කාල සටහනකට අනුව ක්‍රියා කිරීම උන්වහන්සේගේ සිරිත විය.

මේ සියලු කරුණු අනුව සලකා බලන විට ලෝක ඉතිහාසයේ මෙතෙක් ලොව පහළ වූ අසහාය ආගමික ශාස්තෲවරයා බුදුරජාණන් වහන්සේය. දේවාතිදේව, ශාක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම ආදි අනේකවිධ නම් උන්වහන්සේට පට බැඳ තිබෙන්නේ උන්වහන්සේ තුළ පැවති අපරිමිත ගුණ කඳම්බය නිසාය. එහෙත් සියලු ආශ්‍රවයන් ප්‍රහීණ කළ මනුෂ්‍යයෙකු වශයෙන් තමන් හඳුන්වාදුන් උන්වහන්සේ හැමවිටම මනුෂ්‍යයෙකු හැටියටම ක්‍රියා කළහ. මිනිසෙකු වශයෙන් ඉපිද මිනිස් ආත්ම භාවයක් ලැබීමේ දුර්ලභකම ලොවට කියා දුන් උන්වහන්සේ බුද්ධත්වයේ සිට පිරිනිර්වාණය දක්වාම අති උදාර මිනිස් ගති පැවතුම් තම ආදර්ශයෙන් ලොවට පෙන්වා දුන්සේක.

**ධර්මසේන රස්සාපාන**



# ජීවිතය නම් ගලායන ගංගාවකි

ගලන ගඟක එහි රිද්මයක් තිබේ. ගංගාවක් විටෙක ගල්බොරලු හා ගල්පර්වත අතුරින් ගලා යයි. තවත් විටෙක වේගයෙන් ගලාගොස් පහතට ඇද වැටෙයි. සුමුදු වැලිතලා මතින් මෙන්ම කටුරොඩු අතරින් ද ගලා යේ. කෙනෙක් කිරිමුසු ජලය වත්කරයි. තවත් අයෙක් අපවිත්‍ර දෑ වත්කරයි. මේ සියල්ලම විඳ දරාගෙන ගංගාව ගලා යයි.

මනුෂ්‍ය ජීවිතයක් අටලෝ දහමට මුහුණපායි. විටෙක "මගේ සිත පිරුණා" කියමින් බලාපොරොත්තු ඉටුකරගෙන සතුටු වෙයි. තවත් විටෙක "සිත රිදුනා" කියමින් බලාපොරොත්තු කඩ වී හඬයි. ලාභ අලාභ යනුවෙන් බුදුදහම තුළ මෙය විස්තර කරයි.

තරුණ දරුවනේ, ජීවිතය සිතන පතන සියලුම බලාපොරොත්තු කඩවීම්වලට විවිධ ආකාරයෙන් හැම කෙනෙකුටම මුහුණ දෙන්නට වේවි. "ඇයි දෙයියනේ, මට පමණක් මේ දුක් කරදර" කියා හඬන්න, ළතැවෙන්න එපා. විභාගය, රැකියාව, ගෙවල් දොරවල් හා යාන වාහන ආදී බොහෝ දෑ පිළිබඳ බලාපොරොත්තු ඔබගේ සිත තුළ පවතීවි. මේවා ඉටුකර ගන්නට දැඩි උත්සාහයත්, අධිෂ්ඨානය හා අරමුණ ඉටුවෙන තෙක් ක්‍රියා කිරීමේ ශක්තියක් ඔබ ඇතිකර ගන්නට ඕන.

එහෙත් මේ අරමුණු ඉටු කරගන්නට ඕන ධාර්මික බව නම් කිසිවිටෙකත් අමතක කරන්න එපා. සමහර තරුණ දරුවෝ සිතනවා, "මේවා හොඳින් බැරිනම් නරකින් හෝ ඉටුකරගන්නට ඕන. එසේ නොමැති වුනොත් අපි පරදීවි." අධාර්මික මාර්ගය, ධාර්මික මාර්ගයට වඩා ඉක්මන් බව ඔබට පෙනේවි.

නමුත් අධාර්මික මාර්ගයට වැඩි ආයුෂ නැහැ. අනෙක් කරුණ නම් මම වැරදියි නම් වූ සිතුවිල්ල නිතොර සිතට වද දේවි. මෙම මානසික වදය පසු කළෙක ලෙඩ දුක් පිණිසත්, තම පවුලටම කුමන අයුරකින් විපත් රැගෙන පැමිණෙන්නටත් බැරි නැහැ. විභාගය අසමත් වුනොත් හෝ විශ්ව විද්‍යාලයට යන්නට ළකුණු අඩු වුනොත් හෝ රැකියාවක සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වුනොත් ළතැවෙන්නට එපා. "මට ඔක්කෝම එපා වුණා" යි අධෛර්ය වෙන්නටත් එපා. ඇතිවෙච්ච අඩුපාඩුකම් නුවණින් සොයා බලා, අත්දැකීම් ඇති ගුරු, දෙමාපිය හෝ සුදුසු අයෙක් හා සාකච්ඡා කොට පෙරටත් වඩා ධෛර්යමත්ව ඉදිරිපත් වෙන්න.

ඒ අරමුණු ඉටුවුණත් නැතත් ඔබ ජීවත් වෙන්න ඕන. එහෙමනම් සිතූ දේ, පැතූ දේ හරියට ඉටු කරගන්න බැරිවුණායි කියමින් අනාගතය අඩාල වෙන්නට ඉඩදීම

යහපතක් නොවෙයි. පසුකාලෙක සමහර තරුණ දරුවෝ මෙහෙම කියනවා ඔබ අසා ඇත. "ඒක එහෙම වෙච්ච එක හොඳයි. අද මම මෙහෙම සතුටින් ඉන්නේ වෙච්ච වැරැද්දෙන් පාඩමක් ඉගෙන ගෙන." ලාභ අලාභ දෙකම එක සමානව පිළිගන්න කියමින් බොහෝ අය කියන බව හැබෑව. ඒත් එය සමාන්‍ය මනුෂ්‍යයන්ට පහසු නැහැ.

ඒ වුනත් අලාභයේදී හිත හදාගන්න පුළුවණි. මේ නිසා සුදුසුම දෙය නම් යම් බලාපොරොත්තුවක් ඇතිකර ගන්න කොට, යමක් සඳහා සැළසුම් කරන විට, මෙය ඉටු නොවුනොත්, මෙය වැරදී ගියොත්, මා ඊළඟට කළ යුත්තේ කුමක්දැයි සිතින් සැළසුම් කරගන්න. ඔබට අත්දැකීම් ඇති එහෙම නැතිනම් ඔබ මෙය අසා ඇති. සෑම ගුවන් යානයක්ම, එය ගුවන් ගතවෙන්නට ප්‍රථම, හදිසි අනතුරකදී පිළිපැදිය යුතු පිළිවෙල හා ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග විස්තර කරදෙයි. එවැනි අනතුරක් සිදුවන්නේ කලාතුරකින් බව අපි දනිමු. එහෙත් පෙර ආරක්ෂාවක් ලෙස එසේ කරති. ඔබගේ ජීවිතයේත්, විශේෂයෙන් ජීවිතයට තදින් බලපාන ක්‍රියාවන්හිදී, එය ඉටුනොවුනොත්, ඊළඟ පියවර කුමක් වන්නේදැයි සිතා බලන්න.

අයස, යස, නින්දා, ප්‍රශංසා හා සැප දුක් ආදී මේවාත් සෑම ජීවිතයකටම උරුම වූ පොදු ධර්මතා බව සිතන්න. ප්‍රශංසා ඉදිරියේ පෘථග්ජන ඕනෑම අයෙක් කිසියම් සතුටක් සිතේ ඇතිකර ගනී. එහෙත් එය මානයක් බවට පත්වී "උඩඟු" හා "අහංකාර" සිතක් බවට පත්නොකර ගෙන නිහතමානී වෙන්නට පුළුවණි නම්, එහි පෙනෙන්නේ ගුණවත් මනුෂ්‍යයකුගේ ලක්ෂණයි. තරුණ දරුවනේ, සමහර අය ගැන මෙහෙම කියනවා ඔබ අසා ඇති. "එයා මමත් එක්ක එක පන්තියේ හිටියේ. කෑවේ බිව්වේ එකට. හැබැයි තනතුරු ලැබිලා හරි ගියාම අපි හඳුනන්නේ නැහැ වගේ ඉන්නේ. හරි පුදුමයි." එවැනි වචන වලින් කියවෙන්නේ මනුස්සකමේ හොඳ ගුණයක් නම් නෙමෙයි. අපි මැරෙනවා එය මොන වෙලාවේද කියන්න බැහැ. එහෙමනම්, ඇයි මේ නොමිනිස්කම්? තරුණ වයසෙහි දී විශේෂයෙන් සිතිය යුතු කරුණු කිහිපයක් මම මෙහි සඳහන් කරමි.

**"හා යොබ්බනා ජජරා අන්තා"**
අහෝ, සියලු තරුණකම් ජරාව හා මහළු බව සමඟින් අවසන් වෙයි.

**"හා සංයෝග වියෝගන්තා"**
අහෝ, සියලු හමුවීම් වෙන්වීමකින් කෙළවර වේ.

**"හා පියා සෝක අන්තකා"**
අහෝ, සියලු ප්‍රේමයන් හා ආදරයන් ශෝකයකින් හා වේදනාවකින්ම කෙළෙවර වේ.

**"හා මතන්තා සජීවකා"**
අහෝ, සියලු ජීවිතයන් මරණයෙන් කෙළවර වේ.

මේවා ජීවිත ගමනේ සත්‍ය ස්වභාවයයි. මෙය අපි හිතන්නේ දුකයි, දුකයි කියමින් හඬමින් සිටින්නට නොවෙයි. ජීවිතයේ යථාර්ථය තේරුම් ගන්නටයි.

තරුණ දරුවන් සමඟ අමනාපයෙන් නම් නොවෙයි මේ පවසන්නේ. සමහර තරුණ අය තරුණ වයසේදී ජීවිතයේ යථාර්ථය අමතක කරන්නට හදන බව පෙනෙයි. සමහර වෙලාවට වැඩිහිටි හා මහළු අයට "අවමන්" වචනවලින් කතා කරනවා ඔබත් අහලා ඇති. එවිට මට සිතෙන්නේ මේ අය මහළු වීමක්, ලෙඩ වෙන එකක් නැහැ කියලද හිතාගෙන ඉන්නේ යනුවෙනි. ඔවුන්ම කියන්නේ "හෙට මැරුණත් කමක් නැහැ අද.... කරලා". මේකද අපහසුවකින් ලබාගත්ත මනුස්ස ජීවිතේ තේරුම කියලා, ඔබටවත් සිතන්නේ නැතිද? ජීවිතය ක්‍රමයෙන් වියපත් වන විට තරුණ කාලය අමිහිරි මතකයක් නොවන්නට නම්, ඔබ තාරුණ්‍යය හැබෑ මනුස්සකමෙන් අලංකාර කර ගත යුතුයි. බුදුරදුන් රාහුල තෙරුන්ට පැවසූ මෙම අවවාද අදටත් කොපමණ අගනේද? ජලයෙන් පාඩමක් ඉගෙන ගන්න මිනිසුන් අපවිත්‍ර දෑ දැමුවත් කිරිමුසු දෑ වත්කළත්, ජලය අමනාපයකින් තොරව සියල්ල පිළිගනියි. ගින්න උපමාවට ගෙන පාඩමක් ඉගෙන ගන්න. කිසිදු වෙනසකින් තොරව සියල්ල පුළුස්සා දමයි. සුළඟ සුවඳ හෝ දුගඳ රැගෙන යයි.

ජලය සියල්ල ඉවසනවා මෙන් නින්දා, ප්‍රශංසා, හා කෙනෙකුගේ නපුරුකම් උපේක්ෂාවෙන් පිළිගන්නට ඔබටත් පුරුදුවෙන්නට හැකි නම් කොපමණ අගේද? ගින්න සියල්ල පුළුස්සා දමනවා වගේ වැරදි දෑ කොතැන තිබුණත්, තමන් කළත්, අනුන් කළත්, ඒවා ඉවත් කරන්න හැකිනම්, සුළඟ වෙනසක් නැතිව සුවඳත් දුඟදත් රැගෙන යනවා වගේ කාගේ වුනත් ගුණ නොමකා ගුණ සුවඳ රැගෙන යන්නට හැකි නම්, කාගේ නමුත් හොඳ ගුණ තමන්ගේ ජීවිතයෙනුත් දකින්නට පුළුවනි නම්, එය බුදුරදුන් මිනිස්කම ගැන දෙසූ ධර්මයම බව ඔබට නොවැටහේද?

**ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ**
(තාරුණ්‍යය සහ බුදුදහම පොතෙන් උපුටනයකි)

# අර්හත් තෙරණී චත වරුණ

ථෙරී ගාථාවල සඳහන් සෑම රහත් තෙරණියකගේම විස්තර බෙහෙවින්ම රසවත්ය. ගිහිවත බොහෝ විට හැගීම්බරය. දුක, ශෝකය, පීඩිතබව හා උපරිමයෙන් සැප විඳි රජ, සිටු, අන්තඃපුර, වෛශ්‍ය චරිතාපදානද කුලහීන, මෙහෙකාර, දුගී චර්තයන්හිද අත්දැකීම් වල විස්තර බොහෝය. එදවස නියෝජනය කළ සෑම වංශයකම කාන්තාවන් රහත් තෙරණී චත සම්පූර්ණ කිරීමට දායක වී ඇත.

සිදුහත් කුමරුන් සමඟ සිටි අන්තඃපුර, කාන්තාවන් බොහෝ සංඛ්‍යාවක් ථෙරී ගාථා තුළ අර්හත්ඵල ලබා ඇත. එකම නමින් රහත්මඟ වැඩි බොහෝමයක් චරිතද මෙහි සඳහන්වේ. නම් අප්‍රකට රහත් තෙරණීන් වහන්සේලාද මේ අතර වේ. බුදු වදන ශ්‍රවණයෙන් අනතුරුව සෝවාන්පත් වූ ඔවුනොවුනට විදසුන් හෝ කමටහන් වී ඇත්තේ තම ජීවිතයේ ලද සැප දුකෙහි ආදීනව හා අත්විඳි සිදුවීම් වේ. තම ජීවිතයේ දැඩි සේ කම්පනයට පත් සිදුවීම කමටහන් ලෙස ගෙන බුදු ඔවදනද ලැබ මහාප්‍රජාපති තෙරණියගේ මගපෙන්වීම ඇසුරු කර ගෙන රහත්ඵලය සම්පූර්ණ කර ඇත.

සමහර චරිතයන්හි විස්තර කෙටිය සමරහ චරිතයන්හී විස්තර දීර්ඝය. එම කෙටි හා දිගු විස්තර අනුව පද බැදෙන කවිද වෙනස්වේ. අපගේ නිවරණ පූරණය කර ගැනීමටද මෙම චරිත වර්ණනා අත්වැලක් වනු නියතය. මෙතැන් සිට කොටස් වශයෙන් තෙරණීවත වරුණ කවියට පබැදේ......

| | |
|---|---|
| බුදුවතට වශී වී සිත | අලවන්නී |
| බුදු වදනිනි අරමුණෙන් | මිදෙන්නී |
| ගිනි ගත් වලදෙහි පලා | දකින්නී |
| එය විදසුන් කොට නිවන් | ලබන්නී |
| ඇයයි **තේරිකා** තෙරණිය | වන්නී |

| | |
|---|---|
| තරුණ වියේදිම සසර | දකින්නී |
| ප්‍රජාපතිය ලඟ පැවිදි | ලබන්නී |
| රාහු වෙතින් සඳ මිදෙනු | දකින්නී |
| එය විදසුන් කොට නිවන් | ලබන්නී |
| ඇයයි **මුත්තා** තෙරණිය | වන්නී |

| | |
|---|---|
| තෙරුවණ කෙරෙහිම සිත් බැද | ගන්නී |
| වරද කුඩා වුව බිය | දක්වන්නී |
| පුන් පොහොයම කමටහනට | ගන්නී |
| නුවණින් මොහඳුර දුරුකර | ලන්නී |
| ඇයයි **පුණ්ණා** තෙරණිය | වන්නී |

| | |
|---|---|
| රජගෙයි අන්තඃපුර හැර | යන්නී |
| ප්‍රජාපතිය ලඟ පැවිදි | ලබන්නී |
| තිදොරම සංවර කරම | වසන්නී |
| එය විදසුන් කොට නිවන් | ලබන්නී |
| ඇයයි **තිස්සා** තෙරණිය | වන්නී |

| | |
|---|---|
| දිළිඳු බවේ පීඩා | විඳිමින්නී |
| කුදු බමුණකු වෙත බිරිඳක් | වන්නී |
| පිළෙන් පිළට මෙහෙවර කර | මින්නී |
| ගිහිගෙයි කරදර විදසුන් | ගන්නී |
| එයම නිමිතිකොට නිවන් | ලබන්නී |
| **අඤ්ඤතරා තිස්සා** ඇය | වන්නී |

| | |
|---|---|
| විශාකා සිටුවෙත සරණ | බැඳෙන්නී |
| සිටු සම්පත් නොඅඩුව ලැබ | ගන්නී |
| සිටුතුම ඉරියව් විමසා | ලන්නී |
| විශාක පෙන්වූ මගම | සොයන්නී |
| විරිය වඩා බව දුකින් | මිදෙන්නී |
| **ධම්ම දින්න** තෙරණිය ඇය | වන්නී |

| | |
|---|---|
| දහම් අසා අනගම් ලැබ | ගන්නී |
| කොසොල් රජුගෙ සොයුරිය ඇය | වන්නී |
| කෙලෙස් කසට ගිනි මුදා | හරින්නී |
| බුදු වදනට අවනතව | වෙසෙන්නී |
| රා ගිනි නැති සිත සන්සුන් | වන්නී |
| **සුමනා** තෙරණිය නම් | ලැබගන්නී |

**දයා හේවාගම**

අනුරාධපුර

# නිවමු - නිවෙමු



සීරුවෙන් සිටියමුදු මත්ව මද, මන්, රුවෙන්
මාරු වෙන් නට නොහැක කරගන්න ලද පවෙන්
පාරුවෙන් බුදුදහමෙ එගොඩ වෙන්නට බවෙන්
වාරුවෙන් හබල සති, පෙරට අපි යමු සුවෙන්

කොතැනක සිට පැමිණියෙද යන තැන නොදැන
දුක, සැප ලෙසට ගෙන බවයෙහි සැරිසරන
කරුමෙහි පලය විලසට, විටකදි තැවෙන
සදහම සුවය ගෙන දේ සිත පිරිමදින

රිදවෙන නමුත් කරමින් යහපත දියත
අපමණ දනන් ඇත යන මග සග සැපත
නුනුවණ කමින් පව්කම්වල යෙදි මහත
දුහුගුණ සතුන් සුගතිය වෙත යනු නොමැත

හිත වට වට කර නොයෙක් ගිණි කඳුලම වපුරයි
දුක පමණකි සසරෙ හිත කුසලෙහි අහුරයි
දෙසු දම අරි අටඟි මග නිවනට පහුරයි
තතු දත්තෝ නිතර බුදු ගුණය ම මතුරයි

හදවත පෙලන නො කැඩිය හැකි බැමීය
ලද සැපතක් නොමැත දුක නෙත තෙමීය
බවයට ඇති බැම්ම හිමි බිඳ දැමීය
සදහම අම ඔසුව හැම ගිණි නිමීය

තුන් ලෝ සතුන් වෙත අපමණ සෙත සෑදූ
නන් ලෙස ලොවේ මහ කරුණා ගුණ වීදූ
අන්දව තිබූ  නෙත් යුග නිවනට පෑදූ
වන්දන කරමි සම්මා සම්බුදු සාදූ

**වෛද්‍ය ඉන්ද්‍රාණී රත්නායක**



# ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රවර්ධනය

ලොව පුරා සිටින මිලියන අටසියයක් පමණ වූ ජනතාව අතර ප්‍රමුඛ ආගම් දහය අතරට ගැනෙන බුදු දහමේ ථෙරවාද සම්ප්‍රදායේ මූලස්ථානය ලෙස ගැනෙන ශ්‍රී ලංකාවට ක්‍රි.පූ. 307 දී ඉන්දියාවේ ධර්මාශෝක අධිරාජයාගේ පුත්‍ර රත්නය වූ මහා මහින්ද රහතන් වහන්සේ විසින් හඳුන්වා දීම නිසා බුදු දහම ප්‍රභව කොට හැදී වැඩුණු ව්‍යාප්ත වූ අධ්‍යාපනය බෞද්ධ අධ්‍යාපනය ලෙස අප හඳුන්වමු.

ඒ වන විටත් සක්‍රීයව පැවැති පණ්ඩුකාභය මහා රජු ආරම්භ කළ අනුරාධපුර (ක්‍රි.පූ. 437) යුගයේදී ලැබුණු මේ බුදු දහම නිසා ලේඛන කලාව, කැටයම් කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව, කෘෂිකර්මාන්තය, වාරි කර්මාන්තය හා බෞද්ධ අධ්‍යාපනය ආධ්‍යාත්මය මුල් කරගත් ඉගෙනීමක් ලෙස මුල් කාලයේදී ආරම්භ විය.

ආරණ්‍ය, රුක්ඛමූල, ගුහා, ගිරි ඇසුරින් ධර්මචාරිකාවේ යෙදුණු අතර වැසි කාලවල සෙනසුන්වල, කුටිවල ගෙවන්නට වූ අතර පසුව ජනතාව ආරණ්‍ය වලට පැමිණීමට පටන් ගැනීමත් සමඟ ස්ථිර වාසස්ථානයක් ලෙස ආරාම සැලකීමත් සමඟම නොයෙක් දේ ඉගෙනීමට ආරාම කරා මිනිසුන් පැමිණියහ.

මිහිඳු හිමියන් පැමිණීමෙන් පසු අනුරාධපුර රාජධානියේ මහා සීමාවන් සම්මත කොට එය ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත් කළහ. ථෙරවාදී බුදු දහමේ මූලස්ථානය එයම විය. මිහිඳු හිමියන් ධර්මය සරණ යාමට කැමැති වැඩි උනන්දුවක් ඇති පිරිස මහණ කරවිය. ඒ අනුව සිංහල සංඝ සමාජය ඇති විය. එදා අරිට්ඨ කුමරුගෙන් ඇරඹි ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය පමණක් නොව ලෝක බෞද්ධ සමාජය ඇරඹීමේදීත් මේ සිංහල සංඝ සමාජයෙන් සිදුවූ කාර්යභාරය අපමණය. මාස හයකට පසු තම නැගණිය හරහා ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලංකාවට ගෙන ඒමෙන් මහත් සංස්කෘතික විප්ලවයකට ලංකාව යොමු කරන්නක් විය. එතුමිය පැමිණ වසර 2567 ක් ගෙවී ගියද අදක් සිංහල බෞද්ධයාගේ මුදුන් මල්කඩ මේ ශ්‍රී මහා බෝධීන් වහන්සේමය.

මුල්ම බෞද්ධ අධ්‍යාපන ආයතනය බවට පත්වන්නේ මහා විහාරයයි. අනතුරුව අභයගිරිය හා ජේතවනාරාමය කරා ගමන් ගත් බව පෙනේ. මේ වන විට ලෝකයේ රටවල් ගණනාවකින් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අනුරාධපුරයට ශිෂ්‍යයන් පැමිණ සිටි බවට වංශකථා උපුටා දක්වයි. එදා පටන් 1505 පෘතුගීසීන්ගේ පැමිණීම දක්වා අඛණ්ඩව

ගලා ආ මෙම අධ්‍යාපන ක්‍රියාවලිය අද ඇති අධ්‍යාපන ක්‍රමයට වඩා වෙනස් සරල අධ්‍යාපන ක්‍රමයකි. එමගින් තත්කාලීන අවශ්‍යතා ඉටුකළ අතර සදාචාර සංවර්ධනයට මහඟු පිටුවහලක් විය. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ බලපෑම සටන් පැවතියද ලෞකික පරමාර්ථ හා ලෝකෝත්තර පරමාර්ථ උතුම් කොට සලකා අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට සිදු වූ බව පෙනේ. එම තරඟකාරී නොවූ ආත්මාර්ථකාමී නොවූ අධ්‍යාපන ක්‍රමය

1. ඉගෙනීම
2. ධාරනය
3. අභ්‍යාසය
4. විමංසනය

ලෙස ගොනු කළ හැක.

අද නොයෙක් අධ්‍යාපන විශාරදයන් විසින් විවිධ නම් වලින් හඳුන්වනු ලබන අධ්‍යාපන පරමාර්ථ ගොඩනැගී ඇත්තේ ඉහත ක්‍රම හතර මතය. එදා බෞද්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා කටයුතු කළ බෞද්ධ ධර්මධර, විනයධර මහා තෙරුන් වහන්සේලා විචාර බුද්ධියට දොර විවර කර දෙමින් තමන් නොදන්නා දේ දැනගත්තාහ. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වෙන උඩඟු නොවීම, ලද දෙයින් සතුටු වීම, කීකරුකම, සැහැල්ලු ජීවිතය, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, ඉඳුරන් සංවර කර ගැනීම, අවංකකම, නුවණැස පෑදීම වැනි මහඟු ගුණාංග බෞද්ධ අධ්‍යාපනයේ මූලිකම සංකල්පයයි.

අවුරුදු 70 පසු අනුරාධපුරයෙන් රාජ්‍යය පොළොන්නරුව කරා විතැන්වූ අතර රජවරු විසි දෙනෙක් පමණ එහි රජකම් කළ අතර අධ්‍යාපන, ආර්ථික, කලා නිර්මාණ, ආදී කර්මාන්ත වෙනත් රාජධානියකට නොදෙවෙනි ආකාරයේ පැවති බව ඉතිහාසය කියාදෙයි. පොත් ගුල් වෙහෙර ලෙස හඳුන්වන්නේ ආලාහන පිරිවෙනේ භික්ෂූන් වහන්සේලා උදෙසා පරාක්‍රමබාහු මහ රජතුමා ඉදිකළ පුස්තකාලයයි. පරාක්‍රමබාහු රජතුමාගේ පිළිරුවේද එතුමා පුස්කොළ පොතක් දරා සිටින බව පෙන්වයි. පොළොන්නරුවේ පැවති අෂ්ඨායතන ලෙස ප්‍රකට වන්නේ බෞද්ධ භික්ෂු අධ්‍යාපන ආයතන අටකි. මෙයින් ප්‍රකට වන්නේ අධ්‍යාපනය බැබලුණු යුගයක් ලෙසයි.

තුන්වන විජයබාහු රජුගෙන් පටන් ගත් දඹදෙණි රාජධානියේදී ධර්ම ශාස්ත්‍රීය වර්ධනය සඳහා ගමක් ගමක් පාසා ගොස් දක්ෂ ලේඛකයන් ලවා ග්‍රන්ථ රචනා කර දහම් අධ්‍යාපනය ජනතාව අතරට ගෙන යාමට රජු කටයුතු කළ අතර එමගින් විශාල උගතුන් ප්‍රමාණයක් බිහිවිය. ඔහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු රජු කව්සිළුමිණ, විසුද්ධි මාර්ග සන්නස, වනවිනිස සන්නස ග්‍රන්ථ රචනා කිරීම තුළින් ප්‍රකට වන්නේ එතුමා තුළ තිබූ උගත්කමයි. මගේ කාලයේ, පූජාවලිය, සිදත් සඟරාව, පාලි සමන්ත කූට වර්ණනාව, බේසජ්ජ මංජුසාව වැනි විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා වීම තුළ අපට කියාපාන්නේ පැවති අධ්‍යාපනයේ දියුණුවයි.

වසර 28 ක රජකාලයක් පැවැති යාපහුව රාජධානිය පළවෙනි බුවනෙකබාහුගෙන් ආරම්භ වූ අතර රජතුමා උගතුන් හා වියතුන් ලවා පොත පත රචනා කරවා අධ්‍යාපන කටයුතු නංවාලීය. ධර්මධර විනයධර භික්ෂූන් වහන්සේලාට ශාසනික පදවි පිරිනැමීම සිදුකරන ලදී.

සිංහල ථූපවංසය, අනාගත වංශය, සිංහල බෝධි වංශය, ධාතු මංජුසාව ග්‍රන්ථ හා බෞද්ධ ජනතාවගේ මහත් ගෞරවයට පාත්‍ර වූ පොත් වහන්සේ නිර්මාණය වූයේද කුරුණෑගල යුගයේදීය. හතරවෙනි පරාක්‍රමබාහු මේ යුගයේ කැපී පෙනෙන රජතුමෙකි.

හතරවන බුවනෙකබාහු රජු ගම්පොළ යුගයේදී ග්‍රාමවාසී හා වනවාසී භික්ෂූන් වහන්සේගේ ශාසන සංශෝධනයක් කරවා ධර්මධර විනයධර භික්ෂූන් නායකත්වයට පත් කරන ලද අතර විවිධ බාධක මධ්‍යයේ වුවද බොහෝ ආගමික මධ්‍යස්ථාන මුල් කර ගනිමින් බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කළහ.

සිංහල සාහිත්‍යය ස්වර්ණමය යුගය ලෙස සලකන කෝට්ටේ යුගයේදී විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා වූ අතර මෙකළ ෂඩ් භාෂා පරමේෂ්වර උපාධිලාභීන් පවා සිටීමෙන් පෙනෙන්නේ උගතුන්ගේ පාරාදීසයක් වූ බවයි. හයවන පරාක්‍රමබාහු රජු කළ තොටගමුවේ, කෑරගල, විදාගම පැපිලියානේ පිරිවෙන් ලෝක ප්‍රකට විය. ධර්ම ශාස්ත්‍රීය සංස්කෘතික පඬිවරු පවා ග්‍රන්ථ රචනා කරන ලදී. තායිලන්තයෙන්, මියන්මාරයෙන් ථෙරවාදී බුදු දහම හැදෑරීම සඳහා පැමිණීමෙන් පෙනී යන්නේ අධ්‍යාපනයේ නැගී සිටීමයි.

අවසාන රාජධානියසේ සැලකෙන මහනුවර සේනාසම්මත වික්‍රමබාහු රජුගෙන් ඇරඹිණි. පළමුවන විමලධර්ම සූරිය හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මෙහෙවර අගය කළ යුතුමය. වර්තමාන බෞද්ධ අධ්‍යාපනයේ තිඹිරි ගෙය වූයේ සඟරාජයාණන් වහන්සේමය. 1753 ස්ථාපිත කරන ලද උපසම්පදාව එයට මහත් පිටුවහලක් විය.

මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද මේ අධ්‍යාපන ක්‍රමය මහාවිහාරය හරහා ගමන් කරමින් ඈත ගම් දනව් කරා ව්‍යාප්ත විය. අටුවා කියන පරිදි රෝහණයේ ඈත පිටිසර ගම්මානවලද මේ අධ්‍යාපන ක්‍රමය පැළපදියම් වී තිබුණි. සෑම ගමකම පාහේ බණ මඩුව, ශාලාව ගමේ අධ්‍යාපනය හදාරන ස්ථානය බවට පත් විය. මේ බණ මඩුවෙන් පටන් ගත් අධ්‍යාපන ක්‍රමය සදාචාරාත්මක ශක්තිමත් එකක් විය. පුරවැසියා ශිෂ්ඨ බවට පත්වීම අධ්‍යාපනයේ විශිෂ්ට පරමාර්ථයකි. මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් වසර එකසිය තිහක් ගත වෙන විට මාතලේ අළු විහාරයේදී ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමට තරම් අධ්‍යාපන ක්‍රමය නිසා ග්‍රන්ථ කලාව දියුණු වී තිබිණි. මෙලෙස ප්‍රචලිතව තිබූ අධ්‍යාපන ක්‍රමය යම් යම් බිඳ වැටීම්වලට මුහුණ දෙමින් වුවද පැවති බව මහාවංශය මැනවින් කියා දෙයි. නිකාය වශයෙන්, ගුරුකුල වශයෙන්, ශාස්ත්‍රීය වශයෙන්, ආරාම වශයෙන් පමණක් නොව පක්ෂ වශයෙන්ද බෙදී ගිය බැවින් බෞද්ධ අධ්‍යාපනයේ මූලික අරමුණු වෙනුවට වෙනත් වෙනත් අරමුණු බලාපොරොත්තු පසුපස ගමන් කරන ආකාරයක් දැකිය හැක. සර්ව සංඝායනාව තුළින්ද බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට සිදු වූ කාර්ය භාරය විමර්ශනශීලීව අධ්‍යයනය කළ යුතුය. මන්ද එය ලාංකික බෞද්ධ අධ්‍යාපනය කෙරෙහි ප්‍රබල බලපෑමක් එක් කළ හැකි බැවිනි.

මහනුවර යුගයේදී රට විදේශිකයන් සතු වීමත් සමඟ අපේ ඒ තිබුණු දැනුම, අධ්‍යාපනය, ආධ්‍යාත්මය වෙනුවට මිෂනාරි අධ්‍යාපනයත්, ඇදහිලි ක්‍රමයත්, කෘරත්වයක් බලෙන් අප පිට පටවා ක්‍රම ක්‍රමයෙන් අපේ ජන ජීවිත විනාශය කරා ගෙන යන ලද අතර මෙයින් මහත් වේදනාවට පත් වැලිවිට මාහිමියන්, හික්කඩුවේ මාහිමියන් ආදී විද්වත් යතිවරුන් අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර, බටුවන්තුඩාවේ දේවරක්ඛිත වැනි දේශප්‍රේමී ජනතාව නිසා නැවතත් යම් ප්‍රමාණයකට අද දවසේ බෞද්ධ අධ්‍යාපනය පුණර්ජීවනය ලබා තිබේ.

“චරකභික්ඛවේ චාරිකා බහුජන සුඛා.....” බුද්ධ දේශනාව අනුව යමින් ලාංකික භික්ෂුවද ආරණ්‍ය, රුක්මුල් ඇසුරු කරමින් ධර්ම චාරිකාවේ යෙදුණු අතර පසුකාලීනව මේ කටයුත්ත ධර්මශාලා වටා ගොඩ නැගුණි. වර්තමානයේ ගුවන් විදුලියටත්, රූපවාහිනියටත් වඩා තමන්ට අවශ්‍ය වේලාවක නිවාඩු වෙලාවක තමන්ට අවශ්‍ය ධර්ම කරුණු දැන ගැනීමට, ශ්‍රවණය කිරීමට ඒ තුළින් ඥානාභිවර්ධනය ඇති කර ගැනීමට ලෝකයේ කොතැනක හෝ සිදුවන ධර්ම දේශනා, ධර්ම ප්‍රචාරය පිංකමක් ක්ෂණයකින් ලොව පුරා බෙදා හැරීමට සමාජ මාධ්‍යකරුවන් කටයුතු කරමින් සිටී.

කෙසේ වෙතත් එවකට සිටි භික්ෂු සංස්ථාව අද වන විට නිකාය වශයෙන්, ගුරුකුල වශයෙන්, ථෙරවාදී මහායාන වශයෙන්, ශාස්ත්‍රීය හා ඉර්ෂීය වශයෙන් පමණක් නොව ආරාම, පක්ෂ හා සංවිධාන වශයෙන් ද බෙදී ගොස් ඇත. මූලික අරමුණ වෙනුවට වෙනත් වෙනත් අරමුණු බලාපොරොත්තු පසුපස ගමන් කරන ආකාරය දැකිය හැක.

ධර්ම සංඝායනා තුළින් ද බෞද්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා සිදු වූ කාර්ය භාරය විමර්ශනශීලිව අධ්‍යයනය කළ යුතුය. මන්ද එය ලාංකික බෞද්ධ අධ්‍යාපනය කෙරෙහි ප්‍රබල බලපෑමක් එක් කළ හැකි බැවිනි.

කරුණු කාරණා කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනයේ විකාශනය කෙරෙහි ලාංකික භික්ෂූන් වහන්සේලාගෙන් සිදු වූ අප්‍රමාණ සේවය සමාජ අභිවෘද්ධිය පිණිසම හේතු විය.

**චන්දන උපාලි පෙරේරා**
බෞද්ධ අධ්‍යාපන ප්‍රවර්ධන අධ්‍යක්ෂ
ශ්‍රී ශාක්‍යසිංහ සරසවිය



# වැඩිහිටි දිවියේ මානසික සුවතාවය සඳහා උපදෙසක්

වැඩිහිටි දිවිය මිනිස් ජීවිතයේ සැඳෑ සමයයි. මනුෂ්‍යයෙකු වශයෙන් උපදින සෑම කෙනෙක්ම ජීවිතයේ කිනම් දිනක හෝ වැඩිහිටියෙකු බවට පත්වීම විශ්වීය ධර්මතාවයයි.

මිනිසුන් ජීවිතයේ විවිධ වූ අවධි පසු කරයි. මෙම අවධි ළදරු අවධිය, ළමා අවධිය, යොවුන් අවධිය, මැදි වැඩිහිටි අවධිය, වැඩිහිටි මහළු අවධිය යනාදි වශයෙන් වර්ගීකරණය කළ හැකිය. විශේෂයෙන්ම මේ ලිපියෙන් මා අවධානය යොමු කරනුයේ වැඩිහිටි අවධිය වෙතටයි. මෙහිදි වැඩිහිටියන් වශයෙන් සළකනුයේ වයස අවුරුදු හැට පහ ඉක්මවූ මිනිස් ප්‍රජාවයි.

ජීවිතයේ වැඩිහිටි අවධිය ගත කරන සෑම මනුෂ්‍යයෙක් තුළින්ම හඳුනා ගත හැකි පොදු ලක්ෂණයක් වන්නේ කායික හා මානසික පිරිහීමට (දුර්වලතාවන්ට) පත්වීමයි. එනම් ජීවිතයේ මුල් අවධීන්හී සිදුවන කායික හා මානසික සංවර්ධනය වැඩිහිටි අවධිය වනවිට දුර්වලවීමට පටන් ගනී.

මේ අනුව කායිකව දුර්වල වන වැඩිහිටියන්ට ක්‍රම ක්‍රමයෙන් එදිනෙදා කටයුතු කර ගැනීමේදී අන් අයෙකුගේ උපකාරය අවශ්‍යවන තත්ත්වයට පත්වේ. ඇස් පෙනීම, කන් ඇසීම, දුර්වලවන අතර උරුමවී පවතින උසස් මානසික හැකියාවන් (Higher Mental Capacities) දුර්වලවීමට පටන් ගනී. උදාහරණ වශයෙන් මතක ශක්තිය අඩුවීම, සංජානනයේ දුර්වලතා අවධානය ගිලිහී යෑම, තීරණ ගැනීමේ අපහසුතාවය හඳුනාගත හැකිවේ.

මේ ආකාරයට වැඩිහිටියන්ට මුහුණදීමට සිදුවන කායික හා මානසික අපහසුතා හේතුවෙන් ඔවුන් මනෝ විද්‍යාත්මකව විෂාදය (Depression) වැනි තත්ත්වයන්ට මෙන්ම කායික විද්‍යාත්මක පදනමකින් යුතු ඩිමෙන්ෂියා (Dementia) ඇම්නීසියා (Amnisia) වැනි මනෝ කායික රෝගයන්ටද ගොදුරු වේ. විශේෂයෙන්ම ඉහත සඳහන් කළ මනෝ කායික රෝග හේතුවෙන් වැඩිහිටියන්ගේ මතකය ගිලිහී යාම සිදුවන අතර රෝගී තත්ත්වය වඩාත් උත්සන්න වනවිට දරුවන් පවා හඳුනා ගැනීමට අපහසු වේ.

වැඩිහිටියන් මුහුණ දෙන මානසික ක්ලමථය විෂාදය, වැනි තත්ත්වයන්ට හේතුවන්නේ දරුවන්ගෙන් බලාපොරොත්තුවන ආදරය, කරුණාව, රැකවරණය

නොලැබීම, ආර්ථික වශයෙන් යැපෙන්නන් බවට පත්වීම, නවීන තාක්ෂණය හමුවේ තමන් සතු සාම්ප්‍රදායික දැනුමේ වටිනාකම අවතක්සේරු කිරීම, සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිකම වැනි තත්ත්වයන් මෙන්ම පෙර පෙන්වා දුන් කායික හා මානසික හැකියාවන්ගේ දුර්වලතා ඇතිවීමයි.

මහළුවිය තුළ ඉහත ආකාරයට ඇතිවන කායික හා මානසික දුර්වලතා හේතුවෙන් වැඩිහිටියන්ට මුහුණදීමට සිදුවන මානසික පසුබෑම පිළිබඳව මනෝ විද්‍යාඥයන්ගේ පමණක් නොව සමාජ හා ආර්ථික විද්‍යාඥයන්ගේද විශේෂ අවධානය යොමුවී තිබේ. සමාජ විද්‍යාඥයින් හා ආර්ථික විද්‍යාඥයින් වැඩිහිටි ප්‍රජාවට සමාජයේ හා ආර්ථික වශයෙන් ලැබිය යුතු සහය පිළිබඳව විවිධ අධ්‍යයනයන් සිදුකරන අතර මනෝ විද්‍යාඥයන්ගේ කාර්ය භාරය වී ඇත්තේ වැඩිහිටියන් මානසික වශයෙන් නගා සිටුවීමයි.

වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍යය නගා සිටුවීම සඳහා මනෝ විද්‍යාඥයින් විවිධ වූ ප්‍රයත්නයන් දරයි. මෙහිදී මනෝ විද්‍යාත්මක උපදේශනයට විශේෂ ස්ථානයක් හිමිවේ. වැඩිහිටියන් සඳහා වූ උපදේශනයේදී ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන්නේ "වැඩිහිටි විය" පිළිගැනීම අවශ්‍ය මානසික සූදානම ඇති කිරීමත්, මෙම අවධියේදී ඇතිවන කායික හා මානසික වෙනස්කම් කළමනාකරණය කර ගන්නා ආකාරය පෙන්වා දීමත්, විවිධත්වයෙන් යුතු සුන්දර වැඩිහිටි වියක් ගත කිරීමට අවශ්‍ය මනෝ විද්‍යාත්මක මග පෙන්වීම සිදු කිරීමත්ය.

ජීවිතය විවිධ අවධීන්වලින් යුතු වුවත් මේ සෑම අවධියකම පොදු වූ සෞන්දර්යයක් තිබේ. ඒ සෞන්දර්යය විඳගත හැකිවන්නේ ඒ ඒ අවධිවල මුහුණදීමට සිදුවන විවිධ වූ අත්දැකීම් යථාර්ථවාදීව ග්‍රහණය කර ගැනීමට හැකිනම් පමණි. ඒ අනුව වැඩිහිටි දිවිය තුළද කිසියම් සෞන්දර්යයක් තිබේ. ඒ සෞන්දර්ය විඳ ගැනීමට හුරුවීම තුළින් අර්ථාන්විත වැඩිහිටි දිවියක් ගත කිරීමට හැකිවේ.

සෞන්දර්යය රස වින්දනය පුරුදු කිරීම වැඩිහිටි දිවියේ මානසික සුවතාවය සඳහා රසවත් උපදේශන එළඹුමකි. මෙහිදී සිදුවන්නේ වැඩිහිටියන්ගේ මානසික නිරෝගිතාවය උදෙසා සෞන්දර්ය රස වින්දනයට යොදා ගන්නා ආකාරය පෙන්වාදීමයි. සෞන්දර්යයට සෑම මනුෂ්‍යයෙක්ම සුවපත් කිරීමේ හැකියාවක් තිබේ. විශේෂයෙන්ම සෑම මනුෂ්‍යයෙක්ම සෞන්දර්ය රස වින්දනය පුහුණු නොකරති. එහෙත් වැඩිහිටියන් වශයෙන් සෞන්දර්ය රස වින්දනයට පුරුදු වීම කායික නිරෝගිතාවයට ඉමහත් පිටු බලයකි.

වර්තමාන තත්ත්වය කෙසේ වුවත් අතීතයේදී වැඩිහිටියන් විවිධ ආකාරයට සෞන්දර්යය තම ජීවිතවලට බද්ධ කරගෙන තිබෙන බවට සාක්ෂි තිබේ. ඒ අනුව ඔවුන් තමා නියැලෙන කුමන හෝ කාර්යයක් වුවද සෞන්දර්යාත්මකව වින්දනය කර තිබේ.

උදාහරණ වශයෙන් නෙළුම් කවි, ගොයම් කවි, පැල්කවි, පතල් කවි, පාරු කවි, ගැල් කවි, වැලපුම් ගී, දරු නැළවිලි ගී, ඔන්චිලි වාරම්, ආදී සෑම ජනගී විශේෂයක් තුළින්ම පිළිබිඹු වන්නේ මිනිස් දිවියේ සුවිශේෂී අවස්ථා හා මිනිසුන් එම අවස්ථා වින්දනය කර ඇති ආකාරයන්ය.

මෙම කවි, ගී, බොහෝ විට අතීත මිනිසුන්ගේ ජීවනෝපාය හා බැඳී තිබෙනු පෙනේ. ඔවුන්ගේ කාර්යයන්හි අපහසුව, අවදානම් බව අමතක කිරීමට මෙන්ම චිත්තවේගී වශයෙන් සාමූහිකත්වය කියා පෑම සඳහා 'කවිය' මෙවලමක් කරගෙන තිබේ. ප්‍රධාන වශයෙන්ම මිනිසුන්ට දැනුණු පාළුව කාංසිය නිවා ගැනීමට පැල්කවි කීවද එම කවි තුළ තමන්ගේ හුදෙකලාව, රෑය පහන් කිරීමට ඇති අපහසුව මුසු වේදනාබර ස්වරය ගැබ්වී තිබේ.

ඒවගේම තමන්ගේ දුප්පත්කම, අසරණකම පිළිබඳව මෙම කවි හරහා දැනුම්දේ. කොපමණ අසරණ වුවත් දුප්පත් වුවත් වැළපෙනු වෙනුවට තමන්ගේ වේදනාව කවියක් හරහා ප්‍රකාශ කිරීමට අපගේ වැඩිහිටියන් පෙළඹී තිබේ. නෙළුම් කවි, ගොයම් කවි, හරහා ද ගොවියන්ගේ ජීවනෝපායේ විශේෂ අවස්ථා පිළිබිඹු වේ. විශේෂයෙන්ම ගැමි කාන්තාවන් සාමූහිකව ඒකරාශී වී තමන්ට දැනෙන අපහසුව නොතකා ගොයම් නෙළීම, ගොයම් කැපීම සිදුකර තිබේ.

මෙවැනි අවස්ථාවල ගොයම් කවි කීමට ඔවුන් පෙළැඹුණේ සාමූහික සතුට වැඩිකර ගැනීමටත්ය. පතල්

කවි පිළිබඳව අවධානය යොමු කරන විට පෙනී යන්නේ පතල් කර්මාන්තය ඉතාමත් අසීරු වූ රැකියාවක් බවයි. ඉතා ගැඹුරු පතල් තුළට රිංගාගෙන මිනිරන් කැඩීමෙහි යෙදෙන මිනිසුන්ගේ ජීවිතවල ඇත්තේ අස්ථිර ස්වභාවයයි. මෙම අස්ථිර ස්වභාවය මගහරවා ගනුවස් ඔවුන් පතල් කවි ගායනා කරති.

පහත දැක්වෙන්නේ ආදි ගැමි ජනතාව විසින් ගායනා කරන ලද කන්කළු පතල් කවියකි.

'කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් එනවා
මිනිරන් තේරුවොත් ළඳේ නුඹ කළු වනවා
ළඟ නම් ගෙදර මුර ඇරුණම මම එනවා'

මෙම කවිය තුළින් පතල්කරුවෙකුගේ ජීවන ස්වභාවය පමණක් නොව ඔහු තුළ ලියලන 'ආදරයක්' පිළිබඳව ද කියැවේ. මේ ආකාරයටම කරත්ත කවි තුළින්ද කරත්තකරුවාගේ වෙහෙස හා ගවයාගේ වෙහෙස පිළිබඳව කියැවෙන අතරම මෙම කවි තුළින් ඔවුන්ගේ චිත්තවේග, මානුෂීය හැඟීම් මොනවට කියාපායි.

මීට අමතරව දරු නැළවිලි ගීත තුළින්ද, දරුවා නැළවීමට අමතරව වැඩිහිටි මිනිසුන් තුළ පැවැති ශබ්ද රසය, තාල රසය, පිළිබඳව මනා අවබෝධයක් ලැබේ. මේ ආකාරයට අතීතයේ වැඩිහිටියන් විසින් රසවිඳි ජන ගායනා බොහොමයක් වර්තමානයේ තරුණ ජීවිත ගත කරන අයට ආදර්ශ වශයෙන් පවතී.

කෙසේ වෙතත් වර්තමානයේ වැඩිහිටි ජීවිත ගත කරන බොහෝ දෙනෙක්ම ඔවුන් අතීතයේ රසවිඳි කලා කෘතීන් තමන්ගේ වර්තමාන මානසික නිරෝගිතාවය උදෙසා යොදා ගන්නා ආකාරය පිළිබඳව අවබෝධයක් නැත. මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. සමාජය සංකීර්ණ භාවයට පත්වීමත් සමඟ දිනෙන් දිනම හුදෙකලා තත්ත්වයට පත්වන ප්‍රජාව බොහෝ විට තමන් සමාජයට අනවශ්‍ය පිරිසක් බව සිතමින් දුකසේ කාලය ගත කරයි.

වැඩිහිටි ප්‍රජවට සමාජයෙන් සිදුවිය යුතු විශාල සේවයක් තිබේ. ඔවුන්ව ආරක්ෂා කිරීම, අවශ්‍ය පහසුකම් සලසාදීම සෑම සමාජයකම වගකීමකි. නමුත් වැඩිහිටියන් වශයෙන් තමන්ගේ මානසික නිරෝගිතාවය වෙනුවෙන් ක්‍රියා කිරීම ඔවුන් සතු වගකීමකි. මෙහිදී සෞන්දර්ය රස වින්දනයට වැදගත් ස්ථානයක් හිමිවේ.

වර්තමානයේ ඇතැම් වැඩිහිටියන් තම මුණුබුරු මිණිබිරියන් රැකබලා ගැනීම කරදරයක් ලෙස දකී. ඒ අනුව ඔවුන් දරුවන්ට කතාන්දර කීම, කවි සිංදු කීම දක්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. නමුත් දරුවන් රැකබලා ගැනීමේදී ඇතිවන වෙහෙස නිවා ගැනීමට දරු නැලවිළි ගීත කීම හොඳ උපක්‍රමයකි. මේ තුළින් දරුවන් නැළවෙන අතර තමන්ටද මානසික වශයෙන් සහනයක් ලැබේ.


මීට අමතරව ගුවන්විදුලියට සවන්දීම, රූපවාහිනිය නැරඹීම තුළින්ද වැඩිහිටි දිවියට සෞන්දර්යය එක්කර ගත හැකිවේ. විශේෂයෙන්ම ආගමික පසුබිමක් ඇති ගීතවලට සවන්දීම අධ්‍යාත්මික වශයෙන් සිත සන්සුන් කරන අතර රස වින්දනයක් ද ලැබේ. විශේෂයෙන්ම අපගේ පූජනීය ස්ථාන පිළිබඳව කියැවෙන ගීත ශ්‍රවනය තුළින් එම ස්ථානවලට යෑමේ අපහසුතාවයක් ඇති වැඩිහිටියන්ට පරිකල්පනයන් තුළින් සහනයක් ලබාගත හැකිය.

විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටවල වැඩිහිටි ප්‍රජාවට සෞන්දර්යය රස වින්දනය පිළිබඳව දැනුම අවබෝධයක් නැතිකම ගැටළුවකි. එබැවින් විශේෂයෙන්ම මනෝ විද්‍යාත්මක උපදේශනයන්හිදී බොහෝ අවස්ථාවල අතීතයේ රසවිඳි කලාකෘති ඇසුරින් නැවත රස වින්දනයක් ඇති කර ගන්නා ආකාරය පිළිබඳව දැනුමක් ලබාදේ.

සංගීතය භාවනාවකි. එහෙයින් සංගීතය තුළ රැඳි සෞන්දර්යය රස වින්දනය පුහුණු කිරීම වැඩිහිටියන්ට භාවනාවකි. මේ අනුව සෞන්දර්යය තුළ රැඳි මැනසික සුවපත්වීමේ ගුණය සෑම වැඩිහිටියෙකු විසින්ම අත්විඳිය යුතු වටිනා උපදේශන ක්‍රම ශිල්පයකි.

**ශාස්ත්‍රවේදී චන්ද්‍රසිරි වැලිගමගේ**
(සාමදාන විනිශ්චයකාර මුළු දිවයින)

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 දුරුතු - නවම් - මැදින්



# ශ්‍රී ලංකාවේ රාජ්‍යපාලනය හා බුදුසමය - (II කොටස)

**බුද්ධාගම පිළිබඳව රජුගේ වගකීම**

රාජ්‍යය හා බැඳුණු බුද්ධාගම රට තුළ වඩ වඩාත් දියුණු තත්ත්වයකට ගෙන ඒමට අනිවාර්යයෙන්ම රජතුමා බැඳී සිටියේය. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන පෙළේ ඓතිහාසික විහාරාරාම බොහොමයක්ම රජුන්ගේ මෙහෙයවීමෙන් ඉදි වූ ඒවා වීමේ රහස එයයි. එකම ස්තූපය වරින් වර විශාල කරමින් වැඩි දියුණු කරවන ලද්දේ ද ඌන වූ විහාරාංග කරවා සම්පූර්ණ කරවන ලද්දේ ද ඒ අනුවය. විහාර ආරාමයන් ක්‍රමවත් ව පවත්වා ගෙන යාම සඳහා ද රජුන්ගේ අනුග්‍රහය නොමඳ ව ලැබිණ. ඒ සඳහා රජුන් විසින් කෙබඳු පරිශ්‍රමයක් දරන ලදද යන්න මිහින්තලා ශිලා ලේඛනයෙන් මනාව පැහැදිලි වෙයි.

විහාරය සඳහා අවශ්‍ය සියලුම සේවාවන් රාජකාරි බවට පත් කොට තිබිණි. වෛද්‍යවරුන්, අහර පිසන්නන්, සහල් සපයන්නන්, දර සපයන්නන්, වළං තනන්නන් ආදී අවශ්‍ය සියලුම සේවකයින් රජයේ වැටුපෙන් නඩත්තු කෙරිණි. ආරාම පාලනය සඳහා පත්කොට තිබුණු විශාල නිලධාරි පිරිස අතර වෙහෙර පිරිවහනුවා (ආරාම පාලනය භාර ප්‍රධාන නිලධාරියා) නියම්පෙටු (අය පාලක මණ්ඩලයේ ප්‍රධානියා) කරඩලෙයා (කරඬු භාර ලේකම්) පසක්කැමි (ප්‍රත්‍ය සම්පාදකයා) කැබලිජෙටු (විහාර ගම්හි පාලකයා) යන තනතුරු ඉතා වැදගත් විය. එසේම විහාරාරාමයන්හි පරිභෝජනය සඳහා විශාල වශයෙන් ගම් බිම් පවරා දී තිබිණි.

භාතිකාභය රජු විසින් කරන ලද එවැනි පරිත්‍යාගයන් ගැන මෝලාහිටියවෙලේගල ලිපිය කරුණු අනාවරණය කරන අතර බදු ආදි විවිධ ආදායම් මාර්ග විහාරාරාමයන්ට පවරා තිබුණු අයුරු ලබුඇබැඳිගල පෙරුමියන් කුලම් ආදි ලිපිවලින් හෙළිදරව් වෙයි. වැව් හා ඇල දොළ වලින් ලැබුණු ජල බද්ද විහාරයනට පැවරූ බව පුලිමියන්කුලම් ලිපියෙනුත් වී ආදි ධාන්‍ය වර්ග හෝ මුදල් බැංකුවල තැන්පත් කිරීම් ආදියෙන් ලත් පොලිය විහාරයට පිදූ බව තෝනිගල ලිපියෙනුත් හෙළි වේ. ඇතැම් විහාරාරාම පරිපාලනයෙහි ලා රජය විසින් ඇති කොට තිබුණු සංවිධානය කොතරම් දියුණු වීද යත් සංඝාරාම පාලනයට විශේෂ දෙපාර්තමේන්තු පිහිටුවා තිබිණැයි මිහින්තලා ලිපිය හා අභයගිරි සංස්කෘත ලිපිය ඇසුරෙන් යක්කඩුවේ ප්‍රඥාරාම මාහිමියෝ පෙන්වා දෙති. මිහින්තලයේ ආරාමික කටයුතු සඳහා සේවකයින්

200 ක් පමණ සිටි බව වල්පොල රාහුල හිමියෝ පෙන්වා දෙති.

**පවිත්‍රතාව**

ථෙරවාද බුද්ධ ධර්මයේ පවිත්‍රතාව කෙලෙසීමට තුඩු දෙන **අධර්මවාදී** දැයින් බුදුදහම ආරක්ෂා කර ගැනීම ද බුද්ධ ශාසනයෙහි දියුණුව අපේක්ෂා කළ රජුගේ වගකීමක් විය. වොහාරිකතිස්ස ගෝඨාභය රජුන්ගේ අවදිවල වෛතුල්‍යවාදය ඉදිරිපත් වූ විට එය මර්දනය කොට පමණක් නොනැවතුණු රජ හූ වෛතුල්‍යවාද ගත්තවුන් රටින් ද පිටුවහල් කළහ. යම් රජෙක් මේ මග අනුගමනය නොකළෝ නම් ඔහු සැලකුණේ සාප ලද්දකුගේ තත්ත්වයෙනි. යම් රජෙක් මේ මග අනුග මනය නොකළෝ නම් ඔහු සැලකුණේ සාප ලද්දකුගේ තත්ත්වයෙනි. පළමුවන සේන රජු දවස ලංකාවට ගෙන ආ ථෙරවාද දහමට පටහැනි වූ වාජිරිය වාදය ඒ රජුන් විසින් පිළිගන්නා ලදී. මේ පිළිගැනීම නිසාම එම සමාදානය නිසා වුන් තෙනින් ඉගිල දෙමළුන්ට නුවර දී පොළොන්නරු ගොස් ජන්මාන්තර ගත වී යයි නිකාය සංග්‍රහය කියයි.

ඇතැම් විටෙක ථෙරවාද දහම නොසලකා හරිමින් යම් රජෙකු කටයුතු කළේ නම් මහජනතාව ඔහුට විරෙහිව නැඟී සිටියේද ඉහත කී බලාපොරොත්තුව ඔහුගෙන් ඉටු නොවූ හෙයිනි. මහසෙන් රජු සංඝමිත්‍රගේ මෙහෙයවීම මත මහායාන සංග්‍රහය කරගෙන යද්දී සිරිමේඝවණ්ණාභය ඇමතියාගේ නායකත්වයෙන් ජනතාව නැඟී සිටි බව සඳහන් වේ. මේ අවස්ථාවේ ජනතා බලවේගය කොතරම් උග්‍රවීද යත් මහාවිහාර විනාශය නවත්වන බවටත් එතෙක් විනාශ කළ ගොඩනැගිලි ආදිය ප්‍රතිසංස්කරණය කරවන බවටත් ප්‍රතිඥාවක් දෙන්නට රජුට සිදු විය.

භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය නොපිරිහී පැවතීම බුද්ධ ශාසනයෙහි නොපිරිහීමට තුඩු දෙන්නක් වන බැවින් භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය ගැන ද රජවරු සිය අවධානය යොමු කළහ. අනුරාධපුර යුගාවසානයෙහිදීත් ඉන් අනතුරුවත් අපමණ ලාභ සත්කාරාදිය නිසා දූෂණය ව පැවති භික්ෂු සමාජය නිසි මගට ගැනීමට රජුන් ගත් ප්‍රයත්නය මිහින්තලා ශිලා ලේඛනය, අභයගිරි සංස්කෘත ලිපිය, මහා පරාක්‍රමබාහු කතිකාවත, දඹදෙනි කතිකාවත, කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත, රාජාධිරාජසිංහ කතිකාවත ආදියෙන් පිළිබිඹු වේ.

භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු නීතිරීති හා සම්ප්‍රදායයන් බුද්ධ නියමය අනුව යමින් රාජ නියෝග යන් බවට පත් කොට ඇති සැටියක් මේ ලේඛනයන්ගෙ න් පෙනී යයි. පළමුවන විජයබාහු, මහා පරාක්‍රමබාහු ආදි රජවරුන් විසින් දුසිල් මහණුන් සසුනෙන් පළවා හරිමින් කරන ලද ශාසන සංශෝධනයන්ගෙන් ද හෙළි වන්නේ රජුන්ගෙන් ඉහත කී ශාසනාභිවෘද්ධිය පිළිබඳ වගකීම ඉටු වූ වගයි. භික්ෂූන් වහන්සේ අතර වූ නිකාය භේදය ද බුද්ධ ශාසනයෙහි දියුණුවට බාධකයක් වූ බැවින් නිකාය සාමග්‍රිය සඳහා ද රජවරු උත්සුක වූහ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයෙහි බුදුසමය හා බැඳුණු නිලතල රාශියක්ම වූ බව ද පෙනේ. සිරිත් ලේනා නමින් ශිලා ලේඛනයන්හි දක්නට ලැබෙන තනතුර රට තුළ බුද්ධ ධර්මානුගත සද්චාරිත්‍රයන් වඩා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ධර්මාශෝක රජුගේ **ධර්මමහමාත්‍ර** නැමති නිලයට සමාන ව ඇති වූවකැයි සිතත හැකිය.

දේවානම්පියතිස්ස රජු දවස ශ්‍රී මහා බෝධිය වැඩමවා ගෙන ඒමේදී බිහි වූ රාජ්‍ය තන්ත්‍රය හා බැඳුණු නිලතල ලේඛනයක් බෝධිවංසයෙහිත් පූජාවලියෙහිත් දක්නට ඇත. ජයමහලේන තනතුර, ලක් මහලේන තනතුර, කොතුරු ගානා තනතුර, අරක්මේනා තනතුර, උතුරුපස්නා තනතුර, මහසිටුනා තනතුර, සක්දානා තනතුර, මහරැටිනා තනතුර ආදි විශාල තනතුරු සංඛ්‍යාවක් එහි ඇතුළත්ව ඇත. කේශධාතූන් රැගෙන ආ ශිලාකාලට මුගලන් රජු විසින් 'අසිග්ගාහක' නම් තනතුරක් පිරිනමන ලදී. පසුකලෙක ශිලාකාල රජකමට පත්වීමෙන් මෙම නිලය දරන්නා කොතරම් ප්‍රබල වී දැයි සිතා ගත හැකිය.

**නීතිරීති හා ආඥා**

රාජ්‍ය නීතිරීති සම්පාදනයෙහිදී ද බුදුසමයෙහි බැලපෑම දක්නට ලැබෙන අතර සමස්ත නීතිරීති පද්ධතිය ම එහි මූලධර්ම පදනම් කොට ගෙන සකස්ව තිබිණැයි කිව හැකිය. ii වන සේන රජු විසින් අභිෂේකය පිළිබඳව

පනවන ලද නීතියක් නම් රුවන්වැලි සෑ මළුවෙහිදී වාර්ෂිකව අභිෂේකය පැවැත්විය යුතුය යන්නයි. මෙය එක්තරා අන්දමකින් ආණ්ඩුක්‍රමය සඳහා ගෙන ආ සංශෝධනයක් වැන්න. පොහෝ දිනයන්හි වෙළඳාම තහනම් කොට පැනවූ ආඥාවනුත් දඬුවමුත් බදුලුටැම් ලිපියෙන් දැක ගත හැකිය. පොහෝ දිනය ධාර්මිකව ගතවනු දැක්මේ හා එමගින් ජනජීවිතයට ධාර්මික වීමේ සුභෂසයක් ලබාදීමේ අවශ්‍යතාව මෙවැන්නකට හේතු විය. භාතිකාභය ආමණ්ඩගාමිණී අභය ආදි රජවරු **මාඝාත ආඥාව** පනවමින් ප්‍රාණඝාතය නීතියෙන්ම තහනම් කළහ. වොහාරිකතිස්ස රජ නීති කඩ කළවුනට ශාරීරික දඬුවම් දීම තහනම් කරමින් නීති රීති පැනවිය. පළමුවන විජයබාහු රජ මරණීය දණ්ඩනය දීමේ වරදක් කළ තැනැත්තාට ද තුන් වාරය දක්වා ක්ෂමාව දිය යුතු යයි නියම කළේය. බුදු දහමෙහි ආභාසය තුළින් රාජ්‍ය පාලකයා මනුෂ්‍ය ඝාතනයට කොතරම් මැලිවීද යන්න මින් පැහැදිලි වෙයි.

**උත්සව**

රජයේ අනුග්‍රහය මත පැවැත්වුණු ජනප්‍රිය බෞද්ධ උත්සව කිහිපයක් ගැන ද සඳහන් වේ. මේ උත්සවයන් වෙනුවෙන් රජයේ ධනය විශාල වශයෙන් වැය කරන ලදී. දුටුගැමුණු, භාතිකාභය, වසභ ආදි රජවරු බොහෝ දෙනෙක් වාර්ෂිකව වෙසක් උත්සව පැවැත්වූහ. කීර්ති ශ්‍රී මේඝවර්ණ වොහාරික තිස්ස ආදි රජවරු අරියවංස නම් උත්සවයක් පැවැත්වූහ. මෙය වර්ෂා ඍතුව වස්කාලය අග පැවැත්වෙන **කඨින පූජා උත්සවය** බව පරණවිතාන මතයයි. මේ පිළිබඳව උගතුන් අතර මතිභ්‍රම පවතී. මේ උත්සවය සඳහා සිරිමෙවන් රජු විසින් යහසපවස විහාරයට පවරා දෙන ලද දීමනාවන් ගැන තෝනිගල සෙල් ලිපියෙන් ද, ඒ සඳහා ම කහවනු සියයක පොලියක් දේවගිරි විහාරයේ භික්ෂූන්ට දෙන ලද බව ලබු ඇට බැඳිගල ලිපියේද සඳහන් වේ. මහාදාඨික මහානාග රජු දවස පැවැත්වුණු **ගිරිභාණ්ඩ පූජා** නම් උත්සවයක් ගැන අට්ඨකථාවන්හි සඳහන් වන බව ආචාර්ය අදිකාරම් පෙන්වා දෙයි. ක්‍රි.ව. 5 සියවසේදී රජුගේ අනුග්‍රහයෙන් පැවැත්වුණු දළඳා උත්සවයක් ගැන ද පාහියන් සඳහන් කරයි.

**බුද්ධාභිෂේකය**

දේවානම්පියතිස්ස රජු විසින් **බුද්ධාභිෂේක මංගල්‍යයක්** පැවැත්වූ බව මහාවංසයේ සඳහන් වෙයි. මෙය බෝධිය එවීමේදී ධර්මාශෝක රජු විසින් දන්වා එවන ලදුව කළ ඉල්ලීමක් ඉටු කිරීමක් බවද පෙනේ. බෞද්ධ රාජ්‍යයක උත්තරීතර බලය බුදුරජාණන් වහන්සේ ප්‍රභව කොට ඇත්තක් ලෙස පිළිගෙන උන්වහන්සේට රාජ්‍යය පුදා රාජ්‍යයෙහි අභිෂේක කරවීම හා උන්වහන්සේගේ අණසක යටතේ ලෞකික පාලකයකු රාජ්‍ය පාලනය කිරීම ඉන් සංකේතවත් වන බව මහාචාර්ය චන්ද්‍ර වික්‍රම ගමගේ කියයි. අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධි විහාරයේත්, මහනුවර දළඳා මාළිගාවේත් අද දක්වාම පැවැත එන **නානුමුර මංගල්‍යයත්** සමඟ සිදුකෙරෙන බුද්ධාභිෂේකය මේ සම්ප්‍රදාය පවත්වා ගෙන යාමක් ලෙස ඔහු දකී.

මේ අනුව සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය හුදෙක් ජනතාව හමුවේ පාලන කාර්යය (ආඥාචක්‍රය) පමණක් පවත්වනු ලබන්නක් නො වීය. එය බුදු දහම (ධර්ම චක්‍රය) ආරක්ෂා කරමින්, සංවර්ධනය කරමින් ජනතාව තුළ ඊට අදාළ ගුණධර්ම ඇති කරලමින් 'පාලනයට බුදුසමයත්, බුදු සමයට පාලනයත්' යන සංකල්පය මත ඉදිරිපයට යන්නක් විය. පූජාවලී කර්තෘපාද බුද්ධපුත්‍ර මාහිමියන් වහන්සේ ලංකාධිපති රජුන් විසින් බුදුන් කෙරෙහි ස්වභාව වූ ආදර බහුමානයෙන් ශාසන ප්‍රතිෂ්ඨාවෙහි අප්‍රමාද ව **ආඥාචක්‍රය හා ධර්ම චක්‍රය** රකෂා කොට රාජ්‍යය කොට කුල ප්‍රවේණිය රකෂා කළ යුතුය යි වදාළේ එහෙයිනි.

**ශාස්ත්‍රපති සිරිසේන විතානගේ**
අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්
(විශ්‍රාමික)

# සියලු පව්

**සබ්බ පාපස්ස අකරණං**
**කුසලස්ස උපසම්පදා**
**සචිත්ත පරියෝ දපනං**
**ඒතං බුද්ධානු සාසනං**

මෙම ගාථාවේ මුල් පදය වන සබ්බ පාපස්ස අකරණං එහි තේරුම සියලු පව් නොකරන්න. සියලු පව් නොකරන්න නම් සියලු පව් මොනවාද කියා දැනගන්න ඕන. එම දේශනා කර තිබෙන කයෙන් සහ වචනයෙන් කරන සියලු පව් ගණන කොපමණද? එම පව් මොනවාද? එම පව් කරන්නේ කුමකින්ද? දැන ගන්න ඕන.

"සබ්බ පාපස්ස අකරණං" දිනපතා ශ්‍රී ලංකා ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කරන වැඩසටහන් අවසන් කරන්නේ මධ්‍යම රාත්‍රියේ මෙම ගාථාව සජ්ඣායනා කිරීමෙන් පසුවයි. සබ්බ පාපස්ස අකරණං මෙම ගාථා පාඨය ධම්ම පදයේ බුද්ධ වග්ගයේ 183 ගාථාව ලෙස ධම්මපද පොතට ඇතුළත් කර ඇත.

සියලු පව් යනු බුදුරජාණන් වහන්සේ ඉසිපතනයේ මිගදායේ දී පස්වග මහණුන්ට මංගල ධර්ම දේශනාවේ දී දේශනා කරන ලද දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ ආර්ය අෂ්ටාංගික මාර්ග දේශනාවේ තුන්වන ප්‍රතිපදාවේ ඇති මිථ්‍යා වාචා වචනින් සිදු කරන පව් හතර සහ හතරවන ප්‍රතිපදාවේ දේශනා කර ඇති මිථ්‍යා කම්මන්ත කයෙන් සිදුකරන පව් තුන. මෙම පව් හත කයෙන් සහ වචනයෙන් සිදුකරන පව් හත සියලු පව්වලට ඇතුළත් වේ.

මිථ්‍යා කම්මන්ත හතරවන ප්‍රතිපදාවේ ඇති පව් තුන සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම මෙම පව් තුනෙන් මිදෙන විට කය සංවර වේ. එවිට කයෙන් කරන සියලු පව් වලින් මිදේ. මිථ්‍යා වාචා තුන්වන ප්‍රතිපදාවේ ඇති වචනයෙන් කියන පව් හතර බොරුකීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම. මෙම පව් හතරෙන් මිදෙන විට වචනය සංවර වේ. එවිට වචනයෙන් කරන පව් හතරෙන් මිදේ. කයෙන් පව් තුනක් සහ වචනයෙන් පව් හතරක් සිදුවේ. සියලු පව් හතකි. මෙම පව් හතෙන් මිදෙන විට කය සහ වචනයෙන් කෙරෙන සියලු පව්වලින් මිදේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ හතරවන ප්‍රතිපදාවේ ඇති මිථ්‍යා කම්මන්ත අනුව කය අසංවර කරන ශික්ෂා පද තුන වන සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම මෙම පව් තුන කයෙන් කරන පව් තුන වේ. එම පව් තුනින් මිදෙන විට කයෙන් කරන පව් තුනෙන් මිදේ. මෙම කය සංවර කරන සිල්පද තුන දැනට භාවිතා කරන සමහර පොත්වල සඳහන් කර ඇත්තේ යහපත් කර්මාන්ත ලෙසය. මෙම කය සංවර කරන සිල්පද තුන කර්මාන්ත නොවන බව ඒ අය දැනගෙන නැත. කයෙන් කරන පාපී ක්‍රියා තුන වන සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යන තුනින් මිදීමෙන් කය සංවර වේ. මෙම මිථ්‍යා කම්මන්ත පව් තුනෙන් මිදීමේදී කය අසංවර කෙරෙන සියලු පව්වලින් මිදේ. මෙම කයෙන් කරන පව් තුනෙන් මිදෙන විට කයෙන් වෙනත් පවක් සිදු නොවේ.

වචනයෙන් කරන පව් හතරෙන් මිදෙන විට වචනය සංවර වේ. කයෙන් කරන පව් තුනෙන් මිදෙන විට කය සංවර වේ. මෙම පව් හතෙන් මිදෙන විට කය හා වචනය සංවර වේ.

සම්මා කම්මන්ත ශික්ෂා පද තුන වන සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීම සිල්පද තුන රකින විට කය සංවර වේ. ඒවා කයෙන් කරන යහපත් ක්‍රියා මිස යහපත් කර්මාන්ත නොවේ.

සම්මා වාචා වචනින් කරන බොරු නොකීම, කේලාම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීම මෙම සිල්පද හතර රකින විට වචනය සංවර වේ. මෙම වචනය සංවර කර ගන්නා සිල්පද හතර බොහෝ පොත්වල සඳහන් කර ඇත්තේ යහපත් වචන කියාවේ. එතුමන්ලා මෙම සිල්පද හතර වචනය සංවර කරගන්නා සිල්පද ලෙස තේරුම්ගෙන නැත. තේරුම්ගෙන නැත්තේ වළගම්බා රජ කාලයේ ඇති වූ බැමිණිතියා මහා සාගතයෙන් පසු ධර්ම කථික හිමිවරු සහ පාංශුකූල හිමිවරු කළ වාදයේදී ප්‍රතිපත්ති රැකීම වැඩි ඡන්දයෙන් පරාද වීම නිසා ප්‍රතිපත්තිවල ඇති සම්මා වාචා සම්මා කම්මන්ත සිල්පද භාවිතයෙන් ඉවත් කර ඇත. එදා සිට එම සිල්පද භාවිතයේ නැති විය. මෙම සිල්පද හතර රකින්නේ නැතුව යහපත් වචන කීවාම වචනය සංවර වන්නේ නැත.


**මෙය දැන්වීමකට වඩා පින්- පව්, කුසල් - අකුසල් ගැන දැනගැනීමට සලස්වන දහම් පණිවිඩයකි.**
**ත්‍රිපිටකය හැදෑරීමට ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සරල බසින් සිංහල බසට නැගූ කාණ්ඩ 48 කින් යුත් ත්‍රිපිටකය කියවන්න.**

- පින් සහ පව් - කුසල් සහ අකුසල් - රු.120/-
- චිත්ත නියාම ධර්මය - රු.125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - රු.125/-
- පින සහ කුසලය එකක්ද දෙකක්ද - රු.200/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - රු.350/-
- හොඳ - නරක, පින් - පව් , කුසල්-අකුසල් - රු.100/-
- සිතෙහි සතුට ඇති කර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - රු.175/-
- දූ දරුවන්ගේ සාරධර්ම අත්පොත - රු.375/-
- සිත සහ මනසින් කුසල් අකුසල් , කය හා වචනින් පින් රු.350/-
- දැනට බුදුදහම උගන්වන සමහර පොත් වල අඩුපාඩු - රු.200/-
- සිතිවිලි සහ සිතින් සිතීම - රු.400/-
- තුන්දොර සංවර කර ගැනීම - රු.250/-
- සිල්වතෙකු වී දහම අවබෝධ කර ගන්න - රු.300/-
- කය වචන දෙකින් පින්- පව් සිතින් කුසල් - අකුසල් - රු.250/-



සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
**රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ**
661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකතන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187
www.godage.com godageem@slt.lk

# සසරින් මිදුමට පින් රැස් කරමු



හම රැලි වැටිලා ගත සුදු මැලිවී
හිස කෙස් පැහිලා පුළුන් රොදක්වී
දත කට සෙළ වී දිව පණ නැතිවී
සිරුරම වැහැරී ඇති වියපත්වී

අත පය ගැහෙමින් සවි බල අඩුවී
තුන් කුඩු ගැහිලා ගමනත් ඇදවී
දණ හිසි ඉදිමී හිට ගනු බැරිවී
මා මහලුය දැන් අසූ විය පසුවී

ගත සිත දුබලය මතකය අඩුවී
සිහි මඳ බව ටික ටික ඇත සැළවී
යුතුකම් තව ඇත නැත ඒ ඉටුවී
මරණය අත ළඟ බව නම් දැනවී

කුමට ද කුසලට පසු බැස ඉන්නේ
අකුසල් නොහොබියි නැතිවද දන්නේ
කොහොමද රුදු සසරින් ගැලවෙන්නේ
පින් රැස් කෙරුමට යුහුසුළු වන්නේ

අනිසයි මේ ලොව ඇති සැම දේ නම්
වැනසෙයි ඒ බව සිතට දැනේ නම්
නිවනට යන මග සතර පෙනේ නම්
සසරින් මිදුමට පෙරුම් පුරන්නම්

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං - ඒතං බුද්ධාන සාසනං

**පී. කරුණා පෙරේරා**
ශාස්ත්‍රවේදී උපාධි - ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
ශ්‍රී ලංකා ගුරු සේවය 1 වෙනි ශ්‍රේණිය
ගුරු උපදේශිකා - කළුතර අධ්‍යාපන කලාපය (විශ්‍රාමික)



# The Need to Overcome Hindrances

## *Pancha Neevarana*

Progress towards achieving liberation from Samsara is through practicing the development of mind. The development of mind can be done in three possible modes of meditation related to postures:-

***Seated form of Meditation,***
***Walking Meditation and***
***Day-to-day activities.***

The subject of meditation can relate to both **Tranquility (Samatha) and Insight (Vipassana)**. In each of these forms of mental development, it is necessary to get over **obstacles** which are generally referred to as hindrances or **Neevarana**. There is a need to give very high recognition to the subject of hindrances because they can totally prevent any mental development which leads to any spiritual progress. The main guide line in getting over them is to follow tranquility meditation or adopt a tactful attitude towards them without trying to force them out. Some of them can be used for our own learning and they even can be opportunities for developing the practice. We have to be patient. The doctrine urges us to examine the hindrances rather than hide them. If we are caught up in a trap we should examine the trap, dismantle it and be free. There are five hindrances which are described below.

***Sensual Pleasures :-*** This is considered a hindrance to mental development because our greed for pleasures relating to six sense objects such as food or music or attractive sights keep us mentally attached to them preventing us from paying attention to our object of concentration. Result is a disturbance of our meditation. Our inability to observe the mind is compared to water in a pond contaminated with colours. If we realize that the attachment of the mind to pleasure-giving objects is due to our seeing them as permanent and pleasurable when in fact they are impermanent and unsatisfactory, then it is not difficult to realize that pleasure comes together with pain. Joy and misery go hand in hand. Hence in trying to do mental development we need to be mentally

vigilant and get over thoughts of desire by seeing reality which is un-satisfactory and impermanent.

***Anger and Hatred :-*** Ill-will and hatred can be serious obstacles if personal animosities exist. Hatred by nature creates dissatisfaction and gloom. As an analogy, the mind affected by anger is compared to water that is boiling which cannot be observed properly and objectively. One of the best ways to prevent anger and hatred is to practice metta or loving- kindness towards others. Spreading of good-will is a very well recommended form of meditation. However if the mind keeps on getting disturbed, it is good to observe the thought mindfully and appreciate that all are subject to impermanence and that we are bothered about insignificant matters. Bad thoughts will fade away.

**Laziness and Lethargy or Sloth and Torpor**

This form of mental condition may be due to hunger and exhaustion after which sleepiness can overtake you. In such a situation it is physical rest that is needed. Over –eating also needs to be avoided. But if it is a mental state of laziness then it is best to appreciate the importance of the subject matter which needs priority attention. This type of mental state is compared to water in a pond covered by moss. A person with a watchful mind and clear comprehension can clean his mind. It is also possible to boost up the mental energy after mobilizing all the effort and direct your attention to get over the laziness. Changing the posture, say, from seated position to walking meditation in open air is also a solution for lethargy.

**Restlessness, Worry and Agitation**

If the mind is restless due to an uncontrollable worry, it is best to think of the root cause and find how insignificant the issue is. If it concerns the future, there is no real basis for worry. As an analogy it is compared to water in a pond affected by waves formed by wind, resulting in our inability to see the water clearly. Restlessness and worry result in agitation of mind. It is also said that agitation in mind could be due to your not being free to do what you want. Here it is necessary to get the freedom that you are looking for particularly in following the path to liberation. A restless mind can be due to repentance, regret and worry for past actions.

**Skeptical Doubt**

Doubt is like the situation faced when you are at a cross road junction without any sign boards. Instead of guessing it is possible to get guidance from a reliable source. A feeling like 'Am I getting anything really out of this practice?' can put you in doubt. Doubt is compared to muddy water in a pond. To achieve some clarity, as regards the correct path, it is possible to consult those who are faithful and close to you. The manner in which academic, scientific and intellectual community in the world has appreciated the rationality of Dhamma in presenting the true nature of our existence as preached by Tathagata Gautama Buddha can be a guidance for us. In addition, observation of our own gradual progress and our own conviction can assist in finding the correct path.

**Conclusion**

The above remedies for each hindrance is extremely important because each of them has a particular power to obstruct our spiritual progress. We may appreciate that the spiritual progress is compared **to swimming upstream in a river referred to as Patisotagami. Therefore continuous effort with Right Mindfulness is essential for avoiding hindrances.**

May all living beings be well and happy !

**Das Miriyagalla**

# ජාතික උපදේශක සභාව

සියලු ජාතික බලවේග ඒකරාශී කොට ඒකීය ශ්‍රී ලංකාවක් තුළ බුද්ධ ශාසනයේ සහ රටේ ඉදිරි පැවැත්ම උදෙසා සවිමත් ජාතික ව්‍යාපාරයක් බිහි කිරීම උදෙසා "ජාතික උපදේශක සභාව" නමින් ජාතික ව්‍යාපාරයක්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලිකත්වයෙන් 2023.12.25 වන දින පිහිටුවන ලද අතර මෙහි දෙවන රැස්වීම 2024.01.14 වන දින පවත්වන ලදී.

පූජ්‍ය බෙංගමුවේ නාලක නායක ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය අඟුලුගල්ලේ සිරි ජිනානන්ද ස්වාමීන් වහන්සේ අනුශාසකත්වය දරණ මෙම උපදේශක සභාවේ සභාපතිත්වය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා දරණ අතර ලේකම් සහ සම්බන්ධීකරණ කටයුතු සඳහා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික විමර්ශන මණ්ඩලයේ ගරු උප සභාපති සේනක කුමාරසිංහ මහතා පත් කර ගෙන ඇත. රටේ අවශ්‍යතාවයනට ගැලපෙන පරිදි කමිටු 09 ක් වශයෙන් මෙහි කටයුතු ක්‍රියාත්මක කිරීම පිණිස ඒ ඒ විෂයන්හි නිපුන, උනන්දුවක් දක්වන හා විශේෂඥ දැනුමකින් හෙබි පුද්ගලයින්ගෙන් මෙම කමිටු සමන්විතය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික මණ්ඩලවලට සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ලත් කමිටුවලට අනුබද්ධිතව උක්ත කමිටු ක්‍රියාත්මක වේ.

2024.01.14 වන දින මෙම රැස්වීම් සඳහා පූජ්‍ය බෙංගමුවේ නාලක නායක ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය අඟුලුගල්ලේ සිරි ජිනානන්ද ස්වාමීන් වහන්සේ මෙන්ම පූජ්‍ය ඕමාරේ කස්සප ස්වාමීන් වහන්සේ, පූජ්‍ය කෝන්ගස්තැන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ, ඉත්තෑදෙමලියේ ඉන්දසර ස්වාමීන්වහන්සේ සහ පූජ්‍ය වත්තේ වැවේ ධම්මානන්ද ස්වාමීන් වහන්සේ වැඩම කර අනුශාසන කළහ.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා, ගරු භාණ්ඩාගාරික වසන්ත ද සිල්වා මහතා, ගරු සමලේකම් ඉෂාන් බුද්ධික එදිරිසූරිය මහතා, ආචාර්ය එල්.එම්.කේ.තිලකරත්න මහතා, මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා, වෛද්‍ය රාණි ප්‍රනාන්දු මහත්මිය ඇතුළු අනෙකුත් කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් හා නිලධාරීන් ද පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකර මහතා, අනුරාධා යහම්පත් මහත්මිය, නීතිඥ කණිෂ්ක විතාරණ මහතා, විශේෂඥ වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මිය, ආචාර්ය හර්ෂ විජයවර්ධන මහතා, මතුගම සෙනෙවිරුවන් මහතා, ශර්මිලා ගෝණාවල මහත්මිය ඇතුළු සමාජ ක්‍රියාකාරීන් විශාල සංඛ්‍යාවක් ද සහභාගී විය.

මෙම ජාතික ව්‍යාපාරයේ තුන්වන රැස්වීම 2024.02.17 වන සෙනසුරාදා පෙ.ව.9.00 ට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්විය.

එම රැස්වීම සඳහා පූජ්‍ය වටිනාපහ සෝමානන්ද ස්වාමීන් වහන්සේ, පූජ්‍ය බලංගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති ස්වාමීන් වහන්සේ, පූජ්‍ය දොඩම්ගොඩ පියසිරි ස්වාමීන් වහන්සේ, පූජ්‍ය අඟුලුගල්ලේ සිරි ජිනානන්ද ස්වාමීන් වහන්සේ, පූජ්‍ය කෝන්ගස්තැන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ, පූජ්‍ය මැදගොඩ අභයතිස්ස ස්වාමීන් වහන්සේ, පූජ්‍ය වත්තේවැවේ ධම්මානන්ද ස්වාමීන් වහන්සේ, පූජ්‍ය ඕමාරේ කස්සප ස්වාමීන් වහන්සේ, පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ, පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්ද්‍රසාර ස්වාමීන් වහන්සේ, පූජ්‍ය බෙංගමුවේ නාලක ස්වාමීන් වහන්සේ වැඩම කරන ලදී.

ගිහි භවතුන් ලෙස සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා, ගරු භාණ්ඩාගාරික වසන්ත ද සිල්වා මහතා, ගරු සමලේකම් ඉෂාන් එදිරිසූරිය මහතා, ගරු උපසභාපතිනි නීලිකා සේනානායක මහත්මිය, රියාද් අද්මිරාල් සරත් වීරසේකර මහතා, නැගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාරවරිය අනුරාධා යහම්පත් මහත්මිය, මේජර් ජෙනරාල් විජිත් රවිප්‍රිය මහතා සහ කුලතුංග රාජපක්ෂ මහතා සහභාගී වූහ.

එහිදී පූජ්‍ය බෙංගමුවේ නාලක නායක ස්වාමීන් වහන්සේ අනුශාසනා කරමින් ජාතික ආගමික ප්‍රබෝධයක් රට තුළ ඇති විය යුතු කාලය එළඹ ඇති බැවින් අඟුලුගොල්ලේ සිරි ජිනානන්ද ස්වාමීන් වහන්සේ සහ නලින් ද සිල්වා මහතාගේ අදහස් ද අනුව මෙම ජාතික ව්‍යාපාරය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ක්‍රියාත්මක කිරීම සුදුසු බැවින්

මෙසේ කටයුතු කරන ලද බැව් පෙන්වා දෙමින් මෙම ජාතික ව්‍යාපාර තුළ පුද්ගලික මතවාද හෝ විවිධ සමිති සමාග ම්වල මතවාද වලට ඉඩක් නොමැති බවත් මෙහි එකම අරමුණ ජාතික ආගමික අනන්‍යතාවය රැක ගනිමින් බලයේ සිටින හෝ බලයට පත්වන ඕනෑම නායකයෙකුට ජාතික කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාදිය හැකි පදනමක් සහිත ව්‍යාපාරයක් බිහි කිරීම බව පැහැදිලි කරන ලදි.

එසේම මෙම කර්තව්‍යයේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගෞරවය මෙන්ම මේ සම්බන්ධයෙන් අවංක හැඟීමෙන් විශාල උනන්දුවකින් කටයුතු කරන සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ගෞරවයද අපේක්ෂා කරමින් කටයුතු කළ යුතු බැව් උන්වහන්සේ වැඩි දුරටත් පෙන්වා දෙමින් ඉදිරියේදී ද මෙම කටයුතු සඳහා සිය සම්පූර්ණ සහයෝගය ලබා දෙන අතර මේ සම්බන්ධයෙන් පූර්ණ අධීක්ෂණයකින් හා විමර්ශණයකින් යුතුව කටයුතු කරන බව හා මෙම ව්‍යාපාරයේ ප්‍රමුඛතම අරමුණ රටේ අනන්‍යතාවය රැක ගැනීම බවද පැහැදිලි කරන ලදී.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා අරමුණ පැහැදිලි කරමින් කිසිදු දේශපාලන පක්ෂයකට උදව් කිරීම හෝ කිසිදු නායකයෙක් බිහි කිරීමේ අරමුණක් මෙම ව්‍යාපාරය තුළ නොමැති බවත් ජාතික අනන්‍යතාවය රැක ගනිමින් මේ රට පාලනය කරන පිරිසට උපදේශකත්වය ලබා දෙමින් එහි අනන්‍යතාවය රැක ගැනීම අපේක්ෂා කරන බවත්, දේශීයත්වය වටහා ගත් පිරිස අද මෙතෙනට රැස්ව ඇති බවත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ආරම්භයේ පටන් දේශීයත්වයට ගරු කරන බෞද්ධ සමිති සමාගම් පුද්ගලයන් ඒකරාශී කරගෙන කටයුතු කරන බවත්, රටට අවශ්‍ය ක්ෂේත්‍ර 09 ක් තෝරා ගෙන එම ක්ෂේත්‍ර 09 හරහා ක්‍රියාත්මක කිරීමට සැළැසුම් කර ඇති බවත්, බුද්ධ ශාසනය, දේශීය අනන්‍යතාවය, ආර්ථිකය ආදීය සුරක්ෂිත කිරීම හා දියුණු කිරීම සැළසුම බවත් මෙය හුදෙක්ම රටේ යම්කිසි නායකයෙක්/පාලකයෙක් වෙත උපදේශනයක් කළ හැකි ඔවුන් නිසි මාර්ගයට ගත හැකි සංවිධානයක් හැටියට කටයුතු කිරීම බැව් පැහැදිලි කරන ලදි.

සරත් වීරසේකර මහතා වර්තමානයේ රටේ පවතින ජාතික ප්‍රශ්න සහ එය කෙසේ විසඳිය යුතුද යන්න පිළිබඳව අදහස් දක්වමින් ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් ජාතික හැඟීමක් ඇති පිරිස මෙතැනට රැස්ව සිටින අතර එය සතුටට කරුණක් බවත් අපේ රටේ තරුණ පිරිස අපේ ඉතිහාසය නොදැනීම හෝ ඒ ඉතිහාසය දන්නා බැව් ඇඟවීමට තරම් ශක්තිමත් බවක් නොමැතිකම ගැටළුවක් බවත්, මෙයද ප්‍රධාන ගැටළුවක් බවත්, නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා බෞද්ධ විහාරස්ථාන සම්බන්ධයෙන් පවතින ගැටළු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වෙනි වගන්තියේ සඳහන් පරිදි බුද්ධාගමට ප්‍රමුඛස්ථානය හා බුද්ධ ශාසනය පෝෂණය කොට සුරක්ෂිත කිරීම පිණිස සියල්ලන්ගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් ඉන්දියාවේ 30 වන ප්‍රාන්තය මෙහි ඇති වීම සහ රට බංකොළොත්භාවයට පත් කිරීම සම්බන්ධයෙන් තමා විරුද්ධ බැව් ප්‍රකාශ කර සිටියේය.

අග්ගමහා පණ්ඩිත පූජ්‍ය ඕමාරේ කස්සප අනුනායක ස්වාමින් වහන්සේ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ලෙස යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරමින් කළයුතු දේ හඳුනාගෙන කටයුතු කිරීම සුදුසු බවට උපදෙස් දෙමින් පිරිවෙන් වල තත්ත්වය සම්බන්ධයෙන් සතුටු විය නොහැකි බැව් පෙන්වා දුන්හ.

පූජ්‍ය අගුලුගොල්ලේ සිරි ජිනානන්ද ස්වාමින් වහන්සේ ජාතික උපදේශක සභාවේ 03 වන සැසියට සම්බන්ධවීම සතුටට කරුණක් බවත් මෙය සිංහල බෞද්ධයාගේ මූලස්ථානය බවත් මේ වන විට රටේ අධ්‍යාපනය, සාදාචාරය ආදී සියලු අංශ පිරිහී පවතින අතර මෙම වැටීම නතර කිරීමේ හැකියාව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික මණ්ඩල 10 තුළින් හැකි බවත්, මෙම ජාතික උපදේශක සභාවට රටේ විවිධ සංවිධාන නියෝජනය කරමින් පිරිස සහභාගී වන බැවින් ඔවුන්ද එම කටයුතු සිදු කරන අතර එම මණ්ඩල සම්බන්ධ වලින් ඉලක්ක කර ගත නොහැකි මහා අරමුණු ජය ගැනීම පිණිස දැනට කමිටු සාකච්ඡා පවත්වා සකස් කර ගත් ක්‍රියාකාරී සැළැස්මේ කරුණු ප්‍රමුඛතාව අනුව පෙළ ගස්වා ඒවා උපදේශක සභාව හරහා ක්‍රියාත්මක කළ හැකි බව පෙන්වා දුන්හ.

ජාතික උපදේශක සභාවේ මහා සංඝ රත්නය විසින් වෙනම රැස්ව ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී හිමාලයා ප්‍රකාශය හා අනෙකුත් ගැටළුවලට අදාළව සඟ සමුළුවක් එළඹෙන මාර්තු මස 16 වන දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රධාන ශාලාවේදී සියලු නිකායයන් සහ සියලු ප්‍රදේශ නියෝජනය වන පරිදි

සංඝයා වහන්සේලා 300 ක් වැඩමවා සිදු කිරීමටත් ඉන් අනතුරුව මහා සංඝයා වහන්සේලා 3000-5000 අතර වඩම්මවා සුදුසු ස්ථානයක මහා සඟ සමුළුවක්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා ජාතික උපදේශක සභාව එක්ව පවත්වා, නායකයින් සහ රාජ්‍ය පාලනය යහ මගට යොමු කර සෞභාග්‍යමත් සදාචාරාත්මක දේශයක් ගොඩනැගීමට අපේක්ෂා කරන බැව් පූජ්‍ය අඟුලුගොල්ලේ සිරි ජිනානන්ද ස්වාමීන් වහන්සේ පැහැදිලි කරන ලදි.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු භාණ්ඩාගාරික වසන්ත ද සිල්වා මහතා උපතේ සිට නිර්වාණය දක්වා වූ ගමන සඳහා යහපත් වූ මඟ පෙන්වීමක් ඇති මෙම ආයතනයට මෙතරම් අති විශාල කාර්ය භාරයක් මෙතරම් දීර්ඝ කාලයක් තිස්සේ කළ හැකි වූයේ සැළසුමක් සහිතව ක්‍රියා කළ බැවින් සහ යහපත් මූල්‍ය සැළසුමක් නිසා බැව් පෙන්වා දෙමින් උපදේශක සභාවේ ක්‍රියාකාරි සැළසුම් සකස් කිරීමේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර සැළසුම සමඟ අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටියේය.

ඉන් අනතුරුව කමිටු සැළසුම් ඉදිරිපත් කිරීම සිදු කරන ලදි. විමර්ශණ, අධ්‍යාපන, තරුණ සහ සන්නිවේදන කමිටු විසින් සිය සැළසුම් ලිඛිතව ඉදිරිපත් කළ අතර ජාත්‍යන්තර කමිටුව වෙනුවෙන් එම මණ්ඩල/කමිටු ලේකම් නීතිඥ කපිල කල්‍යාණ මහතා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ජාත්‍යන්තරය සමඟ කටයුතු කළහොත් අපේ හඬ ජාත්‍යන්තරයට ගෙන යා හැකි බව පෙන්වා දුන් අතර එම කමිටු සාමාජික සුනිල් චන්ද්‍ර කුමාර මහතා ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් අපේ වැඩ පිළිවෙල කුමක්දැයි පැහැදිලිව ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් අරමුදල් සපයා ගත හැකි බව ප්‍රකාශ කළේය.

මේ අවස්ථාවේ පූජ්‍ය අඟුලුගොල්ලේ ජිනානන්ද ස්වාමින් වහන්සේ විසින් ශක්තිමත්ව කටයුතු කිරීම පිණිස බෞද්ධ අරමුදලක් පිහිටුවා ගැනීම සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභාවේ සියල්ලෝම ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද ස්වාමීන් වහන්සේ කාල කළමනාකරණයේ වැදගත්කම පෙන්වා දෙමින් කමිටු සියල්ලේම සැළසුම සාරාංශයක් වශයෙන් එක් අයෙකු විසින් ඉදිරිපත් කිරීම තුළින් කාලය ඉතිරි කර ගත හැකිව තිබූ බවත් බෞද්ධයාගේ ආර්ථිකය ශක්තිමත් කිරීම පිණිස ගෙවතු වගාව දියුණු කිරීම මෙන්ම විසිරුණු සිංහල බෞද්ධයා එක්කර ගම ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයත් අඩු පහසුකම් ඇති විහාරස්ථාන මෙන්ම පිරිවෙන් පද්ධතියේ පරිහානියත් (ගිහි පැවිදි ශිෂ්‍යයන් අඩුකම) ත්‍රිපිටක ධර්මය පිරිවෙන් වල විධිමත්ව ඉගැන්විය යුතු බවත් පෙන්වා දුන්හ.

පූජ්‍ය මැදගොඩ අභයතිස්ස ස්වාමින් වහන්සේ එක් ඉලක්කයකට යොමු කර ගැනීමේ අපහසුව පෙන්වා දෙමින් පොදු ඉලක්කයක් කරා අපේ ගමන සිදුවිය යුතු බවත් උතුරු නැගෙනහිර භික්ෂූන් වහන්සේලාට හා ජාතික උරුමයන්ට, පුරා වස්තු වලට ඇති ගැටළු සම්බන්ධයෙන් විස්තර කරමින් 16 වන ව්‍යවස්ථා සංශෝධනය හා භාෂා ප්‍රශ්නය නිසා බෞද්ධයින් පත්ව ඇති අපහසුතාවයත් සිංහල බහුතරයක් සිටින පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් බෞද්ධයින් වෙනුවෙන් කථා නොකිරීම කණගාටුවට කරුණක් බවත් රටේ මර්මස්ථාන විදේශයට නතු කිරීම තුළින් සිදුවන ආර්ථික සහ ආරක්ෂාව පිළිබඳ තර්ජනත් පැහැදිලි කරන ලදි.

ජාතික උපදේශක සභාවේ ගරු සාමාජිකයින් වන නාලක ජයවීර මහතා, සුනිල් චන්ද්‍රකුමාර මහතා, සමන්ත ප්‍රියදර්ශන මහතා, සමන් කාරියකරවන මහතා සහ සෙනෙවිරත්න කීරවැල්ල යන මහත්වරුන්ද අදහස් දක්වන ලදි.

අනතුරුව සභාව ඇමතු පූජ්‍ය අඟුලුගොල්ලේ සිරි ජිනානන්ද ස්වාමින් වහන්සේ උතුරු නැගෙනහිර පරිපාලන භාෂාව ලෙස (අධිකරණ සහ කාර්යාල) සිංහල භාෂාව පැවතිය යුතු බවට වන යෝජනාවක් රජය වෙත ඉදිරිපත් කිරීමටත්, මෙය මන්ත්‍රීවරයකුගේ පුද්ගලික යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් යෝජනා කරන ලදුව මෙය සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදි.

මෙහි ඉදිරි රැස්වීම් වාරය 2024.03.08 වන සිකුරාදා දින උදේ 9.00 ට පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**ශ්‍යාම් නුවන් ගනේවත්ත**
**ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී**

## ජාතික උපදේශක සභාව
## 2024.01.14 දින රැස්වීම









## ජාතික උපදේශක සභාව - 2024.02.17 දින රැස්වීම









# නිවාසාන්තර ක්‍රීඩා උත්සවය - 2024



සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික ළමාරක්‍ෂක මණ්ඩලය මගින් පාලනය වන දිවයින පුරා පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථාන 17 ක දරුවන්ගේ සහභාගිත්වයෙන් 11 වෙනි වරටත් නිවාසාන්තර ක්‍රීඩා උළෙල ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්‍ෂක උපදේශක සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අනෝමා ගමගේ මැතිණිය, ප්‍රධාන අනුග්‍රාහිකා කුමාරි ටෙෆ්නින් මැතිණිය, පීටර් ටෙෆ්නින් මැතිතුමා, රොසන් කින්ඩර් සංවිධානයේ සභාපති ඩෙයිටර් කස්කේ මැතිතුමා සහ එම මැතිණිය ඇතුළු සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමාගේ මූලිකත්වයෙන් ගරු කෘත්‍යාධිකාරී මණ්ඩල නිලධාරීන් විධායක සභික මහත්ම මහත්මීන් ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් 2024 පෙබරවාරි මස 24 වෙනි දින කොළඹ 07 නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ පිහිටි ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයේදී අතිඋත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

මෙම ක්‍රීඩා උළෙලේදී දක්‍ෂතම ක්‍රීඩකයා ග්‍රැන්විල් වික්‍රමරත්න ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ යශෝදරන් රාජමානික්කම් වූ අතර දක්‍ෂතම ක්‍රීඩිකාව අපේක්‍ෂා විජිත බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නෙත්මි උදේශිකා දැරිය හිමි කරන ගන්නා ලදී.
හොඳම නිවාස කුටියට හිමි ජගත් සුමතිපාල අභියෝගතා කුසලානය ජයන්ති ළදරු සංවර්ධන මධ්‍යස්ථානය හිමිකර ගන්නා ලදී.
වැඩිම කුසලාන හිමි ආචාර්ය මිලිනා සුමතිපාල අභියෝගතා ශූරතා පලිහ හිමිකර ගන්නා ලද්දේ ග්‍රැන්විල් වික්‍රමරත්න ළමා සංවර්ධන මධ්‍යස්ථානයයි.
හොඳම ළමා සංවර්ධන මධ්‍යස්ථානයට හිමි සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති අභියෝගතා කුසලානය හිමිකර ගනු ලැබුවේ සිවිරාජ අඳ බිහිරි ළමා සංවර්ධන මධ්‍යස්ථානයයි.

# ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පවත්වන විශේෂ වැඩමුළුව....

## 2024 පෙබරවාරි 10 දින















රටේ ආර්ථිකය ඉතා පහල තත්ත්වයක පැවතියද අප ළමා සංවර්ධන මධ්‍යස්ථාන යහපත් මට්ටමකින් පවත්වාගෙන යාමට හැකියාව ලැබීම සතුටට කරුණක් වුවද, මෙම තත්ත්වය වඩාත් දියුණු කිරීම සඳහා නූතන අළෙවිකරණ සිද්ධාන්ත, නිවැරදි හා විනිවිදභාවයෙන් යුතුව අරමුදල් භාවිතය හා අරමුදල් සඳහා නෛතික වගකීම වගවීම හා ස්වේච්ඡා ආයතනවලට මුදල් ලබා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ, මෙන්ම දරුවන්ගේ යහපැවැත්ම පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ වැඩමුළුවක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන පාලක සභා නිලධාරීන් ඇතුළු සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් 2024.02.10 වැනි සෙනසුරාදා පෙ.ව. 9.30ට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ.

මෙම වැඩ මුළුව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු භාණ්ඩාගාරික වසන්ත ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර මේ සඳහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා, ගරු නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මහතා, ගරු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික භවතුන් සහ ළමාරක්ෂක මධ්‍යස්ථාන පාලක සභා නිලධාරීන්ද සහභාගි විය.

# ශාසන වීරදින සර්ව රාත්‍රික පිරිත් පිංකම
# සහ සංඝගත දක්ෂිණාව - 2023.12.18 සහ 19 දෙදින










## බලංගොඩ සඳගිරි අෂ්ඨඑල බෝධි රජමහා විහාරස්ථානයට කොන්ක්‍රීට් පාලමක් සාදා පූජා කිරීම





විහාරස්ථානයට පිවිසීමට මුලින් තිබූ ඒදඬු පාලම






නව පාලම සඳහා මුල්ගල් තැබීම



කොන්ක්‍රීට් පාලම මහා සංඝරත්නය උදෙසා පූජා කිරීම








බෞද්ධාලෝකය®

ප්‍රකාශනය
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන: 011-2 691695/ 2 688517

**ජාත්‍යන්තර ග්‍රන්ථ හඳුනාගැනීමේ සංකේතය**
**ISSN 2613-8743**
**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි අංකය**
**P 1567**
**තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය**
**DOP/NEWS/23/2024**